

වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
ANNUAL REPORT

2021

පොල් පර්යේෂණ ආයතනය
தென்னை ஆராய்ச்சி நிறுவகம்
Coconut Research Institute

පොල්, කිතුල් සහ තල් වගා ප්‍රවර්ධනය සහ ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා කර්මාන්ත අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

தென்னை, கித்துல் மற்றும் பனைச் செய்கை மேம்பாடு மற்றும் அவை சார்ந்த கைத்தொழில் பண்டங்கள் உற்பத்தி மற்றும் ஏற்றுமதி பல்வகைப்படுத்தல் இராஜாங்க அமைச்சு

STATE MINISTRY OF COCONUT, KITHUL AND PALMYRAH CULTIVATION PROMOTION AND RELATED INDUSTRIAL PRODUCT MANUFACTURING AND EXPORT DIVERSIFICATION



වැවිලි අමාත්‍යාංශය
பெருந்தோட்ட அமைச்சு
Ministry of Plantation





පටුන

- □ අපගේ දැක්ම මෙහෙවර සහ කාර්යභාරය 5
- □ ආයතනික ව්‍යුහය 6
- □ පොල් පර්යේෂණ ආයතනය 7
- □ සභාපතිතුමාගේ පණිවිඩය 9
- □ අධ්‍යක්ෂකතුමියගේ පණිවිඩය 11
- □ පර්යේෂණ නිර්දේශ 13
- □ ප්‍රතිපත්ති යෝජනා 17
- □ පර්යේෂණ හා සංවර්ධන ජයග්‍රහණ 21
  - පොල් ප්‍රභේද වැඩි දියුණු කිරීම 23
  - පොල් නිෂ්පාදන තාක්ෂණය 27
  - පොල් නිෂ්පාදනය කෙරෙහි දේශගුණික විපර්යාස වල බලපෑම් 38
  - වගා සංරක්ෂණය 41
  - පොල් සැකසුම් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම 47
  - සමාජ ආර්ථික පර්යේෂණ 55
- □ පර්යේෂණ සංවර්ධනයන් 59
- □ තාක්ෂණ හුවමාරු කටයුතු 67
- □ පාර්ශ්වකරුවන්ට ලබාදෙන සේවා තුළින් ජාතික සංවර්ධනයට ලබාදෙන දායකත්වය 73
- □ ජාතික සහයෝගිතා වැඩසටහන 83
- □ වතු කළමනාකරණ කටයුතු 87
- □ කාර්යමණ්ඩලය 117
  - පොල් පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය 119
  - බඳවාගැනීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම්, උසස්වීම් සහ ස්ථාන මාරු 135
- □ විගණන වාර්තාව 143
- □ කාර්යමණ්ඩල ජයග්‍රහණ 152
- □ අධ්‍යයන සහ වෘත්තීමය ක්‍රියාකාරකම් 155
- □ දේශීය සහ ජාත්‍යන්තර ප්‍රකාශන 163
- □ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය 173



අපගේ දැක්ම

පොල් සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ, තාක්ෂණ ජනනය කිරීම සහ තාක්ෂණ ප්‍රවර්ධනය කිරීමෙහිලා කලාපයේ ප්‍රමුඛයා බවට පත්වීම.

අපගේ මෙහෙවර

පොල් කර්මාන්තයේ තිරසාර දියුණුව සඳහා අවශ්‍ය වන තාක්ෂණ දැනුම පර්යේෂණ කටයුතු මගින් බිහිකිරීම

අපගේ කාර්යභාරය

- පොල් ගසේ වැඩීම, පොල් වගාවල අනෙකුත් භෝග වගාවන් සහ සත්ත්ව පාලන කටයුතු, පළිබෝධ සහ රෝග පාලනය කිරීම පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණයන්හි නිරතවීම.
- පොල් සැකසීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ අගය එක්කළ නිෂ්පාදන පිළිබඳව තවදුරටත් විද්‍යාත්මක පර්යේෂණයන්හි නිරතවීම.
- ආයතනයේ බීජ පොල් උයන් සහ පර්යේෂණ මධ්‍යස්ථාන අලුතින් ඇති කිරීම සහ පවත්වා ගෙන යාම.
- පොල් කර්මාන්තයේ උන්නතිය උදෙසා උපදේශක සහ ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීම.
- පොල් කර්මාන්තය තුළ ඇති සියලුම තාක්ෂණ කාර්යාවලීන් සඳහා තාක්ෂණික අංශ වලින් ලබාදිය යුතු මගපෙන්වීම සහ උපදේශකත්වය ලබාදීම.

ආයතනික ව්‍යුහය


සභාපති පොල් පර්යේෂණ මණ්ඩලය
අධ්‍යක්ෂ පොල් පර්යේෂණ ආයතනය
අතිරේක අධ්‍යක්ෂ පොල් පර්යේෂණ ආයතනය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වතු)
අභ්‍යන්තර විගණක
සංස්ථාපන ඒකකය
ගිණුම් ඒකකය
වතු කළමනාකරණ අංශය
අභ්‍යන්තර විගණන ඒකකය
ඉංජිනේරු ඒකකය
ශෂ්‍ය විද්‍යා අංශය
කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි වාණිජ කළමනාකරණ අංශය
පොල් සැකසුම් අංශය
වගා සංරක්ෂණ අංශය
ප්‍රවේණි හා ශාක අභිජනන අංශය
ශාක කායික විද්‍යා අංශය
පාංශු හා ශාක පෝෂණ අංශය
පටක රෝපණ අංශය
තාක්ෂණ හුවමාරු අංශය
පුස්තකාලය

පොල්, කිතුල් සහ තල් වගා ප්‍රවර්ධනය සහ ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා කර්මාන්ත අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

පොල් පර්යේෂණ ආයතනය

වාර්ෂික වාර්තාව- **2021**

1928 අංක 24 දරණ පොල් පර්යේෂණ ව්‍යවස්ථාවට අනුව 1929 දී පොල් පර්යේෂණ ආයතනය ආරම්භ කර ඇත්තේ පොල් පර්යේෂණ යෝජනා ක්‍රමය ලෙසය. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන මධ්‍යස්ථානය ලුණුවිල බණ්ඩිරිප්පුව වත්තේ පිහිටවනු ලැබූ අතර, එය ප්‍රවේණි රසායන විද්‍යා හා පාංශු රසායන විද්‍යා නම්වූ තාක්ෂණ අංශ තුනකින් සමන්විත විය.1950 දී නීතිගත කරනු ලැබූ අංක 37 දරණ පොල් පර්යේෂණ පනතින් පසු මෙය ලංකා පොල් පර්යේෂණ ආයතනය ලෙස යලි නම් කරනු ලැබිණි. 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත පැනවීමත් සමග 1972 දී පොල් පර්යේෂණ මණ්ඩලය පිහිටවනු ලදී. මෙහි කාර්ය භාරය වනුයේ පොල් පර්යේෂණ ආයතනයේ පාලන මණ්ඩලය ලෙස කටයුතු පවත්වාගෙන යාමයි.

පොල් පර්යේෂණ මණ්ඩලය (පො.ප.ම)

පොල් පර්යේෂණ මණ්ඩලය එහි පාලන මණ්ඩලය වන අතර ආයතනයේ පාලන කටයුතු හා ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ එම මණ්ඩලය මගිනි. පොල් සංවර්ධන පනතේ කොන්දේසි වලට අනුකූලව පොල් පර්යේෂණ මණ්ඩලය, අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වේ.මින් එක් සාමාජිකයෙක් ආයතනයේ සභාපති ලෙස පත් කරනු ලැබේ. ආයතනය පාලනය කරනු ලබන්නේ පොල් පර්යේෂණ මණ්ඩලය මගිනි. සාමාජිකයින් වසර 03ක් සඳහා පත් කරනු ලබන අතර, ඔවුනු නැවත වරක් පත්කිරීම සඳහා ද සුදුසුකම් ලබති. පසුගිය වසර සඳහා රැස්වීම් 09 ක් පවත්වන ලදී.

මණ්ඩල සාමාජිකයින්	**පැමිණීමේ වාර්තාව**	
ජයන්ත වික්‍රමසිංහ මහතා, සභාපති / පො.ප.ම	(ජන - මැයි 2021)	- 5/5
වෛද්‍ය සාරංග අලහප්පෙරුම, සභාපති / පො.ප.ම	(අගෝ - දෙසැ 2021)	- 4/4
ඒ.වී.කේ.වීම්. හේරත් මිය, සභාපති/පො.ප.ම		- 1/2
කීර්ති ශ්‍රී වීරසිංහ මයා, සභාපති/පො.ස.අ		- 2/2
සුරේකා අත්තනායක මිය / අමාත්‍යාංශ නියෝජිත	(ජන - මැයි 2021)	- 5/5
ඩී.එස්. විජේසේකර මිය / අමාත්‍යාංශ නියෝජිතවරිය	(අගෝ - සැප් 2021)	- 2/2
කේ. කරුණාසේන මිය / අමාත්‍යාංශ නියෝජිතවරිය	(නොවැ - දෙසැ 2021)	- 2/2
ආචාර්ය ඩබ්.එම්.ඩබ්.වීරකෝන්, අධ්‍යක්ෂ ජනරාල් /කෘ.දෙ	(ජන - මැයි 2021)	- 2/5
ආචාර්ය එස්.එච්.එස්.ඒ. ද සිල්වා, අධ්‍යක්ෂ ජනරාල් /කෘ.දෙ	(නොවැ - දෙසැ 2021)	- 2/2
ආචාර්ය එස්.එෆ්.එන්.සිල්වා, නියෝජිත /පො.ව.ස		- 9/9
ආර්.ඒ.චල්.උදය කුමාර මහතා / භාණ්ඩාගාර නියෝජිත		- 9/9
බන්ධුල එගොඩගේ මහතා		- 9/9
ප්‍රභාත් විමල් කුමාර මහතා / අධ්‍යක්ෂක ලේකම් / කෘ.ප.ප්‍ර.ස		- 6/9
චිත්‍රාල් ජයවර්ණ මහතා		- 9/9
ආචාර්ය සනාතනී රණසිංහ මිය, අධ්‍යක්ෂ /පො. ප. ආ		- 9/9

පො.ප.ම ඃ පොල් පර්යේෂණ මණ්ඩලය
කෘ.දෙ ඃ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
කෘ.ප.ප්‍ර.ස ඃ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
පො.ව.ම ඃ පොල් වගාකිරීමේ මණ්ඩලය
පො. ප. ආ ඃ පොල් පර්යේෂණ ආයතනය
පො.ව.ස ඃ පොල් වගාකරුවන්ගේ සංගමය
පො.ස.අ ඃ පොල් සංවර්ධන අධිකාරිය

විගණන හා කළමනාකරණ කමිටුව

ආයතනයේ විගණන හා කළමනාකරණ කටයුතු පිළිබඳ සාකච්ඡා කර ගැනීම සඳහා වසර තුළ රැස්වීම් වාර 04ක් පවත්වන ලදී.

විගණන කමිටුවේ සාමාජිකයින්

	නම	පැමිණීමේ වාර්තාව
කමිටු සභාපති හා භාණ්ඩාගාර නියෝජිත	ආර්.ඒ. චිල්. උදය කුමාර මයා	4/4
අමාත්‍යාංශ නියෝජිත	සුරේකා එන්. අත්තනායක මිය	2/4 (ජන - මැයි 2021)
	බුද්ධි ටී. කරුණාසේන මිය	2/4 (නොවැ - දෙසැ 2021)
නිරීක්ෂක වැවිලි අමාත්‍යාංශය	ඒ. පොඩිරාලහාමි මයා	2/4
මණ්ඩල සාමාජික	ආචාර්ය එස්.එෆ්.එන්. සිල්වා	4/4
නිරීක්ෂක විගණක පාර්තමේන්තුව	ආර්.එම්.එම්.එස්. පෙරේරා මිය	4/4
අධ්‍යක්ෂ/පො.ප.ආ	ආචාර්ය සනාතනී රණසිංහ මිය	4/4
අභ්‍යන්තර විගණක	පී.ඩබ්. ඒ. ප්‍රනාන්දු මයා	4/4
කැඳවුම්කරු , වි.ක.ක / පො.ප.ආ අතිරේක අධ්‍යක්ෂ/පො.ප.ආ	ආචාර්ය ලලිත් පෙරේරා	4/4

වි.දෙ : විගණකාධිපති දෙපාර්තමේන්තුව



සභාපතිතුමාගේ
පණිවිඩය

පසුගිය වසර කිහිපය තුළ පොල් නිෂ්පාදනය, සැකසුම් සහ පර්යේෂණ හා සංවර්ධනය යන ක්ෂේත්‍රවල කැපී පෙනෙන ජයග්‍රහණ සනිටුහන් කරමින් පොල් කර්මාන්තය ඉහළ මට්ටමකට පැමිණ ඇත. 2021 කොවිඩ් වසංගත තත්ත්වය යටතේ වුවද, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මැදිහත්වීම සහ පොල් පර්යේෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය යන ආයතන වල මඟ පෙන්වීමෙන් පොල් කර්මාන්තය ඉතා හොඳින් ක්‍රියාත්මක විය. එම වසර තුළ මෙතෙක් වාර්තා වූ ඉහළම වාර්ෂික ජාතික පොල් අස්වැන්න ලෙස ගෙඩි මිලියන 3,382 ක් වාර්තා කරමින් රුපියල් බිලියන 166 (ඇමරිකානු ඩොලර් මිලියන 834) විදේශ විනිමය ප්‍රමාණයක් උපයා දීමට හැකි විය. එසේම දළ දේශීය නිෂ්පාදනයෙන් 0.7% කට දායක වෙමින් ගෘහස්ථ පොල් ඉල්ලුමෙන් සහ පොල් තෙල් අවශ්‍යතාවයෙන් කොටසක් ද සපුරාලීමට සමත් විය. භෝග පුරෝකථන දත්ත සැපයීම, වගාවන් සඳහා අවශ්‍ය තාක්ෂණික නිර්දේශ ලබා දීම, පොල් ඉඩම් කළමනාකරණය සහ කර්මාන්ත කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති නිර්දේශ ලබා දීම මඟින් එම ජයග්‍රහණ සඳහා පොල් පර්යේෂණ ආයතනය දැක්වූ දායකත්වය සිහිපත් කරන්නේ ඉමහත් ආඩම්බරයෙනි.

පොල් පර්යේෂණ ආයතනය විසින් පොල් වගාව වැඩි දියුණු කිරීම, භෝග නිෂ්පාදනය වැඩි කිරීම, පොල් ගස ආරක්ෂා කිරීම මඟින් භෝග හානි අවම කිරීම, ගෝලීය පොල් සැකසුම් කර්මාන්තය හා තරඟ වැදිය හැකි නිෂ්පාදන සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම, නීති ප්‍රතිපත්ති මඟින් පොල් කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා, විවිධ මානයන් හා තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ පර්යේෂණ මෙහෙයවන ලදී. මෙම වසර තුලදී පොල් පර්යේෂණ ආයතනය විසින් අකාබනික පොහොර අවශ්‍යතාවයට අතිරේක නිර්දේශයක් ලෙස කාබනික පොහොර භාවිතා කිරීම සහ පාංශු ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා පෙව අඟුරු භාවිතා කිරීම ලෙස නව නිර්දේශ දෙකක් හඳුන්වා දෙන ලදී.

පොල් පර්යේෂණ ආයතනය විසින් වැඩි දියුණු කළ තාක්ෂණයන් ව්‍යාප්ත කිරීමේදී නව මෙවලම් සහ ප්‍රවේශයන් මඟින් පොල් කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙත තාක්ෂණය හුවමාරු කිරීමේ වැදගත්කම හඳුනා ගන්නා ලදී. එම අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින් පොල් පර්යේෂණ ආයතනය විසින් එහි වෙබ් අඩවිය යාවත්කාලීන කර වැඩි දියුණු කිරීම, 1928 ක්ෂණික ඇමතුම් දුරකථන අංකය හඳුන්වා දීම, 070 400 1928 WhatsApp අංකයක් හඳුන්වා දීම සහ වෙනත් විද්‍යුත් මාධ්‍ය මෙවලම් ද භාවිතා කරන ලදී. පොල් වගාවේ විවිධ ක්‍රියාකාරකම් පිලිබඳ වූ වීඩියෝ ඇතුළත් QR කේත සහිත කප්රුක අත්පොත මුද්‍රණය කර පාර්ශ්වකරුවන් වෙත බෙදාහරින ලදී. එසේම ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා පොල් සඳහා ඇති පිළිගැනීම ඉහළ නැංවීමේ අරමුණින් පොල් පර්යේෂණ ආයතනය විසින් නව ලංකා පොල් ලාංඡනය ද හඳුන්වා දෙන ලදී. දෙමුහුම් පොල් පැළ වල ඉල්ලුම සපුරාලීම සඳහා ඉහළ අස්වැන්නක් ලබා දෙන දෙමුහුම් පොල් පැළ නිෂ්පාදනය හදිසි අවශ්‍යතාවයක් වූ බැවින් 2021 වසරේදී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සමඟ එක්ව නව දෙමුහුම් බීජ උයනක් ස්ථාපනය කරන ලදී. තවද දෙමුහුම් පොල් බීජ නිෂ්පාදනය කිරීම සඳහා මව් ගස් 1000 ක් තෝරා ගන්නා ලද අතර ඉන් අත් පරාගනය කළ බීජ පොල් නිෂ්පාදනය කිරීම සඳහා කුරුණෑගල වැවිලි සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

පොල් පර්යේෂණ ආයතනය සිය පර්යේෂණ වැඩසටහන ඵලදායී ලෙස ඉදිරියට ගෙන යාම සඳහා විශ්ව විද්‍යාල, ජාතික ඉංජිනේරු ආයතන සහ දේශීය හා විදේශීය අරමුදල් සපයන ආයතන ඇතුළු දේශීය හා විදේශීය වෙනත් ආයතන සමඟ පර්යේෂණ සහයෝගීතාව තව දුරටත් පවත්වාගෙන යන ලදී. පර්යේෂණ තුළින් ජනනය වන නව දැනුම අවසන් පරිශීලකයන් වෙත සම්ප්‍රේෂණය කළ යුතු අතර පොල් පර්යේෂණ ආයතනය විසින් සොයා ගන්නා ලද දැනුම පාර්ශ්වකරුවන් වෙත සම්ප්‍රේෂණය කිරීමට සහ පොල් කර්මාන්තය ප්‍රධාන තාක්ෂණ හුවමාරු සන්නිවේදකයා වන පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත නව දැනුම සහ සොයාගැනීම් සම්ප්‍රේෂණය කිරීමේ අභිලාෂයෙන් හා ක්ෂේත්‍රයේ පවතින පර්යේෂණ කළ යුතු ගැටළු හඳුනා ගැනීමේ අභිලාෂයෙන් පොල් පර්යේෂණ ආයතනය හා පොල් වගා කිරීමේ මණ්ඩලය අතර පවත්වනු ලබන පර්යේෂණ ව්‍යාපෘති සංවාද සිදු කරන ලදී. පොල් පර්යේෂණ ආයතනය සතු පොල් පිළිබඳව ඇති හසල දැනුම ජාත්‍යන්තරය වශයෙන් පිළිගනිමින් ජාත්‍යන්තර පොල් ප්‍රජාව විසින් පොල් සංවර්ධන නිලධාරීන් සඳහා තුන්වන ජාත්‍යන්තර සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීමට නොකඩවා තෙවනවරටත් පොල් පර්යේෂණ ආයතනය තෝරා ගන්නා ලදී. කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා භෞතික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් මාර්ගගත ක්‍රමයට මෙම වැඩසටහන සාර්ථකව පවත්වන ලදී. මෙලෙස පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින්, ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ඇතුළු බොහෝ වැඩසටහන් සඳහාද, ප්‍රතිපත්ති සම්පාදකයන් ලෙසද සම්පත් දායකත්වය ලබා දෙන ලදී. දේශීය හා ගෝලීය පොල් කර්මාන්තය සහ විද්‍යාවේ දියුණුව සඳහා පොල් පර්යේෂණ ආයතනය සිය දැනුම් පද්ධතිය පුළුල් කිරීමේ නිරතව සිටින බව මා මෙහිදී තවදුරටත් සිහිපත් කරමි.

වෛද්‍ය සාරංග අලහප්පෙරුම

සභාපති

පොල් පර්යේෂණ මණ්ඩලය



අධ්‍යක්ෂකතුමියගේ
පණිවිඩය

වර්ෂ 2021 යනු ශ්‍රී ලංකා පොල් ක්ෂේත්‍රය තුළ, වාර්ෂික භෝග අස්වැන්න හා අපනයන ආදායම අතින් වැදගත් ජයග්‍රහණ වාර්තා වූ වසරක් විය. එනම් මෙරට ඉතිහාසයේ මෙතෙක් ලද වැඩිම වාර්ෂික ජාතික පොල් අස්වැන්න වන ගෙඩි මිලියන 3,383 හා පොල් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන අපනයනයෙන් මෙතෙක් ලද වැඩිම ආදායම වන ඇමරිකානු ඩොලර් මිලියන 834 ක ආදායම මෙම වසර තුළ උපයන ලදී. පර්යේෂණ නිර්දේශ, සංවර්ධන ක්‍රියාකාරකම් හා පොල් පර්යේෂණ ආයතනය මගින් සිය පාර්ශවකරුවන් උදෙසා ලබා දෙන ලද සේවාවන් යනාදිය මෙම සාර්ථකත්වය හා සංවර්ධනය උදෙසා වටිනා දායකත්වයක් දැක්වීය.

භෝග සඳහා කාබනික පොහොර පමණක් යෙදිය යුතුය යන රජය හඳුන්වා දුන් නව ප්‍රතිපත්තිය සමඟ පොල් සඳහාද විවිධ කාබනික ද්‍රව්‍ය ඇතුළත් පොහොර පැකේජයක් නිර්දේශ කරන ලදී. එමෙන්ම ජීව අඟුරු භාවිතය පිළිබඳ අන්තර් නිර්දේශය හඳුන්වාදීම මගින්ද පොල් වගා ආශ්‍රිත පස්වල පාංශු ගුණාත්මය ඉහළ දැමීමට කටයුතු කරන ලදී. උණුසුම් පාරිසරික තත්ත්වයන්ටරු නියඟයට, වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයට මෙන්ම මයිටා හානිය යනාදියට හොඳින් ඔරොත්තු දෙන පොල් වගා දර්ශ තෝරා බිහි කිරීම, පටක රෝපණ තාක්ෂණය වැඩි දියුණු කිරීම, පොල් වගා සඳහා ජීව අඟුරු හා නගර සභා ඝන අපද්‍රව්‍ය යෙදීම, නව වසුන් ද්‍රව්‍ය හඳුනා ගැනීම, අගය එකතු කළ පොල් නිෂ්පාදන සඳහා තාක්ෂණය බිහි කිරීම හා වැඩි දියුණු කිරීම, කොහු කර්මාන්ත අංශය සඳහා යන්ත්‍රෝපකරණ වැඩි දියුණු කිරීම සහ පොල් තෙල් හා මීරා ආශ්‍රිත නිෂ්පාදන වල සෞඛ්‍යමය වාසි පිළිබඳ ගුණාංග අධ්‍යයනය කිරීම යන පර්යේෂණ මෙම වසර තුළද අඛණ්ඩව සිදු කරන ලදී. පොල් පර්යේෂණ ආයතනයෙහි ජාන සම්පත් මධ්‍යස්ථාන 03 ක් සාර්ථක ලෙස නඩත්තු කරන ලද අතර, පොල් නැවත වගා කිරීමේ ජාතික වැඩසටහන සඳහා ප්‍රවේණිකව උසස් පොල් බීජ මිලියන 1.3 ක් නිපදවන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ ජාන සම්පත් මධ්‍යස්ථාන වල පවත්වාගෙන යන දෙමුහුම් බීජ නිපදවීමේ අත් පරාගන වැඩසටහන සඳහා මෙම වසරේදී මව් ගස් 1000 ක් අලුතින් ඇතුළත් කරන ලද අතර, දෙමුහුම් බීජ නිපදවීමට පෞද්ගලික අංශය හා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සමඟ හවුල් ව්‍යාපෘති අරඹන ලදී. 2021 වසරෙහි සත්‍ය පොල් ඵලදාව ගෙඩි මිලියන 3383 ක් වූ අතර, එය එම වර්ෂය සඳහා අප ආයතනය විසින් පුරෝකථනය කළ ගෙඩි මිලියන 3353 ට ඉතාමත් ආසන්න අගයක් විය. එමෙන්ම 2022 වසරේ මුල් මාස අට සඳහා ගෙඩි මිලියන 2337 ක අගයක් පුරෝකථනය කෙරිනි.

තාක්ෂණ හුවමාරු කටයුතු ලෙස ආයතනය අමතා නොමිලේ තාක්ෂණ උපදෙස් හා තොරතුරු ලබා ගැනීම සඳහා 1928 නව ක්ෂණික, ඇමතුම් සේවය හා 070 400 1928 වට්ස් ඇප් අංකය හඳුන්වා දීම, "ප්‍රශස්ත ව්‍යාපාර පහසුකම" මගින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් පිළිබඳ පුහුණුව සහ අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබාදීම, පොල් පර්යේෂණ ආයතනය හා පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් සංවර්ධන නිලධාරීන් අතර පර්යේෂණ ව්‍යාප්ති සංවාද පැවැත්වීම, පොල් වගා කිරීම හා අගය එකතු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව මාර්ගස්ථ වැඩසටහනක් ලෙස පැවැත්වීම, පොල් පර්යේෂණ ආයතනය ජාත්‍යන්තර පොල් ප්‍රජාව සමඟ ඒකාබද්ධව "පොල් සංවර්ධන නිලධාරීන් සඳහා පවත්වන ජාත්‍යන්තර සහතික පත්‍ර පාඨමාලාව" තුන්වන වරට පැවැත්වීම හා එයට රටවල් 19 කින්, 38 දෙනෙකු මාර්ගස්ථ ක්‍රමයට සහභාගිවීම, ගුවන් විදුලි වැඩසටහන් මාලාවක් පැවැත්වීම සහ තාක්ෂණ උද්‍යානයේ කටයුතු සාර්ථකව පවත්වා ගෙන යාම සිදුකෙරිනි.

ඉහත පර්යේෂණ හා සංවර්ධන වැඩ සටහන් ආශ්‍රයෙන් මේ වසරේදී විද්‍යා උපුටා දැක්වීම් දර්ශක සඟරාවන්හි (SCI) පර්යේෂණ පත්‍රිකා 19 ක්ද, ජාත්‍යන්තර සඟරාවන්හි පර්යේෂණ පත්‍රිකා 11 ක්ද, දේශීය සඟරාවන්හි පර්යේෂණ පත්‍රිකා 03 ක්ද, ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා පර්යේෂණ පත්‍රිකා 25 ක්ද, ග්‍රන්ථ පරිච්ඡේද 06 ක්ද, ප්‍රතිපත්ති ලේඛන 03 ක්ද, වෙනත් ලිපි 03 ක්ද ප්‍රකාශයට පත් කරන ලදී.

මීට අමතරව, ලෝක පොල් දිනය සමරනු වස් සැප්තැම්බර් 02 වැනි දින පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ සමරු මුද්දර 10 ක් හා මුල් දින කවර 02 ක් නිකුත් කිරීම සිදු කරන ලදී.

පොල් නිෂ්පාදන හා එහි ආදේශක ආනයනය හා අපනයනය සම්බන්ධයෙන් මෙන්ම, පොල් තෙල් හා පාම් තෙල් ආශ්‍රිත විශේෂ වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ බදු වෙනස්කම් සම්බන්ධ ප්‍රතිපත්ති නිර්දේශ කිරීම් සිදු කර, ඒවා ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත භාර දීම සිදු කරන ලදී. පොල් ගෙඩි හා බීජ පැළ නිෂ්පාදනයේ පිරිවැය ඇස්තමේන්තුගත කිරීම සඳහා වූ සූත්‍රය තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

මෙම වසරේදී අප ආයතනයේ වතු ආශ්‍රිතව පොල් ගෙඩි මිලියන 5.13 ක ප්‍රමාණයක් නිපදවන ලද අතර, එය වසර 2020 හි නිෂ්පාදනයට වඩා 31% ක වැඩි වීමකි. සියලු වතු සලකමින් සාමාන්‍ය නිෂ්පාදන වියදම ගත් විට, එය ගෙඩියකට රු. 27.80 ක් විය. ශුද්ධ විකුණුම් සාමාන්‍යය වූයේ ගෙඩියකට රු. 55.69 කි.

අප ආයතනයෙන් පාර්ශවකරුවන්ට ලබාදෙන සේවාවන් ලෙස, ඇසේරියා මයිටාවන් පාලනය සඳහා විලෝපික මයිටාවන් ලබා දීම, පොල් දළඹු හානිය පාලනය සඳහා පරපෝෂිතයින් ලබා දීම, රතු කුරුමිණි ආකර්ෂණ පෙරමෝනය නිපදවා වගාකරුවන් වෙත ලබා දීම මෙන්ම පොහොර නිර්දේශයන් හා පොල් ලෙලි ආශ්‍රිත අපනයන නිෂ්පාදන සඳහා විශ්ලේෂණ සේවාවන් ලබා දීමද සිදු කරන ලදී.

වසර 2021 හි ලද ඉහත සියලු ජයග්‍රහණ පොල් පර්යේෂණ ආයතනයට හිමි වුයේ ආයතනයේ කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීමත්, අන්නෝන්‍ය සහයෝගයත්, වගකීම් දරා ගනිමින් කටයුතු කිරීමත් නිසා බව සඳහන් කරන්නේ ඉමහත් සතුටිනි.

ගරු අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමා, වැවිලි අමාත්‍යාංශයේ හා රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරුන් ඇතුළු නිලධාරීන්ට මෙන්ම, සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අප වෙත ලබා දුන් මග පෙන්වීම හා සහයෝගය වෙනුවෙන් ඔවුන් වෙත මාගේ කෘතඥතාවය පුද කරනුයේ හදපිරි සතුටිනි.

පොල් පර්යේෂණ ආයතනයේ සියලු කර්තව්‍යවයන් සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යයි ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය සනාතනී රණසිංහ

අධ්‍යක්ෂ

පොල් පර්යේෂණ ආයතනය

පර්යේෂණ නිර්දේශ

නව කාබනික පොහොර පැකේජයක් නිර්දේශ කිරීම.

පාංශු හා ශාක පෝෂණ අංශය

කාබනික පොහොර පමණක් යෙදීම සඳහා වූ රජයේ ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමග මෙතෙක් හඳුන්වා දී තිබූ පොහොර නිර්දේශ (එනම්; කාබනික පමණක්, කාබනික හා අකාබනික මිශ්‍රණ, සහ අකාබනික පොහොර) වලට අමතරව විවිධ කාබනික ද්‍රව්‍ය ඇතුළත් කරන ලද පොහොර පැකේජයක් නිර්දේශ කිරීම.

පොල් වගාව සඳහා අන්තර් නිර්දේශයක් ලෙස ජීවඅඟුරු යෙදීම නිර්දේශ කරන ලදී.

ශෂ්‍ය විද්‍යා අංශය

පසෙහි ගුණාත්මය වැඩිදියුණු කරමින් වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීමට පොල් වගාව සඳහා අන්තර් නිර්දේශයක් ලෙස ජීවඅඟුරු යෙදීම නිර්දේශ කරන ලදි.

ප්‍රතිපත්ති යෝජනා

දේශීය හා විදේශීය වෙළඳාමට උරදීම සඳහා ප්‍රතිපත්ති යෝජනා

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

අස්වනු පුරෝකථනයට අනුව 2021 වසරේ ලැබුණු පොල් අස්වැන්න පොල් ගෙඩි මිලියන 3,300 ක් පමණ වන අතර, මෙය මෑත ඉතිහාසයේ වාර්තා වූ වැඩිම පොල් අස්වැන්න වේ. මෙම වසරේ කොවිඩ් 19 රෝගී තත්ත්වය පැවතුණද, වැවිලි අමාත්‍යාංශය, පොල් පර්යේෂණ ආයතනය හා පොල් සංවර්ධන අධිකාරියේ මැදිහත් වීම මත පොල් සැකසුම් කර්මාන්තශාලා හොඳින් ක්‍රියාත්මක වූ අතර, එමගින් ආර්ථිකයට සැළකිය යුතු නිෂ්පාදනයක් දේශීය හා විදේශීය වෙළඳපොළ වෙත දායක කරන ලදී. මෙම ක්‍රියාදාමය නිසා 2021 වසරේ ලැබුණු ඉහළ පොල් අස්වැන්න කර්මාන්තය වෙත යොදා ගැනීමට හැකි විය. කෙසේ වෙතත් ලෝකය පුරා පැවති කොවිඩ් 19 තත්ත්වය නිසා පොල් අපනයන ක්ෂේත්‍රයට ගැටළු කිහිපයක් පැවති අතර, ප්‍රධාන වශයෙන් ඉහළ යන වරාය ගාස්තු, ප්‍රමාණවත් නැව් පහසුකම් නොමැති වීම, හිස් බහාලුම් නොමැතිකම හා ඇසුරුම් ද්‍රව්‍ය වල හිඟකම එයින් සමහරක් වේ.

මෙසේ පොල් කර්මාන්තය හිතකර ආකාරයෙන් ක්‍රියාත්මක වූවද, තවමත් රටේ නිෂ්පාදනය කරනු ලබන පොල් ප්‍රමාණය රටේ ආහාරයට ගන්නා තෙල් ප්‍රමාණය සැපයීමට ප්‍රමාණවත් නොවේ. පොල් පර්යේෂණ ආයතනයේ ගණනය කිරීම් වලට අනුව ආහාරයට ගන්නා තෙල් වල අවශ්‍යතාවය හා කර්මාන්තයේ තෙල් අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 180,000 ත් 210,000 ත් අතර වේ. වාර්ෂික නිෂ්පාදන සංඛ්‍යාලේඛන වලට අනුව, සාමාන්‍ය වාර්ෂික පොල්තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 35,000 ත් 45,000 ත් අතර වන අතර දේශීය පාම්තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 15,000 ත් 20,000 ත් අතර වේ. එම නිසා සාමාන්‍ය ක්‍රියාවලිය වන්නේ නිෂ්පාදනයට අමතරව අවශ්‍ය වන තෙල් ප්‍රමාණය පොල් තෙල්, පාම් තෙල්, සන්ෆලවර් තෙල් හා අනෙකුත් තෙල් ලෙස ආනයනය සිදු කිරීමයි. එහෙත් 2021 අප්‍රේල් 07 දින විශේෂ භාණ්ඩ බද්ද සංශෝධනය සිදු කරන ලදී එම සංශෝධනයට අනුව පිරිසිදු නොකළ පාම්තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය තහනම් කරන ලදී. (HS අංක 1511-10-00, 1511-90-00, 1511-90-20). තවද පිරිපහදු කළ පාම්තෙල් හා ආශ්‍රිත නිෂ්පාදන ආනයනය බලපත්‍ර මත ආනයනය සිදු කළ යුතු බවට පත් කරන ලදී. (HS අංක 1511-90-00, 1511-90-10, 30, 90). මෙම සීමාවන් නිසා රට තුළට තෙල් ආනයනය සීමා විය. මෙය හේතුකොටගෙන තෙල් සඳහා පොල්තෙල් කර්මාන්තයෙන් හා අනෙකුත් පොල් සැකසුම් කර්මාන්ත වලින් ඇති වන ඉල්ලුම විශාල වශයෙන් වැඩි වූ අතර, එමගින් පොල් තෙල් මිලද ඉහළ යන ලදී. මෙයට අමතරව අන්තර්ජාතික වෙළඳපොළෙහි පොල්තෙල් මිල ශ්‍රී ලංකාවෙන් ලැබෙන ඉල්ලුම නිසා ඉතා ඉහළ අගයකින් ඉහළ යන ලදී. එම නිසා මෙම තත්ත්වය කළමනාකරණය කර ගැනීමට හා පොල් සැකසුම් කර්මාන්තයට සිදු වන හානිය අවම කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රතිපත්ති නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

නිර්දේශ 01

පොල්තෙල් වල විශේෂ වෙළඳ බද්ද රුපියල් 50 කින් හා අනෙකුත් බාද්‍ය තෙල් වල බද්ද රුපියල් 100 කින් අඩු කිරීමට යෝජනා කරන ලදී. මෙමගින් ආහාරයට ගන්නා තෙල් වල මිල රුපියල් 500.00 සිට 550.00 අතර මිලක පවත්වාගෙන යාමට අදහස් කෙරේ. ආනයනික පොල්තෙල් මිල ඉතා ඉහළ අගයකින් වැඩි වී ඇති නිසා පොල්තෙල් වෙනුවට අනෙකුත් බාද්‍ය තෙල් වර්ග ආනයනය උනන්දු කිරීම තුළින් විදේශ විනිමය ඉතිරි කරගැනීමට නිර්දේශ කෙරේ.

නිර්දේශ 02

පොල් සංවර්ධන අධිකාරිය මගින් පවත්වනු ලබන පොල් වෙන්දේසිය තාවකාලිකව නතර කිරීමට යෝජනා කරන ලදී. එමගින් පොල් මිල අනවශ්‍ය ලෙස මවාපෑම නතර කිරීම සිදු වේ.

නිර්දේශ 03

වරාය ගාස්තු අය කිරීම විශාල වශයෙන් ඉහළ ගොස් ඇති නිසා ඒ සඳහා සහන ලබා දීමට යෝජනා කෙරේ.

නිර්දේශ 04

විශාල වශයෙන් අපනයනය සඳහා සුදානම් කළ බහාලුම් එක්රැස් වී තිබෙන නිසා ඒවා අපනයනට අවශ්‍ය පහසුකම් හැකි ඉක්මනින් සලසා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

නිර්දේශ 05

ඇසුරුම් ද්‍රව්‍ය සඳහා පනවා ඇති ආනයන බදු ලිහිල් කිරීම.

පර්යේෂණ හා සංවර්ධන ජයග්‍රහණ



පොල් ප්‍රභේද වැඩි දියුණු කිරීම

කායික විද්‍යාත්මක හා ජාන ප්‍රකාශන අධ්‍යනයක් මගින් නියඟයට ඔරොත්තු දෙන පොල් ප්‍රභේද හා ප්‍රවේණි දර්ශ හඳුනා ගැනීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

පොල් වගාවන්හි වර්ධනය අඩාල කිරීමටත්, කායික විද්‍යාත්මක ක්‍රියාවලින් දුර්වල කිරීමටත්, ඵලදාව අඩු කිරීමටත් හේතුවන ප්‍රධාන අහිතකර තත්ත්වයක් ලෙස නියඟය හැඳින්විය හැක. තවද, කාලගුණික විපර්යාස හේතුවෙන් විශේෂයෙන්ම පොල් වගාකරන නිවර්ථන කලාපීය රටවල් වල නියඟ තත්ත්වයන් ඇති වීමේ වාර ගණන වැඩිවනු ඇතැයිද අපේක්ෂා කෙරේ. එම නිසා නියඟයට ඔරොත්තු දීමේ වගා දර්ශ ඇති කිරීම සඳහා කරනු ලබන අභිජනන පර්යේෂණ වලට ඉහළ ප්‍රමුඛතාවක් ලැබී ඇත.

ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය 1980 සිට නියඟයට ඔරොත්තු දෙන වගාදර්ශ නිපදවීම සඳහා පර්යේෂණ සිදුකරනු ලබන අතර නියඟයට ඔරොත්තු දෙන මව් ගස් සංචිතයක්, අඹකැලේ හුදකලා බීජ පොල් උයනෙන් හඳුනා ගෙන ඇත. එම ශාක " අඹකැලේ විශේෂ" ලෙස නම්කර ඇත.

තවදුරටත් ශාක කායික විද්‍යාත්මක හා ජාන ප්‍රකාශන අධ්‍යනයන් තුළින් නියඟයට ඔරොත්තු දෙන ජාන පදනම හඳුනාගැනීම ඉතා වැදගත් වනු ඇත.එම නිසා 2021 වර්ෂයේදී, කායික විද්‍යාත්මක හා ජාන ප්‍රකාශන අධ්‍යනයක් තුළින් ශ්‍රී ලංකාවේ පොල්වර්ග ගුණාංගීකරණය කිරීමේ නව පර්යේෂණයක් ආරම්භ කරන ලදී. මෙම පර්යේෂණය පොල් අභිජනනය සඳහා ශ්‍රී ලංකාව තුළ ජාන ප්‍රකාශන භාවිතා කිරීමේ පළමු අවස්ථාව සනිටුහන් කරයි. මීට අමතරව, අඹකැලේ විශේෂ මව් ශාක සංචිතයේ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීමටත් මෙම පර්යේෂණය යොදා ගත හැකිය.

පොල් මයිටාවන් හානියට ඔරොත්තුදීමේ පොල්වගා දර්ශ නිෂ්පාදනය කිරීමේ පර්යේෂණය.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

ඇසේරියා මයිටාවා හානිය, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ අතරමැදි හා වියළි කලාපයේ පොල් වගාවන්හි ඵලදාව අඩුවීමට හේතු වේ. මයිටාවන්ගේ හානියට ඔරොත්තු දීමේ පොල් වගා දර්ශයක් හඳුන්වා දීම මෙම ගැටලුව සඳහා තිරසාර විසඳුමක් ලෙස හැඳින්විය හැක. ඒ සඳහා ප්‍රවේණි හා ශාක අභිජනන අංශය විසින් දෙමුහුම් වර්ග 5ක් නිපදවා පසුගිය වසර 12 පුරාවට අධ්‍යයනය කරමින් පවතී.

එම දෙමුහුම් දර්ශ 5 වනුයේ ශ්‍රී ලංකා උස X බ්‍රසීලියන් කොළ කුන්දිරා, ගොන් තැඹිලි උස X බ්‍රසීලියානු කොළ කුන්දිරා, බ්‍රසීලියානු කොළ කුන්දිරා X ගොන් තැඹිලි උස, සැන්රාමන් උස X

බ්‍රසීලියානු කොළ කුන්දිරා සහ ශ්‍රී ලංකා කහ කුන්දිරා X ගොන් තැඹිලි උස වේ.

මේ අතරින් ශ්‍රී ලංකා උස X බ්‍රසීලියානු කොළ කුන්දිරා (T X BGD) දෙමුහුම් ප්‍රභේදය අඩුම මයිටා හානියක් සහ වැඩි ඵලදාවක් ලබාදෙන බවට පසුගිය වසර කිහිපය පුරාවටම නැවත නැවතත් වාර්තා විය. මෙම වර්ගය ඉහළ පොල් ඵලදාවක් ලබා දෙන කප්රුවන දෙමුහුම් ප්‍රභේදය මගින් ලබාදෙන ඵලදාවට සමාන ඵලදාවක් ලබාදෙනු ලැබේ. මේ නිසා ඉදිරියේදී මයිටා හානියට ඔරොත්තු දෙන වගා දර්ශයක් ලෙස T X BGD නිර්දේශ කිරීමේ ඉහළ විභවයක් පවතී. දීර්ඝ කාලීනව විවිධ ස්ථානයන්හි සිදුකරනු ලබන මෙම දෙමුහුම් වල පර්යේෂණ දත්ත එක්රැස් කිරීම තව දුරටත් සිදුකරනු ලැබේ. එලෙසම ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය මගින් ක්ෂේත්‍ර ජාන බැංකු තුළ විදේශීය පොල් ප්‍රභේදයක් වන බ්‍රසීලියානු කොළ කුන්දිරා ගුණනය කර වගා කිරීමේ ක්‍රියාවලියක්ද 2021 වසර තුළ සිදුකරනු ලදී.



රූපය 1. ශ්‍රී ලංකා උස X බ්‍රසීලියානු කොළ කුන්දිරා (T X BGD) දෙමුහුම් ප්‍රභේදය

දේශීය හා විදේශීය ජාන ප්ලාස්ම එකතු කිරීම සංරක්ෂණය කිරීම සහ ඇගයීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

කාර්මීකරණය, නාගරීකරණය, යටිතල පහසුකම් සංවර්ධනය , පාරම්පරික කෘෂිකර්මික ඉඩම් ඉහල වටිනාකමක් ඇති භෝග වගාවන් සඳහා යොදා ගැනීම, පොල් නැවත වගාකිරීමේ ජාතික වැඩසටහන්, කුණාටු නියඟ පළිබෝධ හානි වැනි ස්වාභාවික ව්‍යසනයන් නිසා සිදුවන ප්‍රවේණි /ජාන හායනය හේතුවෙන් පොල් ජාන සම්පත තර්ජනයට ලක්ව ඇත. මෙයට පිළියමක් ලෙස, ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රවේණි හා ශාක අභිජනන අංශය මගින් 1980 දශකයේ සිට විවිධ පොල්ජාන ප්ලාස්ම එකතු කිරීම, සංරක්ෂණය හා ජාන ප්ලාස්ම ඇගයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

2021 වර්ෂය තුළදී, පහත සඳහන් දේශීය හා විදේශීය පොල් ජාන ප්ලාස්ම ගුණනය කර සංරක්ෂණය කරන ලදී. (වගුව 1)

වගුව 1

ප්‍රභේදය	නිපදවූ පැළ සංඛ්‍යාව
දේශීය ජාන ප්ලාස්මය	
ගොන් තැඹිලි	28
බෝදිරි	35
රන් තැඹිලි	78
රත්රන් තැඹිලි	43
දුඹුරු කුන්දිරා	168
රතු කුන්දිරා	42
විදේශීය ජාන ප්ලාස්මය	
කැමරන් රතු කුන්දිරා	194
මලයානු රතු කුන්දිරා	27
බ්‍රසීලියන් කොළ කුන්දිරා	25
රෙනල් දූපත් උස	22
අන්දමන් උස	19
කැතිගන් කොළ කුන්දිරා	7

ළපටි පුෂ්ප රෝපිත කිණක පටක තුළින් අලිංගික කළල ජනනය හා පැළ නිපදවීම

පටක රෝපණ අංශය

ක්ලෝන පැළ ගුණනය වීමේ අඩු සීඝ්‍රතාවය මගහරවා ගැනීම සඳහා, කිණාක පටක ගුණනය වන අවස්ථාව සහ ප්‍රරෝහ ජනන අවස්ථාවේ පවතින රෝපණ ද්‍රව්‍ය සඳහා වර්ධක හෝමෝන (300 µM 2,4 Dichlorophenoxyacitic acid සහ 300 µM 6-Benzylaminopurine) වැඩි සාන්ද්‍රණයකින් යොදා ගන්නා ලදී.

මෙම කාලය තුළ පුෂ්ප මංජරී 18 කින් ප්‍රරෝහ 700ක් පමණ ලබා ගෙන ඇත. කොවිඩ් 19 හේතුවෙන් රට වසා දැමීම නිසා විවිධ වර්ධන අවස්ථා වල පැවති කිණාක පටක සැලකිය යුතු ප්‍රමාණයක් විනාශ වූ බැවින් සංඛ්‍යානමය විශ්ලේෂණයක් සිදු කිරීමට නොහැකි විය.



රූපය 2. සාර්ථකව ඵල දරා ඇති ඩිම්බ කෝෂ රෝපණ ක්‍රමය මගින් ලබාගත් ක්ලෝන ශාක

වසර තුළදී ඩිම්බ කෝෂ කිණාක පටක මගින් ජනනය වූ නව ක්ලෝන පැළ 85 ක් බාහිර පරිසරයට හුරු කළ අතර, ක්ලෝන පැළ 20ක් ක්ෂේත්‍රයේ සිටුවන ලදී. 2016-2017 වසර වලදී බණ්ඩිරිප්පුව වත්ත සහ කටාන ක්ෂේත්‍ර තුළ ස්ථාපිත, ඩිම්බ කෝෂ රෝපණය මගින් ලබාගත් CRIC 65 සහ CRISL 98 ක්ලෝන ශාක වල සාර්ථක ඵලදාවක් මේ වසරේදී පෙන්නුම් කර ඇත.

පොල් පටක රෝපණය සඳහා නව පූර්වක පටක හඳුනා ගැනීම

පටක රෝපණ අංශය

පොල් පටක රෝපණය සඳහා යොදා ගත හැකි නව පූර්වක පටකයක් ලෙස නොමේරූ ශාක පත්‍ර වල විභවය පරීක්ෂා කිරීම සඳහා ළපටි පොල් ශාක පත්‍ර විවිධ රෝපණ මාධ්‍ය සංයුතීන් තුළ වගා කරන ලදී. ඩිම්බ කෝෂ රෝපණ ක්‍රමය තුළින් ලබා ගන්නා ක්ලෝන පැළ ගුණනය කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සොයා ගැනීමේ අරමුණ ඇතිව මෙම පරීක්ෂණ සඳහා නළස්ථ කළල රෝපිත පැළ වල ළපටි පත්‍ර කොටස් යොදා ගන්නා ලදී. ළපටි පත්‍ර වල පාදස්ථ කොටස් විවිධ රෝපණ මාධ්‍ය සංයුතීන් තුළ වගා කරන ලදී. පූර්වක පටක සුලු ප්‍රමාණයක් එම්බ්‍රොයිඩිස් (ගෝලාකාර ව්‍යූහයන්) නිපදවූ අතර ඒවා ප්‍රරෝහණය වීමෙන් පසු නව ප්‍රරෝහ හට ගන්නා ලදී. මෙම ප්‍රරෝහ නව දුරටත් වර්ධනය වීම සඳහා අදාළ රෝපණ මාධ්‍ය තුළ පවත්වා ගන්නා ලදී.



පරිණත පොල් වගාව සඳහා පීව අඟුරු භාවිතයෙන් තිරසාර තෙතමණ සංරක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාප වල පොල් වගාකරුවන් සඳහා පීව අඟුරු යොදා ගනිමින් තිරසාර පාංශු තෙතමන සංරක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීමයි. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය 2015 වසරේ ආරම්භ කළ අතර වියළි කලාපය නියෝජනය කරමින් පුත්තලම දිස්ත්‍රික්කයේ රස්නායකපුර වත්තේ අවුරුදු 30 ක් පමණ වයසැති පැරණි පොල් වගාව මේ සඳහා තෝරා ගන්නා ලදී. මෙහිදී ග්ලිරිසිඩියා දඬුකැබලි අවම ඔක්සිජන් සැපයුමක් යටතේ නවීකරණය කරන ලද පෝරණුවක් තුළ දහනය කිරීමෙන් පීව අඟුරු සදාගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා සසම්භාවිකෘත පූර්ණ කාණ්ඩ සැලසුමට (RCBD) අනුව පහත ප්‍රතිකාරක අනුරූ 3 ක් මගින් පරීක්ෂා කරන ලදී.



රූපය 1. අධ්‍යයන භූමිය

පළමු ප්‍රතිකාරකය	- 1/3 කවාකාර වළක කිලෝ ග්‍රෑම් 15 ක් පීව අඟුරු වළ දැමීම
දෙවන ප්‍රතිකාරකය	- 1/3 කවාකාර වළක කිලෝ ග්‍රෑම් 10 ක් පීව අඟුරු වළ දැමීම
තෙවන ප්‍රතිකාරකය	- 1/3 කවාකාර වළක කිලෝ ග්‍රෑම් 5 ක් පීව අඟුරු වළ දැමීම
සිව්වන ප්‍රතිකාරකය	- 1/3 කවාකාර වළක පොල් ලෙලි 200-250 ක් වළ දැමීම
පස්වන ප්‍රතිකාරකය	- පොහොර කවය වටා පොල් අතු වසුන් යෙදීම (පාලක ප්‍රතිකාරකය)

2016 සිට 2021 දක්වා අබණ්ඩව වසර 5 ක ගෙඩි අස්වැන්න පහත රූප සටහනේ දක්වා ඇත. (රූපසටහන 2). වැඩිම අස්වැන්නක් (පොල් ගෙඩි 69/ගසකට/අවු.) කිලෝ ග්‍රෑම් 15 ක් පීව අඟුරු යෙදූ ගස්වල නිරීක්ෂණය වූ අතර එය පොල් ලෙලි සහ පාලක ප්‍රතිකාරකය යෙදූ ගස් වල අස්වැන්න සමග සසඳන විට (පිළිවෙලින් පොල් ගෙඩි 57/ගසකට/අවු. සහ පොල් ගෙඩි 53/ග සකට/අවු.) සැලකිය යුතු සාධනීය මට්ටමකි. පොල් ලෙලි වැලලූ ගස් හා සසඳන විට, කිලෝග්‍රෑම් 15 ක පීව අඟුරු යෙදූ ගස්වල අස්වැන්නෙහි වැඩිවීම 21% ක් පමණ වේ. ප්‍රතිකාරක අතර පාංශු තෙතමනයෙහි සැලකිය යුතු වෙනස්කම් නොමැත. (රූපය 3)



රූපසටහන 2. ජීව ඇඟුරු, පොල් ලෙලි සහ පාලක ප්‍රතිකාරකවල 2016 - 2021 සිට සාමාන්‍ය ගෙඩි අස්වැන්න එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් වන අගයන්ගේ මධ්‍යයන්‍ය, $p < 0.05$ අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් නොපෙන්වයි.



රූපසටහන 3. විවිධ ප්‍රතිකර්ම සිදු කරන වළවල් වල පාංශු තෙතමන ප්‍රතිශත

පැළ පොල් වගාව සඳහා ජීව අඟුරු යොදා ගනිමින් තිරසාර තෙතමන සංරක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාපවල පැළ පොල් වගාවන් සඳහා ජීව අඟුරු යොදා ගනිමින් තිරසාර පාංශු තෙතමන සංරක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම සහ පොල් පැළ සිටුවීමේදී පොල් පැළ සඳහා ජීව අඟුරු යෙදීමේ සුදුසුම ක්‍රමය අධ්‍යයනය කිරීමයි. පොල් පැළ සිටුවීමේදී යොදන පොල් ලෙලි ස්ථර සඳහා ආදේශකයක් ලෙස ග්ලිරිසීඩියා ජීව අඟුරු (2 % බර/බර) මේ සඳහා යොදාගන්නා ලදී. ජීව අඟුරු යෙදීම මගින් පොල් පැළ වලට අවශ්‍ය තෙතමනය හා පොහොර රඳවා තබා ගැනීමේ හැකියාව වැඩි කර නියං කාලයේදී ජල සැපයුම දුර්වල වීමෙන් පොල් පැළ වලට සිදුවන හානිය අවම කර ගැනීමේ හැකියාව ඇත. මෙම අධ්‍යයනය සඳහා සසම්භාවිකෘත පූර්ණ කාණ්ඩ සැලසුමට (RCBD) අනුව, ප්‍රතිකාරක 5 ක් අනුරූ 3 ක් මගින් පරීක්ෂා කරන ලදී.

පළමු ප්‍රතිකාරකය	- වළේ පතුලෙහි ජීව අඟුරු හෝ පොල් ලෙලි නොමැත
දෙවන ප්‍රතිකාරකය	- වළේ පතුලේ පොල් ලෙලි 30 ක් - 35 ක් තබා ඇත (CRI නිර්දේශය අනුව)
තෙවන ප්‍රතිකාරකය	- වළේ පතුලේ 2 % (බර/බර) ග්ලිරිසීඩියා දඬු ජීව අඟුරු තට්ටුවක් ලෙස තබා ඇත
සිව්වන ප්‍රතිකාරකය	- වළේ පතුලේ 1 % (බර/බර) ග්ලිරිසීඩියා දඬු ජීව අඟුරු තට්ටුවක් ලෙස තබා ඇති අතර 1 % (බර/බර) ග්ලිරිසීඩියා දඬු ජීව අඟුරු වළේ පස් සමඟ මිශ්‍ර කර ඇත
පස්වන ප්‍රතිකාරකය	- 2 % (බර/බර) ග්ලිරිසීඩියා දඬු ජීව අඟුරු මුළු වළේම පස සමඟ මිශ්‍ර කර ඇත

පැළ සිටුවා වසරකට පසු ප්‍රතිකාරක යොදන ලද පොල් වළවල් අතර පාංශු තෙතමනයේ සැලකිය යුතු වෙනසක් දක්නට නොතිබුණි (වගුව 1). මුළු වළෙහිම පස් සමඟ, බර අනුව 2 % ජීව අඟුරු මිශ්‍ර කරන ලද ප්‍රතිකාරකයෙහි (T5) ඉහළම පාංශු තෙතමන ප්‍රතිශතයක් (5.86 %) නිරීක්ෂණය වූ අතර, මෙම අගය පොල් ලෙලි යෙදූ ප්‍රතිකාරකයේ පාංශු තෙතමනය සමග සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කරන ලදී. පොල් ලෙලි යෙදූ ප්‍රතිකාරයේ තෙතමනය (4.67 %) කි. තෙත් පාංශු කැටිති ස්ථායිතා (Wet aggregate stability) දත්තද මීට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළ නමුත් එම වෙනස සැලකිය යුතු නොවේ. ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ ප්‍රතිකාරක 3 සහ ප්‍රතිකාරක 4 වල ඉහළම තෙත් සමස්ථ ස්ථායිතා ප්‍රතිශතය පිළිවෙළින් 21.6 % සහ 21.4 % ලෙස නිරීක්ෂණය වූ අතර පොල් ලෙලි යෙදූ වළවල් (18.6 %) හා සසඳන විට තෙතමනය සැලකිය යුතු ලෙස ඉහළ අගයක් පෙන්වයි. කෙසේ වෙතත් ස්ථීර නිගමනවලට එළඹීම සඳහා 2022 දී පරීක්ෂණ දිගටම සිදුකරගෙන යනු ලැබේ.



රූපය 4. ක්ෂේත්‍රය සඳහා ජීව අඟුරු යෙදීම





රූපය 5. පැළ සිටුවීම



රූපය 6. වර්ධක පරාමිතීන් ගැනීම

වගුව 1. පැළ සිටුවා වසරකට පසු ප්‍රතිකාරක අතර සෙන්ටිමීටර් 0 - 30ත් අතර ගැඹුරක පාංශු තෙතමනය සහ තෙත් පාංශු කැටිති ස්ථායිතාවය

ප්‍රතිකාරකය	**පාංශු තෙතමන %**	**තෙත් පාංශු කැටිති ස්ථායිතාවය %**
පළමු ප්‍රතිකාරකය - වළේ පතුලෙහි ජීව අඟුරු හෝ පොල් ලෙලි නොමැත	5.03 [ab]	19.63 [ab]
දෙවන ප්‍රතිකාරකය - වළේ පතුලේ පොල් ලෙලි 30ක් - 35ක් තබා ඇත (පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශය අනුව)	4.67 [b]	18.63 [b]
තෙවන ප්‍රතිකාරකය - වළේ පතුලේ 2% (බර/බර) ග්ලිරිසීඩියා දඬු ජීව අඟුරු තට්ටුවක් ලෙස තබා ඇත	5.69 [a]	21.60 [a]
සිව්වන ප්‍රතිකාරකය - වළේ පතුලේ 1% (බර/බර) ග්ලිරිසීඩියා දඬු ජීව අඟුරු තට්ටුවක් ලෙස තබා ඇති අතර 1 % (බර/බර) ග්ලිරිසීඩියා ජීව අඟුරු වළේ පස් සමඟ මිශ්‍ර කර ඇත	5.40 [ab]	21.42 [a]
පස්වන ප්‍රතිකාරකය - 2 % (බර/බර) ග්ලිරිසීඩියා දඬු ජීව අඟුරු මුළු වළේම පස සමඟ මිශ්‍ර කර ඇත	5.86 [a]	20.06 [ab]
CV	0.31	0.27
P අගය	0.142	0.103

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය, P< 0.1 ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.

පැළ පොල් වගාවේ වර්ධනය සහ පාංශු තෙතමන සංරක්ෂණය සඳහා නව වසුන් ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ ඇගයීම

ශෂ්‍ය විද්‍යා අංශය

සාමාන්‍යයෙන් පොල් වගා කරනු ලබන්නේ වැසි ජලය මත පදනම්ව ය. පොල් ගසෙහි වර්ධනය සහ අස්වැන්න හොඳින් පවත්වාගෙන යෑම සඳහා සඳහා අඛණ්ඩ ජල සැපයුමක් අවශ්‍ය වන බැවින් වියළි කාලවලදී පාංශු ජල සැපයුම දුර්වල වීම පොල් ගසේ පැවත්මට සහ ගෙඩි නිෂ්පාදනයට බලපාන තීරණාත්මක සාධකයකි. විවිධ ශාක ද්‍රව්‍ය යොදා ගනිමින් පොහොර කවය වසුන් කිරීම සහ පොල් ලෙලි වැළලීම පොල් ඉඩම් වල බහුලව භාවිතා වන පාංශු තෙතමන සංරක්ෂණ ක්‍රම වේ. වසුන් සඳහා යොදාගනු ලබන ද්‍රව්‍ය බොහොමයක් කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන වල අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා බැවින්, වසුන් යෙදීම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය හිඟ වෙමින් පවතී. එබැවින්, පාංශු තෙතමන සංරක්ෂණයට සහ පොල් පැළ වල වර්ධනය සඳහා වෙළඳපොළෙහි පවතින නවීකරණය කරන ලද පොලිතීන් වසුන් (Mulching film / Mulching mat) වල බලපෑම සම්ප්‍රදායික වසුන් වල බලපෑමට සාපේක්ෂව පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනය තුළින් සැලසුම් කරන ලදී

මෙම අධ්‍යයනයේ දී විවිධ වසුන් ද්‍රව්‍ය යෙදූ පොහොර කවයන්හි පාංශු තෙතමනය මනින ලදී. මතුපිට පසෙහි තෙතමනය (සෙන්ටිමීටර් 0 - 15) සඳහා වසුන් ද්‍රව්‍ය වල සැලකිය යුතු ලෙස බලපෑමක් පෙන්වන ලදි. පොල් අතු වසුන් යෙදූ ප්‍රතිකාරකයේ ඉහළ පාංශු තෙතමන ප්‍රතිශතයක් නිරීක්ෂණය වූ අතර (7.22%), Mulching film යෙදූ ප්‍රතිකාරකයේ අවම පාංශු තෙතමන ප්‍රතිශතයක් (5.57 %) නිරීක්ෂණය විය. Mulching mat යෙදීම මගින් මතුපිට පසෙහි (සෙන්ටිමීටර් 0 - 15) පාංශු තෙතමන ප්‍රමාණයට ඇති කරන බලපෑම පොල් අතු සහ පොල් ලෙලි වසුන් වල බලපෑමට සමාන විය. පාංශු ගැඹුර සෙන්ටිමීටර් 15 - 30 සහ සෙන්ටිමීටර් 30 - 45 කාණ්ඩ වල පාංශු තෙතමනය සඳහා වසුන් ද්‍රව්‍ය මගින් සිදුකරන බලපෑමහි වෙනසක් නොපෙන්වීය. පොහොර කවය තුළ ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම සඳහා විවිධ වසුන් ද්‍රව්‍ය යෙදූ පොහොර කවයන් වලින් ලබාගත් මතුපිට පස් සාම්පල විශ්ලේෂණය කරන ලදී. එයින් නිරීක්ෂණය වූයේ ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරකම් කෙරෙහි සියලුම වසුන් ද්‍රව්‍යවල බලපෑම සමාන ප්‍රතිඵල පෙන්වන බවයි.





රූප සටහන් 7. විවිධ වසුන් ප්‍රතිකාරක

වගුව 2. විවිධ වසුන් ද්‍රව්‍ය යටතේ විවිධ පාංශු මට්ටම් වල තෙතමන අන්තර්ගතය සහ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය

වසුන් ද්‍රව්‍ය	තෙතමන ප්‍රතිශතය (වියළි පදනම මත)			ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය (µg-CO2/g-soil/ day)
	සෙ.මී 0 - 15	සෙ.මී 15 - 30	සෙ.මී 30 - 45	
පොල් අතු	7.22 [a]	8.07	7.55	49.63
පොල් ලෙලි	5.96 [ab]	7.32	7.85	47.6
Mulching Mat	6.35 [ab]	7.38	8.35	47.44
Mulching Film	5.57 [b]	7.25	7.82	46.6
SD	1.54	1.04	1.91	18.58
CV	24.49	13.85	24.15	38.87
P - අගය	0.01	0.06	0.86	0.973

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය, $p < 0.05$ ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.

ගිනි තෘණ (*Panicum maximum*) හි විකල්ප භාවිතයන් අධ්‍යයනය කිරීම

ශාස්ත්‍ර විද්‍යා අංශය

ගිනි තෘණ (*Panicum maximum*) 1820 දශකයේදී පමණ ශ්‍රී ලංකාවට සත්ත්ව අහාරයක් ලෙස හඳුන්වා දී ඇති අතර, මෙය පසුගිය දශක කිහිපය තුළ මෙරට පරිසර පද්ධතිවල ස්වාභාවීකරණය වී ඇත. වර්තමානයේ මෙය, ආක්‍රමණශීලී ගැටළුකාරී වල් පැළෑටියක් ලෙස සැළකේ. මේ වන විට ගිනි තෘණ, බොහෝ පොල් වගාවන් ආක්‍රමණය කර, ඒවායෙහි දෛනික ක්‍රියාවන්ට බාධා ඇති කරමින්, නිෂ්පාදන පිරිවැය වැඩි කරනු ලබයි. මෙය රයිසෝමයක් සහිත තෘණ වල් පැළෑටියක් වන බැවින්, බොහොමයක් යාන්ත්‍රික වල් පැළෑටි මර්දන ක්‍රම, මෙය කළමනාකරණය සඳහා ඵලදායී නොවේ. සංස්ථානික වල් නාශක තහනම් කිරීමත් සමඟ මෙම වල් පැළෑටිය කළමනාකරණය කිරීම ඉතාමත් වෙහෙසකර කටයුත්තක් වී ඇත. කෙසේ වෙතත් මෙය බොහෝ රටවල වටිනා සත්ත්ව ආහාරයක් ලෙසත්, කාබනික පොහොර නිෂ්පාදනයේ ප්‍රධාන අමුද්‍රව්‍යක් ලෙසත් යොදාගන්නා බැවින්, ගිනි තෘණ කොම්පෝස්ට්, පණු පොහොර සහ ගව ආහාර නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගැනීමට ඇති හැකියාව ඇගයීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එමෙන්ම විවිධ අස්වනු කාල සීමාවන් වල, ගිනි තෘණ වල පෝෂක සංයුතිය නිර්ණය කිරීමද සිදු කරනු ලබයි.

ගිනි තෘණ වල වියළි ද්‍රව්‍ය ප්‍රමාණය කාලයත් සමඟ වැඩි වන අතර වැඩිම වියළි ද්‍රව්‍ය ප්‍රමාණයක් පෙන්වනුයේ (හෙක්ටයාරයකට මෙට්රික් ටොන් 1.89) අස්වනු නෙළීමෙන් පසු සති 12 ක වර්ධන අවධියේදියි. මීට සමානව ගිනි තෘණ වල දළ තන්තු ප්‍රතිශතය ද කාලයත් සමඟ වැඩි වේ.

අඩුම දළ තන්තු ප්‍රතිශතය (36.39 %),අස්වනු නෙළීමෙන් සති 4 ක වර්ධන අවධියේදී වාර්තා වූ අතර ඉහළම දළ තන්තු ප්‍රතිශතය (39.63%) අස්වනු නෙළීමෙන් සති 12 ක වර්ධන අවධියේදී

වාර්තා විය. දළ ප්‍රෝටීන් ප්‍රතිශතය, නයිට්‍රජන් ප්‍රතිශතය සහ පොස්පරස් ප්‍රතිශතය කාලයත් සමඟ අඩු වී ඇති අතර මෙම පරාමිතීන් තුනෙහිම ඉහළම අගයන් අස්වනු නෙළීමෙන් පසු සති 4 ක වර්ධන අවධියේදී වාර්තා වී ඇත (වගුව 3).

වගුව 3. විවිධ වර්ධන අවධියන්හිදී, ගිනි තෘණ වල වියළි ද්‍රව්‍ය ප්‍රමාණය, දළ ප්‍රෝටීන් %, දළ තන්තු %, නයිට්‍රජන් % සහ පොස්පරස් %

අස්වනු නෙළීමේ පරතරය (නැවත වැඩීමෙන් සති කිපයකට පසු වර්ධක අවධිය)	වියළි ද්‍රව්‍ය ප්‍රමාණය (හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන්)	දළ ප්‍රෝටීන් %	දළ තන්තු %	නයිට්‍රජන් %	පොස්පරස් %
4	0.84^{b}	9.32^{a}	36.39^{c}	1.49^{a}	0.29^{a}
6	1.01^{b}	7.28^{b}	38.40^{b}	1.16^{b}	0.27^{a}
8	1.52^{ab}	6.82^{bc}	38.62^{ab}	1.09^{bc}	0.25^{abc}
10	1.80^{a}	6.22^{c}	38.38^{b}	0.99^{c}	0.21^{bc}
12	1.89^{a}	4.53^{d}	39.63^{a}	0.71^{d}	0.19^{c}
P අගය	0	0	0	0	0
SD	0.74	1.86	2.08	0.31	0.1
CV	52.53	27.86	5.44	28.92	43.18

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය, $p < 0.05$ ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.

නාගරික ඝණ අපද්‍රව්‍යවලින් සෑදූ කොම්පෝස්ට් පොල් වගාවන් වලට යෙදීම

පාංශු හා ශාක පෝෂණ අංශය

කොම්පෝස්ට් බැරලෝහ සහ ව්‍යාධිජනකයින්ගෙන් අපවිත්‍ර වීම මිනිස් සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති කරයි. පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයකින් තොරව නාගරික ඝණ අපද්‍රව්‍ය මගින් සෑදූ කොම්පෝස්ට් පොල් වගාකරුවන් විසින් පොල් වගාවන්ට යෙදීම දැනටමත් සිදු කරයි. ශ්‍රී ලංකාවේ නගර සභා 30 කින් ලබා ගත් කොම්පෝස්ට් සාම්පල ප්‍රධාන වශයෙන් එහි පවතින මහා පෝෂක, ක්ෂුද්‍ර පෝෂක, ව්‍යාධිජනකයින් හා බැරලෝහ හඳුනා ගැනීම සඳහා පරීක්ෂා කරන ලදී . මහා පෝෂක, ක්ෂුද්‍ර පෝෂක සහ ව්‍යාධිජනකයින් පිළිබඳ පරීක්ෂණ 2020 දී සිදු කරන ලද අතර එහිදී අඩු මහා පෝෂක ප්‍රමාණයක් හා, වැඩි කාබන් ප්‍රමාණයක් පවතින බවත් පිළිගත හැකි මට්ටමක ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණයක් පවතින බවත් අනාවරණය විය. මෙම සාම්පලවල බැරලෝහ ප්‍රමාණය 2021 දී පරීක්ෂා කරන ලද අතර සාම්පල වල බැරලෝහ ප්‍රමාණය (වගුව 04) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් අනුමත කරන ලද ප්‍රමාණයේ පැවතිනි. සාම්පල දෙකක පමණක් රසදිය විද්‍යාගාරයේ හඳුනාගත හැකි මට්ටමේ පැවතිනි.

වගුව 04 - නාගරික ඝණ අපද්‍රව්‍ය මගින් සෑදු කොම්පෝස්ට්වල හඳුනාගත හැකි වූ බැරලෝහ.

බැරලෝහය	**සාමාන්‍ය (පරාසය)** **මි.ග්‍රෑම් / කි.ග්‍රෑම්**	**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් අනුමත ප්‍රමිතිය** **මි.ග්‍රෑම් / කි.ග්‍රෑම්**
කැඩ්මියම් (Cd)	0.41 (0.1 - 1.3)	උපරිම 3
ක්‍රෝමියම් (Cr)	20.7 (7.4 - 63.6)	උපරිම 150
ඊයම් (Pb)	9.66 (2.9 - 21.2)	උපරිම 150
නිකල් (Ni)	6.5 (1.28 - 11.7)	උපරිම 50
ආසනික් (As)	2.4 (0.5 - 4.2)	උපරිම 5
රසදිය (Hg)	0.2 (0.1 - 0.3)	උපරිම 2

** සාම්පල දෙකක පමණක් රසදිය හඳුනාගත හැකි විය.

කෝලිෆෝම්, ෆීකල් කෝලිෆෝම්, සැල්මොනෙල්ලා, ජීවී නෙමටෝඩාවන් සහ නෙමටෝඩාවන්ගේ ශක්‍ය බිත්තර සඳහා සාම්පල පරීක්ෂා කරන ලදී. සාම්පල 16 ක පමණ ෆීකල් කෝලිෆෝම් බැක්ටීරියාව හඳුනාගත හැකි මට්ටමේ පැවතිනි. නමුත් සැල්මොනෙල්ලා කිසිදු සාම්පලයක දක්නට නොලැබුනි. නෙමටෝඩාවන් (සාම්පල 5) සහ නෙමටෝඩාවන්ගේ ශක්‍ය බිත්තර (සාම්පල 10) සාම්පල කිහිපයක හඳුනාගත හැකි මට්ටමේ පැවතිනි. සාම්පල වල ෆීකල් කෝලිෆෝම් බැක්ටීරියාව පැවතීමෙන් ඒවා මල අපද්‍රව්‍ය මගින් අපවිත්‍ර වී ඇති බව පැහැදිලි වේ. කෙසේවෙතත් මෙම අධ්‍යයනයට අදාළ ක්ෂුද්‍ර ප්ලාස්ටික් සහ කාබන් බණ්ඩනය සඳහා වන පරීක්ෂණ අවසන් වන තුරු පොල්වතු සඳහා නාගරික ඝණ අපද්‍රව්‍ය මගින් සෑදූ කොම්පෝස්ට් යෙදීම පොල් පර්යේෂණ ආයතනය නිර්දේශ නොකෙරේ.

ක්ෂේත්‍රයේ වැඩුණු අධික ලෙස වර්ණක සහිත පොල් මුල්වල ආබස්කියුලර් මයිකොරයිසේ (arbuscular mycorrhizal [AM]) **ජනපදකරණය ඇගයීම සඳහා පිරිසිදු කිරීමේ සහ වර්ණකරණ ක්‍රමවේදය සාර්ථක ලෙස ප්‍රශස්ත කිරීම.**

පාංශු හා ශාක පෝෂණ අංශය

ආබස්කියුලර් මයිකොරයිසේ දිලීර සහ පොල් ගස් අතර සහජීවනය ආශ්‍රිත අධ්‍යනයන්හි නිරත වන විද්‍යාඥයින්ට ඇති වන විශාලතම අභියෝගයක් වන්නේ ක්ෂේත්‍රවල වැඩුණු දැඩි ලෙස වර්ණ වූ පොල් මුල් සමඟ කටයුතු කිරීම වේ පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් (KOH) මගින් මුල් පිරිසිදු කිරීමෙන් පසුව ට්‍රයිපන් නිල් පැහැයෙන් වර්ණක යෙදීම මුල්වල දිලීර ව්‍යුහයන් දෘශ්‍යමාන කිරීම සඳහා බහුලව භාවිතා වන ක්‍රමයකි. කෙසේ වෙතත් පොල් වැනි අඳුරු වර්ණක මුල් වල දෘශ්‍යකරණය සහතික කිරීම සඳහා පැහැදිලි අමතර පියවර අවශ්‍ය වේ

මුල් කොටස් රැයක් ජලයෙහි පොඟවා ගැනීම, කිහිප වතාවක් KOH හි විවිධ සාන්ද්‍රණයන්හි මුල් රත් කිරීම , විවිධ කාල පරාසයන් සඳහා මුල් KOH හි ජීවානුහරණය කිරීම සහ මුල් පිරිසිදු කිරීම සඳහා හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් එකතු කිරීම වැනි අමතර පියවර කිහිපයක් මූලයන් ආම්ලීකරණය කිරීමෙන් පසු ට්‍රයිපන් නිල් මගින් වර්ණ ගැන්වීමට පෙර පරීක්ෂා කරන ලදී. 10% පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් (KOH) තුළ එක රැයක් පොඟවා ගැනීමෙන් පසුව ජීවානුහරණය කිරීම (රූපය 8) සහ මුල් පැහැදිලි වන තුරු වට කිහිපයක් මුල්වල කොටස් 70^{0}C දී නැවුම් KOH සමඟ උඳුනක රත් කිරීම (රූපය 9) මගින් මුල් දැඩි හානියකින් තොරව පාරගම්ය වීම මගින් සංයුක්ත අන්වීක්ෂය යටතේ ආබස්කියුලර් මයිකොරයිසේ ව්‍යුහය වර්ණ කිරීමේ ක්‍රියාවලිය සහ දෘශ්‍යකරණය වැඩි දියුණු කරන ලදී.



රූපය 8. දැඩි ලෙස වර්ණක මුල් (වම්) සහ ප්‍රශස්ත නිෂ්කාශන සහ වර්ණ කිරීමේ ක්‍රියාවලියෙන් පසුව සාර්ථකව පිරිසිදු කරන ලද පොල් මුල් (දකුණ)



රූපය 9. සාර්ථක පිරිසිදු කිරීම සහ වර්ණ කිරීමෙන් පසු අධික ලෙස වර්ණක සහිත පොල් මුල්වල ආර්බස්කියුලර් මයිකොරයිසල් ව්‍යුහයන් (a) Inter-radical hyphae (b) Vesicles (c) Arbuscules (d)extra-radical hyphae (e) 70% ආසාදන වූ මූල බණ්ඩනය Arbuscules සහ Inter-radical hyphae hyphal ව්‍යුහයන් සමග

පස වැඩි දියුණු කිරීමේ ප්‍රභවයක් ලෙස ජීව අඟුරු භාවිතා කිරීමෙන් පොල් රයිසෝස්පියර් හි වෙසිකියුලර්-ආර්බස්කියුලර් මයිකෝරයිසා වල සහජීවනය වැඩි දියුණු කිරීම.

පාංශු හා ශාක පෝෂණ අංශය

ජීව අඟුරු, පොල් වගාවන්හි පස වැඩි දියුණු කිරීමේ ප්‍රභවයක් ලෙස පෝෂක සුලභ කිරීම සහ ශාක වර්ධනය ප්‍රවර්ධනය කරන පාංශු ජීවී සමූහයට ඇති බලපෑම්' පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, 2018 වර්ෂයේ දී ජීව අඟුරු මගින් හිතකර පාංශු ක්ෂුද්‍ර ජීවීන් කෙරෙහි ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීම සඳහා දීර්ඝ කාලීන ක්ෂේත්‍ර පර්යේෂණයක් ආරම්භ කරන ලදී. මෙම අත්හදා බැලීමේ දී භාවිතා කරන ලද පෙව අඟුරු වර්ග වූයේ ගොවිපොළ පදනම් කරගත් අපද්‍රව්‍ය වන ග්ලිරිසීඩියා දඬු (GL-BC) සහ දහයියා (RH-BC) වලින් නිපදවන ලද ජීව අඟුරු ය. පෙව අඟුරු යෙදීමෙන් වසර තුනකට පසු, ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් එකතු කරන ලද පොල් මුල්වල අන්වීක්ෂීය දෘශ්‍යකරණය මගින් පෙව අඟුරු යෙදීමෙහි බලපෑම තක්සේරු කරන ලදී. අධ්‍යයනයේ ප්‍රතිඵලවලින් පෙනී යන්නේ පෙව අඟුරු යෙදීම මගින් පාලක පරීක්ෂණයට වඩා පොල් මුල්වල වෙසිකියුලර්-ආර්බුස්කියුලර් මයිකෝරයිසා මූල ආසාදනය වැඩි කර ඇති බවයි. කෙසේ වෙතත්, පෙව අඟුරු නොදැමූ පාලන ප්‍රතිකාරයට වඩා සැලකිය යුතු ඉහළ ආසාදනයක් ග්ලිරිසීඩියා දඬු මඟින් නිපදවන ජීව අඟුරුවල පෙන්නුම් කළේය. පර්යේෂණ දිගටම කරගෙන යනු ලැබේ.

පොල් පැළ වල බෙදුණු හෝ අර්ධ වශයෙන් බෙදුණු පත්‍රවල වර්ගඵලය සමීකරණයක් මගින් නිර්ණය කිරීම

ශාක කායික විද්‍යා අංශය

මෙම පර්යේෂණයෙහි අරමුණු වනුයේ පොල් පැළ වල බෙදුණු හෝ අර්ධ වශයෙන් බෙදුණු පත්‍රවල වර්ගඵලය නිවැරදි, පහසු, අඩු පිරිවැයකින් හා විනාශකාරී නොවන ක්‍රමවේදයකින් නිර්ණය කිරීමයි. මේ සඳහා උස × උස (TT) කොළ කුන්දිරා × උස (DGT), සහ කහ කුන්දිරා × උස (DYT) යන වගා දර්ශ වලින් ලබාගත් පත්‍ර සාම්පල යොදාගන්නා ලදී. බහුගුණ රේඛීය ප්‍රතිපායනය, බහුපද ආදර්ශය සහ ස්නායුක ජාල යන සංඛ්‍යාත්මක ක්‍රමවේදයන් මේ සඳහා යොදා ගන්නා ලදී. ස්නායුක ජාල ආදර්ශකය වඩාත් නිවැරදි ප්‍රතිඵල ලබාදුන් අතර, අනුපිළිවලින් TT, DYT, සහ DGT සඳහා මධ්‍යන්‍ය වර්ග දෝෂ 0.1761, 0.1378 සහ 0.1701 ත්, නිරවද්‍යභාවය 0.91, 0.93 සහ 0.86 වශයෙනුත් විය. උස × උස වගාදර්ශය සඳහා ස්වායත්ත විචල්‍ය ලෙස උපරිම දිග, අවසන් පත්‍රිකා දෙකෙහි සාමාන්‍ය දිග සහ පත්‍රයෙහි මැද පත්‍රිකා තුනෙහි සාමාන්‍ය පළල වඩාත් නිරවද්‍ය ප්‍රතිඵල දුනි. DYT වගාදර්ශය සඳහා වඩාත් නිරවද්‍ය ප්‍රතිඵල දුන් ස්වායත්ත විචල්‍ය වූයේ උපරිම දිග, අවසන් පත්‍රිකා දෙකෙහි සාමාන්‍ය දිග, පත්‍රිකා අග්‍රස්ථ අතර දුර, පත්‍රයෙහි මැද පත්‍රිකා තුනෙහි සාමාන්‍ය දිග සහ පළලයි. DGT වගාදර්ශය සඳහා පත්‍රයෙහි මැද පත්‍රිකා තුනෙහි සාමාන්‍ය දිග සහ පළල සහ පත්‍රිකා ගණන වඩාත් නිරවද්‍ය ප්‍රතිඵල දුන් ස්වායත්ත විචල්‍ය විය. කෙසේ නමුදු මෙම ආදර්ශකයන් ක්ෂේත්‍රය තුළ භාවිතය සංකීර්ණ බැවින්, ඒවා වඩාත් සරල කිරීම අරමුණු කොට පර්යේෂණය ඉදිරියේදීත් ක්‍රියාත්මක වේ.



පොල් නිෂ්පාදනය කෙරෙහි දේශගුණික විපර්යාස වල බලපෑම්

පොල් ඵලදාවේ වෙනස්වීමට පවතින දේශගුණික තත්ත්වයන්ගේ බලපෑම

ශාක කායික විද්‍යා අංශය

මුළු දිවයින පුරා විසිරි ඇති පොල් වගා කරන ප්‍රදේශවල පොල් වතු 900 කට වඩා වැඩි ප්‍රමාණයකින් ලබා ගත් දත්ත ඇසුරින් 2021 වසර සඳහා ජාතික පොල් නිෂ්පාදනය ගණනය කරන ලදී. ඒ අනුව 2021 වසරෙහි ජාතික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3382.9 සහ මෙය මෑත අතීතය තුළ ඉහළම ඵලදාවක් වාර්තා වූ වසරකි. ඒ අනුව 2020 වසරේ ජාතික පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන 2818.1) සමඟ සසඳන විට 20% ක වැඩි වීමකි. 2021 වසරේ නිරීක්ෂිත ඵලදා වෙනස්වීමේ රටාව සාමාන්‍ය රටාව හා සසඳන විට යම් සමානතාවයක් පෙන්නුම් කර ඇති අතර තුන්වන මුරයේදී (මැයි/ජුනි) ඉහළ අගයක් (ගෙඩි මිලියන 634.3) පෙන්නුම් කරයි.

2021 වසරේ ඇස්තමේන්තු කළ ජාතික පොල් නිෂ්පාදනය පුරෝකථනය කළ අගයට (ගෙඩි මිලියන 3353.1 ± 29.3) ඉතා ආසන්න අගයක් වූ අතර පොල් නිෂ්පාදනය පුරෝකථනය කළ අගයට වඩා 1 % ක ඉහළ අගයක් පෙන්නුම් කරන ලදී.

(a)



(b)



	Jan / Feb	Mar / Apr	May / Jun	Jul / Aug	Sep / Oct	Nov / Dec
ANCP 2020	418.80	525.50	553.10	507.20	443.10	370.47
ANCP - 2021	470.63	580.86	634.30	619.18	562.56	515.39

රූපය - 01

a) 2021 වසර සඳහා පුරෝකථනය කළ ද්වීමාසික ඵලදාව හා අදාළ කාල වකවානු සඳහා ඇස්තමේන්තු ගත පොල් ඵලදාව අතර සංසන්දනය.

b) එහි 2020 වසරේ ජාතික පොල් නිෂ්පාදනය සමඟ සංසන්දනය.

ප්‍රධාන පොල් වගා කරන ප්‍රදේශයන්ට 2020 වසරේ අවසන් කාල පරාසය තුළත් 2021 වසර පුරාත් හොඳින් පැතිරුණු වර්ෂාපතනයක් ලැබීම 2020 වසරට සාපේක්ෂව හොඳින් පැතිරුණු ඉහළ පොල් ඵලදාවක් 2021 වසරේ වාර්තා වීමට හේතු විය. 2021 වසරේදී පොල් වගා කරන ප්‍රදේශයන් ආවරණය කරමින් ලැබූ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සැලකීමේදී එය 2020 වසරට සාපේක්ෂව (මි.මී.1534.9) 48% ක වැඩි වීමකි. ඒ අනුව සියලුම දිස්ත්‍රික්කයන්ට 2020 වසරට සාපේක්ෂව 2021 වසරේදී ඉහළ වර්ෂාපතනයක් ලැබී ඇත. ඒ අතුරින් දිස්ත්‍රික්ක තුනකට, මහනුවර (105%) , හම්බන්තොට (101%) සහ මන්නාරම (101%) පෙර වසර වලට සාපේක්ෂව දෙගුණයකට වඩා වැඩි වර්ෂාපතනයක් ලැබී ඇත. දිස්ත්‍රික්ක හතකට, මොණරාගල (88%), පුත්තලම (82%), මාතලේ (80%), රත්නපුර (75%), අම්පාර (67%), ගම්පහ (61%) සහ කළුතර (50%) ලෙස 2020 වසරට සාපේක්ෂව 50% කින් වැඩි වර්ෂාපතනයක් 2021 වසරේදී ලැබී ඇත. අනෙකුත් දිස්ත්‍රික්ක වලටද 2020 වසරට සාපේක්ෂව විවිධ ප්‍රමාණයන්ගෙන් වැඩි වූ වර්ෂාපතනයක් 2021 වසරේදී ලැබී ඇති අතර ඒ අතරින් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ඉහළම වර්ෂාපතනයක් (45%) සමගින් මඩකලපුව දිස්ත්‍රික්කය තුළ අඩුම වර්ෂාපතනයක් (4%) වාර්තා වී ඇත. පසුගිය වසර 10 තුළ පොල් වගා කරන දිස්ත්‍රික්කයන්හි වාර්තා වූ වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය සැලකමේදී ඉහළම වර්ෂාපතනයක් ලැබූ වසරක් ලෙස 2021 වසර වාර්තා වී ඇත. එලෙසම වියළි කලාපයේ ඇතැම් දිස්ත්‍රික්ක හැරුනු කොට බොහෝ පොල් වගා කරන දිස්ත්‍රික්කයන්හි වායු ගෝලීය උපරිම උෂ්ණත්වය (Tmax) සීමාකාරී අගය 33°C ට පහළ අගයක පැවති ඇත. මෙලෙස 2021 වසර තුළ පැවති හොඳින් පැතිරුනු වර්ෂාපතනයත් හිතකර උෂ්ණත්ව තත්ත්වත් 2020 වසරට සාපේක්ෂව එම වසරේ ඉහළ ඵලදාවක් ලැබීමට හේතු විය.



රූපය - 02

2021 වසරේ පොල් වගා කරන දිස්ත්‍රික්ක වල වාර්තා වූ මුළු වර්ෂාපතනය සහ 2020 වසරේ එම දිස්ත්‍රික්ක වල වාර්තා වූ මුළු වර්ෂාපතනයේ සංසන්දනය (මි.මී.)



පොල් වගාව තුළ සුදු මැස්සාගේ ශීඝ්‍ර ව්‍යාප්තිය

වගා සංරක්ෂණ අංශය

2019 වර්ෂයේ සිට, ප්‍රධාන වශයෙන් තෙත් කලාපයේ වාර්තා වූ නව සුදු මැස්සාගේ ව්‍යාප්තිය 2021 වසරේදී ද තවදුරටත් සිදු වූ අතර විශේෂයෙන්ම කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වල ප්‍රදේශ රැසක උග්‍ර ආසාදන වාර්තා වන්නට විය. සුදු මැස්සන්ගේ ගහනය අධික වූ විට ඔවුන් පොල් ගෙඩි සහ පොල් බිඩිංග පවා ආසාදනය කරන ලද අතර කෙසෙල්, කරපිංචා, ඉන්දියානු ආමන්ඩ්, පුවක්, විසිතුරු තල්, මිරිස්, බටු වැනි අනෙකුත් වාර්ෂික හා බහු වාර්ෂික බෝග මත ද ඔවුන් නිරීක්ෂණය වන්නට විය. මේ හේතුවෙන් සුදු මැස්සන් විශේෂ හා ඒ ආශ්‍රිත කෘමි විශේෂ හඳුනා ගැනීම සඳහා කෑගල්ල, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්ක වල සමීක්ෂණයක් පවත්වන ලදී.

එහිදී *Aleurodicus disperses, Paraleyrodes minei* සහ *Aleurotrachelus atratus* යන සුදු මැස්සන් විශේෂ 3 හඳුනාගන්නා ලද අතර මුළු ගහණයෙන් 55.7% ක් *A. atratus* යන විශේෂය වාර්තා විය. තවද, *Jauravia pallidula* යන විශේෂය *A. atratus* හි ස්වාභාවික සතුරෙකු ලෙස හඳුනාගත් නමුත් *J. pallidula* ගේ ගහනය සුලභ නොවීය. මීට අමතරව සුදු මැස්සන් ආශ්‍රිත කෘමි විශේෂ ලෙස *Panonychus ulmi* (යුරෝපියානු රතු මයිටාවා), *Brevipalpus californicus* (ස්කාලට් මයිටාවා) හා පිටි මකුණන් යන විශේෂ හඳුනා ගත්තද ඔවුන්ගේ බහුලතාවය ද ඉතා අල්ප විය. පොදුවේ ගත් කළ සුදු මැස්සාගේ සුලභතාවය දිස්ත්‍රික් අතර සැලකිය යුතු තරම් වෙනස්කමක් නොපෙන්නුවත් විශේෂ වල සුලභතාවය දිස්ත්‍රික් අතර මෙන්ම ස්ථාන අතර පොල් ගස් අතර ද සැලකිය යුතු ලෙස වෙනස් විය.

තවද කොළ පැහැති පොල් ගෙඩි වලට සාපේක්ෂව දුඹුරු පැහැ සහ කහ පැහැ ගෙඩි සහිත පොල් ගස්වල මෙන්ම තැඹිලි ගස් වලද සුදු මැස්සාගේ ආසාදනය උග්‍ර ලෙස ව්‍යාප්ත වී ඇති බව නිරීක්ෂණය විය.



රූපය - 01 කොළඹ මුත්වාල් ප්‍රදේශයේ සුදු මැස්සාගේ දැඩි හානියට පාත්‍රවූ පොල් වගාවක ගෙඩි සහ අතු

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය (WCLWD) සහ කොළ කරවීමේ ආබාධය (LSD) හා සම්බන්ධ විශේෂ පෝෂණ අවශ්‍යතා සහිත කෘත්‍රිම මාධ්‍යවල වගා කළ නොහැකි ප්‍රෝකැරියෝටාවන් අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් මගින් හඳුනා ගැනීම

වගා සංරක්ෂණ අංශය

අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් මගින් වැලිගම පොල්කොළ මැලවීමේ රෝගය (WCLWD) සහ කොළ කරවීමේ ආබාධය (LSD) හා සම්බන්ධ ප්‍රෝකැරියෝටාවන් හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එහිදී ශෛලම හා ෆ්ලෝයම පටක වලට සීමා වූ විශේෂ පෝෂණ අවශ්‍යතා සහිත කෘත්‍රිම මාධ්‍ය තුළ වගා කළ නොහැකි ප්‍රෝකැරියෝටාවන් (*Fastidious prokaryotes*) සිටින බව තහවුරු කර ගැනීම සඳහා PCR පරීක්ෂණ සිදු කරන ලද අතර එයට WCLWD ආසාදිත, LSD ආසාදිත, නිරෝගී ලෙස පෙනෙන හා නිරෝගී පොල් ගස් වලින් වාර හතරකදී මුළු නියැදි 372 ක් ලබා ගන්නා ලදී. මෙහිදී ධනාත්මක ප්‍රතිඵල ලැබුණු පැහැදිලි DNA පටි Sanger sequencing ක්‍රමවේදයට ලක්කර ප්‍රතිඵල GenBank දත්ත ගොනුවේ දත්ත හා සසඳා බලන ලදී. එහිදී සියලුම අනුක්‍රමණ උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා සමග 99 -100% ක් ගැලපුණි. NCBI හි BLASTn පරීක්ෂාවට අනුව මෙවැනි ෆයිටොප්ලාස්මා ප්‍රභේද 7 ක් හඳුනාගත හැකි වූ අතර ඒවා GenBank හි තැන්පත් කරන ලදී. ෆයිටොප්ලාස්මා හැර අනිකුත් කිසිදු විශේෂ පෝෂණ අවශ්‍යතා සහිත කෘත්‍රිම මාධ්‍ය වල වගා කළ නොහැකි ප්‍රෝකැරියෝටාවන් මේ දක්වා PCR පරීක්ෂාවේදී ධනාත්මක ප්‍රතිඵල ලබා දී නොමැත.

වගුව 1: වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයට හේතු වන නව ෆයිටොප්ලාස්මා ප්‍රභේද

නියැදි අංකය	BLASTn පරීක්ෂාව සමග හොඳින්ම ගැලපෙන ව්‍යාධිජනකයා	සමානතා ප්‍රතිශතය	Accession අංකය
වැලිගම ප්‍රභේදය 1	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	100	MZ822450
වැලිගම ප්‍රභේදය 2	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	99.88	MZ822449
වැලිගම ප්‍රභේදය 3	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	100	MZ822431
වැලිගම ප්‍රභේදය 4	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	98.83	MZ822432
වැලිගම ප්‍රභේදය 5	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	99.65	MZ822428
වැලිගම ප්‍රභේදය 6	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	99.77	MZ822430
වැලිගම ප්‍රභේදය 7	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	99.64	MZ822429

අණුක ජීව විද්‍යාත්මක ක්‍රම මගින් වැලිගම පොල්කොළ මැලවීමේ රෝගය (WCLWD) **ආසාදිත ප්‍රදේශ වල ඇති කොළ කරවීමේ ආබාධය** (LSD) **හා ෆයිටොප්ලාස්මාවන් අතර සම්බන්ධය හඳුනාගැනීම**

වගා සංරක්ෂණ අංශය

වැලිගම ප්‍රදේශයේ LSD ආසාදිත පොල් ශාකවල කොළ, පුෂ්ප මංජරී සහ මුල් වලින් ලබා ගන්නා ලද නියැදි වලින් වැඩි දියුණු කළ CTAB ක්‍රමය භාවිතයෙන් සම්පූර්ණ ජාන කිටුවේ DNA නිස්සාරණය කරන ලද අතර ඒවා ෆයිටොප්ලාස්මාවන්ගේ 16S r RNA ජානය ඉලක්ක කළ විශේෂ Universal primers යොදාගෙන nested PCR පරීක්ෂාවට ලක් කරන ලදී. පරීක්ෂාවට ලක් කරන ලද නියැදි වලින් 83%, 08% සහ 25% බැගින් පිළිවෙලින් ළපටි පොල් කොළ, පුෂ්ප මංජරිය සහ මුල් යන නියදි වලින් ධනාත්මක ප්‍රතිඵල ලැබුණි. මින් තෝරාගන්නා ලද PCR නිෂ්පාදන Sanger sequencing ක්‍රමවේදයට බඳුන් කරන ලද අතර BLASTn ප්‍රතිඵල GenBank දත්ත හා සසඳා බැලීමේදී ඒවා උක් පත්‍ර සුදු වීමේ රෝගය හෝ Sugarcane Grassy Shoot Disease හා සම්බන්ධ ෆයිටොප්ලාස්මා සමග 99-100% ක් ම ගැළපෙන බව තහවුරු කරන ලදී. තව ද ෆයිටොප්ලාස්මා මගින් ආසාදනය වූ LSD පොල් ගස් වැලිගම පොල් කොළ මැලවීමේ රෝග ලක්ෂණ නොපෙන්වන බව ද සොයා ගන්නා ලදී. නමුත් WCLWD රෝග රහිත ප්‍රදේශ වලින් ලබාගත් LSD ආසාදිත පටක නියැදි PCR පරීක්ෂණය සඳහා ධනාත්මක ප්‍රතිචාර දක්වන බව තවමත් නිරීක්ෂණය නොවුණි. එම නිසා LSD හි රෝගකාරකය ෆයිටොප්ලාස්මා බව ඔප්පු කිරීමට තරම් පැහැදිලි සාක්ෂි හමු වූයේ නැත. එබැවින් ඊට හේතුව දකුණු ප්‍රදේශයේ LSD ආසාදිත පොල් ගස්වලට ෆයිටොප්ලාස්මා ද්විතීකව ආසාදනය වීම විය හැකිය. කෙසේ වෙතත් LSD හි හේතුකාරකය පරීක්ෂා කිරීමට නම් WCLWD රෝගය රහිත ප්‍රදේශවලින් ගත් නියැදි තව දුරටත් පරීක්ෂා කළ යුතුව ඇත.

වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය (WCLWD) **සම්බන්ධ ෆයිටොප්ලාස්මා අණුක ජීව විද්‍යාත්මකව හඳුනා ගැනීම සඳහා හොඳම පටක නියැදි තෝරා ගැනීම**

වගා සංරක්ෂණ අංශය

අනෙකුත් බොහෝ ක්ෂේත්‍ර භෝග මෙන් නොව පොල් ශාකයේ උස සහ රෝගකාරකයේ සාන්ද්‍රණය අඩු බව නිසා අණුක ජීව විද්‍යාත්මකව ෆයිටොප්ලාස්මා හඳුනා ගැනීම අභියෝගාත්මක විය හැක. එබැවින් රෝග කාරකය නිවැරැදිව හඳුනා ගැනීම සඳහා සුදුසු පටකයක් හඳුනාගැනීම අත්‍යවශ්‍ය වේ. එම නිසා මෙම අධ්‍යයනය පොල් ශාකයේ පටක තුළ රෝගකාරකයාගේ ව්‍යාප්තිය තීරණය කිරීම සහ ගහන මට්ටම පරීක්ෂා කිරීම සඳහා හොඳම නියැදි පටක වර්ගය හඳුනාගැනීම සඳහා සිදු කරන ලදී. රෝග ලක්ෂණ සහිත මෙන්ම නීරෝගී ලෙස පෙනෙන, රෝග ලක්ෂණ රහිත පොල් ශාක වල ද (වගුව 2) ෆයිටොප්ලාස්මා අණුක ජීව විද්‍යාත්මකව හඳුනා ගැනීම සඳහා හොඳම නියැදි පටකය ළපටි පත්‍රය බව සොයා ගන්නා ලදී.

වගුව 2 - WCLWD ඇතිකරන ෆයිටොප්ලාස්මා සඳහා විවිධ පොල් ශාක පටක , PCR පරීක්ෂණයේදී දක්වන ලද ධනාත්මක ප්‍රතිශතයන්

නියැදි වර්ගය	**පටක වර්ගය**	**නියැදිය ගණන**	**ධනාත්මක ප්‍රතිඵල ලැබුණු සාම්පල ගණන**	**ධනාත්මක PCR ප්‍රතිශතය**
WCLWD රෝග ලක්ෂණ පෙන්වන පොල් ගස්	ගොක් කොළ	18	15	83%
	ළපටි පුෂ්ප මංජරිය	18	6	33%
	මුල	18	6	33%
වැලිගම ප්‍රදේශයේ තිබෙන WCLWD රෝග ලක්ෂණ නොපෙන්වන පොල් ගස්	ගොක් කොළ	18	16	88%
	ළපටි පුෂ්ප මංජරිය	18	2	11%
	මුල	18	4	22%
වැලිගම ප්‍රදේශයේ LSD රෝග ලක්ෂණ පෙන්වන පොල් ගස්.	ගොක් කොළ	18	16	88%
	ළපටි පුෂ්ප මංජරිය	18	1	05%
	මුල	18	7	38%

වැලිගම පොල් කොළ මැලවීමේ රෝග කාරක ෆයිටොප්ලාස්මා සහ සංස්ථානික ආසාදනයට අදාළව ප්ලෝයම පටක හරහා පරිවහනය වන බවට සාක්ෂි අධ්‍යයනය කිරීම

වගා සංරක්ෂණ අංශය

ෆයිටොප්ලාස්මා ප්ලෝයම පටක මගින් ප්ලෝයම නළ තුළින් පරිවහනය වන බවත් සමහර පටක මත තැන්පත් වන බවත් පර්යේෂණ තොරතුරු වල සඳහන් වන කරුණකි. සියලුම ෆයිටොප්ලාස්මා රෝග වාහකයන්ගෙන් ව්‍යාප්ත වන නිසා ප්‍රාථමික ආසාදිත ස්ථාන නොමේරූ ශාක පත්‍ර වේ. මෙම අධ්‍යයනය සිදු කරණු ලැබුවේ වැලිගම කොළ මැලවීමේ රෝගය (WCLWD) ආසාදිත ශාක තුළ ෆයිටොප්ලාස්මා පරිවහනය වන්නේ දැයි සොයා බැලීමට සහ රෝගයේ සංස්ථානික ස්වභාවය අධ්‍යයනය කිරීම සඳහා ය.

පුෂ්ප මංජරි සහ මුල් යන පටකවල DNA sequencing සිදුකර ෆයිටොප්ලාස්මා සිටින බව තහවුරු කර ගන්නා ලදී. සියලුම ප්ලාස්මාවන් රෝග වාහකයන් හරහා ව්‍යාප්ත වන නිසා සහ ඔවුන් පත්‍රවල ප්ලෝයම පටකය තුළ පෝෂණය වීම සිදුකරන නිසා, ප්ලෝයමීය පරිවහනය සිදු නොවේ නම් පොල් ශාකයේ පත්‍ර වලට අමතරව කිසිදු පටකයක නිරීක්ෂණය නොවිය යුතුය. නමුත් අධ්‍යයන වාර්තා වලට අනුව මෙම ෆයිටොප්ලාස්මා පත්‍රවලින් දුරස්ථ පටක වන පුෂ්ප මංජරි හා මුල් වැනි පටක වල පවා නිරීක්ෂණය විය.

පොල් ශාකයේ පත්‍ර වල සහ පොල් ශාකයේ අනිකුත් පටක වල පෙනේර නළ එකිනෙකට ජාලයක් සේ සම්බන්ධ නිසා WCLWD රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා, පෙනේර නළ හරහා පරිවහනය වන බව සනාථ කිරීමට මෙම ප්‍රතිඵල ඉතා හොඳ සාක්ෂියක් වේ.

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය (WCLWD) ආසාදනය වීමෙන් පසු එම ශාක බාහිර රෝග ලක්ෂණ පෙන්වීමට ගතවන කාලය අධ්‍යයනය කිරීම

වගා සංරක්ෂණ අංශය

සියලුම වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය ආසාදිත පොල් ගස් එකවරම රෝග ලක්ෂණ නොපෙන්වන අතර මීට හේතුව රෝගය ආසාදිත ශාකවලට රෝග ලක්ෂණ පෙන්වීමට පෙර බීජෝෂණ කාලයක් තිබීම විය හැක. බීජෝෂණ කාලය යන්නෙන් අදහස් කරන්නේ පොල් ශාකයට වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය ආසාදනය වූ පසු රෝග ලක්ෂණ පෙන්වීමට ගතවන කාලයයි. මෙම සංසිද්ධිය, ක්ෂේත්‍ර වැඩසටහන්වලදී වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය ආසාදිත ශාක හඳුනා ගැනීමේදී සැලකිය යුතු තරමේ ගැටළුවක් වී ඇත. මෙම බීජෝෂණ කාලය නිසා ශාක බාහිරව නිරීක්ෂණය කිරීමෙන් රෝගය හඳුනා ගත නොහැකි වන අතර මේ නිසාම නිරෝගී ලෙස පෙනෙන පොල් ගස් අතරද සැඟවුණු ආසාදන පැවතිය හැක. එම නිසා ශ්‍රී ලංකාවේ WCLWD රෝගය හා බැඳුණු බීජෝෂණ කාලයක් තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් අධ්‍යයනයක් සිදු කරන ලදී.

වගුව 3: නියැදි වට දෙකකදී ෆයිටොප්ලාස්මා සඳහා PCR ධනාත්මක හෝ සෘණාත්මක වීම සහ WCLWD රෝග ලක්ෂණ පෙන්වීම

පොල් ගස් අංකය	PCR ධනාත්මක හෝ සෘණාත්මක වීම සහ WCLWD රෝග ලක්ෂණ පෙන්වීම							
	1 st PCR			බාහිරව නිරීක්ෂණය කළ හැකි රෝග ලක්ෂණ	2 nd PCR (වසරකට පසු)			බාහිරව නිරීක්ෂණය කළ හැකි රෝග ලක්ෂණ
	ගොක් කොළ	ළපටි පුෂ්ප මංජරිය	මූල		ගොක් කොළ	ළපටි පුෂ්ප මංජරිය	මූල	
1	P	N	N	කිසිවක් නැත	P	N	N	කිසිවක් නැත
2	P	N	N	කිසිවක් නැත	P	P	N	කිසිවක් නැත
3	P	N	N	කිසිවක් නැත	P	N	N	කිසිවක් නැත
4	P	N	N	කිසිවක් නැත	P	P	N	කිසිවක් නැත
5	P	N	N	කිසිවක් නැත	P	N	P	කිසිවක් නැත

P - ධන N - සෘණ

3 වගුවේ ප්‍රතිඵලවලට අනුව නීරෝගි ලෙස දිස්වන WCLWD ආසාදිත නමුත් එම ලක්ෂණ නොපෙන්වන පොල් ශාක දිගු කාලයක් තිස්සේ ෆයිටොප්ලාස්මා ආසාදනය දරා සිටින බව පැහැදිලි විය. මෙම කාලය තුළ පොල් ශාක 2 ක පොල් මලටද, එක් පොල් ශාකයක මුල් වලටද ආසාදනය පැතිරී ඇති බව නිරීක්ෂණය විය. මේ සියලු ශාක වර්ෂයක් පුරා රෝග ලක්ෂණ රහිතව

පැවත ඇත. එහිදී ද පළමු ආසාදිත දිනය නිශ්චිතවම කිව නොහැකි බැවින් මෙම කාලය ඊටත් වඩා දිගු විය හැක. එම නිසා WCLWD ට වර්ෂයක හෝ ඊට අධික බීජෝෂණ කාලයක් තිබෙන බව ප්‍රතිඵල නිරීක්ෂණය කිරීමේදී සනාථ විය. තවදුරටත් මේ හා සම්බන්ධව පරීක්ෂණ සිදු කරමින් පවතී.

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය (WCLWD) සහ කොළ කරවීමේ ආබාධය (LSD) යන රෝග කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිරෝධ උත්ප්‍රේරක රසායන ද්‍රව්‍ය (Systemic Acquired Resistance Inducers) **භාවිතා කිරීම**

වගා සංරක්ෂණ අංශය

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය සහ කොළ කරවීමේ ආබාධය යන රෝග සඳහා Systemic Acquired Resistance (SAR) Inducers ඇති වල බලපෑම හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ සිදු කරන ලදී. එහිදී SAR inducers වාර හතරක් යෙදීම සහ රෝග තීව්‍රතා දර්ශක (Disease Severity Index) සටහන් කිරීම අවසන් කර ඇත. වැලිගම රෝගය ආසාදිත ශාක වලින් පාලක නියදි ලෙස හා ප්‍රතිකාර කිරීමට ශාක නියදි තෝරාගත් අතර එහිදී රෝග තීව්‍රතා දර්ශකයේ සුළු අඩුවීමක් ප්‍රතිකාර කළ ශාක නියැදියේ නිරීක්ෂණය කරන ලදී. මේ පිළිබඳ පර්යේෂණ කටයුතු තවදුරටත් සිදු කරමින් කරමින් පවතී.



පොල් සැකසුම් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම

අති නැවුම් පොල්තෙල් නිෂ්පාදනය සඳහා පොල් කිරි පැසවීම වේගවත් කිරීම සඳහා සුදුසු ක්ෂුද්‍ර ජීවීන් හුදකලා කිරීම

පොල් සැකසුම් පර්යේෂණ අංශය

අති නැවුම් පොල් තෙල් යනු පොල් කිරි භාවිතයෙන් තාපය යෙදීමකින් තොරව නිෂ්පාදනය කරන පොල් තෙල්ය. මෙම ක්‍රියාවලියේදී පොල් කිරිවල තෙල් ස්වාභාවිකව වෙන්වීමට ඉඩ සලසයි. ඒ සඳහා පැය 24-48 ක් ගතවේ. මෙම ක්‍රමය අති නැවුම් පොල් තෙල් නිෂ්පාදනයේ ස්වාභාවික පැසවීමේ ක්‍රමය ලෙස හැඳින්වේ. මෙම පර්යේෂණයේ පරමාර්ථය වන්නේ මෙම ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ඵලදායී ක්ෂුද්‍ර ජීවීන් සොයා ගැනීමයි. ස්වාභාවිකව පැසුණු පොල් කිරිවලින් විවිධ ක්ෂුද්‍ර ජීවීන් වර්ග 8 ක් පේව රසායනික පරීක්ෂණ මගින් හඳුනා ගන්නා ලදී. එම ක්ෂුද්‍ර ජීවීන් පහත දැක්වේ.

A - *Eubacterium* (ඉයුබැක්ටීරියම්)
B - *Flavobacterum* (ෆ්ලේවොබැක්ටීරියම්)
C - *Lactobacillus* (ලැක්ටොබැසිලස්)
D - *Lactobacillus* (ලැක්ටොබැසිලස්)
E - *Erysipelothrix* (ඉරිසිපෙලෝත්‍රික්ස්)
F - *Eubacterim* (ඉයුබැක්ටීරියම්)
G - *Acinetobacter* (ඇසිනෙටෝබැක්ටර්)
H - *Erysipelothrix* (එරිසිපෙලෝත්‍රික්ස්)

හුදකලා කරනු ලැබූ ක්ෂුද්‍ර ජීවීන්, පැසවීමේ ක්‍රියාවලිය සඳහා වඩාත් ඵලදායී ක්ෂුද්‍ර ජීවීන් හඳුනා ගැනීමට තනි තනිව සහ සංයෝජන ලෙස ස්වාභාවික පැසවීමේ ක්‍රියාවලිය සඳහා භාවිතා කරන ලදී. අවසාන වශයෙන්, අවම කාල සීමාව තුළ උපරිම තෙල් අස්වැන්නක් නිපදවන ක්ෂුද්‍ර ජීවීන් තෝරා ගැනීම සඳහා අති නැවුම් පොල් තෙල් ප්‍රමාණය පැය 24 කින් මනින ලදී. (*Lactobacillus*) ලැක්ටොබැසිලස් වර්ගයේ ක්ෂුද්‍ර ජීවීන් භාවිතයෙන් වැඩිම තෙල් ප්‍රමාණය වාර්තා විය. අත්හදා බැලීම සිදුවෙමින් පවතී.

පොල් බටර් නිෂ්පාදනයේ තාක්ෂණය දියුණු කිරීම

පොල් සැකසුම් පර්යේෂණ අංශය

විජලනය කළ පොල්, සීනි, රටකජු, කොකෝවා කුඩු සහ ලුණු භාවිතයෙන් කලින් සකසන ලද පොල් බටර් තවදුරටත් වැඩිදියුණු කිරීමක් ලෙස පොල් වල අද්විතීය රසය සහිත පොල් බටර් නිෂ්පාදනය කරන ලදී.

අර්ධ පුහුණු විනිශ්චයකරුවන් සහභාගි කර ගත් සංවේදී විශ්ලේෂණයක් මගින් DC 65%, සීනි 25% සහ ලුණු 0.5% යන සංයෝජනය හොඳම ප්‍රතිකාරය ලෙස තෝරා ගන්නා ලදී. නිෂ්පාදන කාමර උෂ්ණත්වයේ ගබඩා කර ඇති විට ස්ථර වෙන් කිරීම විශාල ගැටළුවක් විය. ස්ථර වෙන්

කිරීම අවම කිරීම සඳහා palm stearin සහ soya lecithin විවිධ මට්ටම් තුනක් ඇතුළත් කරන ලදී. පොල් බටර් ස්ථර වෙන්වීම අවම කිරීම සඳහා හොඳම ඉමල්සිෆයර් ලෙස පාම් ස්ටියරික් 1.5% සහ ඉරිඟු පිෂ්ඨයෙන් සියයට දහයක් ලෙස එක් කර වැඩි දියුණු කිරීම් කරන ලදී. අත්හදා බැලීම සිදු වෙමින් පවතී.





රූපය 1 පොල් බටර් ඇතිරුම

පොල් ප්‍රෝටීන් වලින් ජෙව භායනයට ලක් වන ඇසුරුම් නිෂ්පාදනය

පොල් සැකසුම් පර්යේෂණ අංශය

වර්ජින් පොල්තෙල් නිස්සාරණයෙන් ලබාගත් මේද රහිත විජලිත පොල් අතුරු ඵලයෙන් සාන්ද්‍රිත පොල් ප්‍රෝටීන් යොදා ගනිමින් ජෙව භායනයට ලක්විය හැකි ඇසුරුම් පටල සකස් කිරීමේ අධ්‍යයනයන් අඛණ්ඩව සිදු කරන ලදී. pH අගය ප්‍රශස්ත කිරීම සහ ඉරිඟු පිෂ්ඨය, පොල් ප්‍රෝටීන් සහ Poly Ethylene Glycol (PEG) සාන්ද්‍රණය සාධක සැලසුමකට අනුව අධ්‍යයනය සිදු කරන ලදී. අධ්‍යයනයේ නිගමනය වූයේ, PEG (2% ග්ලිසරෝල් පමණක්) එකතු කිරීමකින් තොරව 3% පොල් ප්‍රෝටීන් භාවිතයෙන් සහ pH 8.5 හි සකස් කරන ලද පටලය ඉහළ සමස්ත පිළිගත හැකි ගුණාංග ප්‍රදර්ශනය කරන බවයි.

ප්‍රති-ක්ෂුද්‍ර ජීවී ගුණ සහිත පටල වල අගය වැඩි දියුණු කිරීම සඳහා කුරුඳු කුඩු මට්ටම් දෙකක් (0% - P1, 0.05% - P2 සහ 0.1% - P3) සමඟ විදුරු තහඩු භාවිතයෙන් ප්‍රමාණ යෙන් වැඩි පටල නිපදවන ලදී. නියැදියේ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය විසරණ ක්‍රමය මගින් මනිනු ලැබූ අතර කුරුඳු මට්ටම ඉහළ යාමත් සමඟ ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වයේ වර්ධනය අඩු වී ඇති බව නිරීක්ෂණය වී ඇත.

කුරුඳු කුඩු සමඟ අගය එකතු කිරීමත් සමඟ පටල ඝනකම සැලකිය යුතු ලෙස වැඩි විය. කුරුඳු 0.1% ක් ඇතුළත් කිරීමත් සමඟ මිලිමීටර් 0.3 ක සැලකිය යුතු වැඩි ඝනකමක් ඇති විය. 193.65% ක ඉහළ ඉදිමුමේ දර්ශකය 0.05% කුරුඳු එක් කළ සාම්පලයේ තිබිණි.

ඇසුරුම් ද්‍රව්‍ය තවදුරටත් විශ්ලේෂණය කිරීම සහ යෙදීම සිදු වෙමින් පවතී.



P1 - කුරුඳු - 0%



P2 - කුරුඳු - **0.0**5%



P3 - කුරුඳු - **0.1**%



P4 – පාලකය / තුනී ඔතනය සහිත

රූපය 2 - විවිධ කුරුඳු සාන්ද්‍රණ සමඟ ඇසුරුම් ද්‍රව්‍යයේ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය

සාම්ප්‍රදායික ක්‍රමයට එකතු කරන ලද පොල් මීරා වලින් සාදන ලද පොල්, හකුරු වල ග්ලයිසිමික් දර්ශකය

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පොල් හකුරු වල ග්ලයිසමික් දර්ශකය සොයා ගැනීම සඳහා මිනිස් විෂයයන් 40 ක් යොදා ගනිමින් සායනික අධ්‍යයනයක් නිම කරන ලදී. සාම්ප්‍රදායික ක්‍රමයෙන් හල් පොතු සමඟ එකතු කරන ලද මීරා වලින් සකස් කරන ලද හකුරු වල ග්ලූකෝස් ප්‍රතිචාරය සහ ග්ලයිසමික් දර්ශකය (GI) සහ නව මීරා එකතු කිරීම ක්‍රමයෙන් ලබා ගත් අගය එකතු කළ පිරිසිදු මීරා වලින් සකස් කරන ලද 0.2% කුරුඳු හකුරු (CIN හකුරු) සහ 0.05% සාදික්කා හකුරු (NUT හකුරු) සමඟ ඇගයීමට ලක් විය. හකුරු වර්ග තුනක් මධ්‍යම ග්ලයිසමික් දර්ශක කාණ්ඩයට අයත් වේ (වගුව 1). හල් පොතු නොමැතිව පිරිසිදු යුෂ වලින් සාදන ලද හකුරු වල GI අගය 65.19 ක් වූ අතර උක් වලින් නිපදවන සීනි වල GI අගය 60.76 කි. හල්පොතු, සාදික්කා සහ කුරුඳු හඳුන්වා දීමෙන් මධ්‍යන්‍ය GT අගයන් පිළිවෙලින් 55.79, 57.56 සහ 59.45 විය. පොල් හකුරුවලට හල් පොතු, සාදික්කා සහ කුරුඳු ඇතුළත් කිරීමෙන් GI අඩු කළ හැකි බව ප්‍රතිඵල වලින් පෙනී ගියේය.

වගුව 1 - අගය එක්කළ පොල් හකුරු වර්ග වල ග්ලයිසිමික් අගය

හකුරු වර්ග	ග්ලයිසිමික් අගය	ග්ලයිසිමික් කාණ්ඩය
හල් හකුරු	55.79	මධ්‍යම ග්ලයිසිමික් අගය
සාදික්කා හකුරු	57.56	මධ්‍යම ග්ලයිසිමික් අගය
කුරුඳු හකුරු	59.45	මධ්‍යම ග්ලයිසිමික් අගය

මේදය නැති ටෙස්ටා පිටි එකතු කරන ලද රොටී සහ පිට්ටු නිපදවීමේ තාක්ෂණය දියුණු කිරීම

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පොල් සැකසුම් කම්හල්වල අතුරු නිෂ්පාදනයක් වන ටෙස්ටා පිටි කුරුටු රොටී සහ පිට්ටු සැකසීම සඳහා සාර්ථක ලෙස භාවිතා කරන ලදී. රොටී සෑදීමේදී අගය එකතු කිරීම සඳහා හොඳම අනුපාතය ලෙස 20% ක් මේදය ඉවත් කළ ටෙස්ටා පිටි (TF), පොල් මද ග්‍රෑම් 60 ක්, වතුර මිලි ලීටර් 30 ක් සහ ලුණු ග්‍රෑම් 3.5 ක්, තිරිඟු පිටි (WF) 80% ඇතුළත් කිරීම තෝරා ගන්නා ලදී. පිට්ටු සඳහා 20% ක් මේදය ඉවත් කළ ටෙස්ටා පිටි (TF), පොල් මද ග්‍රෑම් 60 ක්, ජලය මිලි ලීටර් 15 ක් සහ ලුණු ග්‍රෑම් 2 ක් සහ තිරිඟු පිටි (WF) 80% හොඳම අනුපාතය විය. රොටී සහ පිට්ටු සකස් කිරීම සඳහා භාවිතා කරන සංයෝගයේ සහ තිරිඟු පිටිවල ගුණ සංසන්දනය කරන ලදී.

ප්‍රතිඵලවලට අනුව ඉදිමුම් ධාරිතාව (SC), තොග ඝනත්වය (BD), තට්ටු ඝණත්වය (TD) සඳහා 100% තිරිඟු පිටි (WF) සමඟ තෝරාගත් පිටි මිශ්‍රණ (20% TF: 80% WF) අතර සැලකිය යුතු වෙනසක් (P>0.05) නොතිබුණි. තට්ටු ඝනත්වය (TD) සහ ජල අවශෝෂණ ධාරිතාව (WAC). තෙල් අවශෝෂණ ධාරිතාව (OAC) සහ තෙත්බව (WT) හි ක්‍රියාකාරී ගුණාංග මිශ්‍ර කිරීමේ ක්‍රියාවලිය සමඟ සැලකිය යුතු ලෙස වෙනස් විය (P<0.05). (TF) මේදය ඉවත් කළ ටෙස්ටා පිටි එක් කිරීම තෙත් කිරීම සඳහා විකර්ෂක ක්‍රියාවක් පෙන්නුම් කරමින් තෙල් අවශෝෂණ ධාරිතාව වැඩි දියුණු කරයි.

වගුව - 2. 100% තිරිඟු පිටි හා 20% කුරුටු පිටි : 80% තිරිඟු පිටි මිශ්‍රණය ආශ්‍රිත ක්‍රියාකාරී ලක්ෂණ

ලක්ෂණය	20% කුරුටු පිටි 80% තිරිඟු පිටි මිශ්‍රණය	WF 100%
SC (%)	15.67 ± 1.53a	16.33 ± 1.53a
BD (g/cc)	0.57 ± 0.01a	0.52 ± 0.03a
TD (g/cc)	0.77 ± 0.04a	0.78 ± 0.02a
OAC (%)	138.03 ± 4.75a	116.46 ± 6.98b
WAC (%)	154.60 ± 9.31a	134.24 ± 8.33a
WT (min)	0.34 ± 0.01a	1.38 ± 0.08b

අගයන් ස්වාධීන නිර්ණය තුනක මධ්‍යන්‍ය ± SD පේළියක ඇති විවිධ උඩුකුරු සහිත අගයන් සැලකිය යුතු ලෙස වෙනස් වේ. (P<0.05).

සාම්පලවල පෝෂණ විශ්ලේෂණය තවදුරටත් සිදු වෙමින් පවතී.

පොල් ටෙස්ටා පිටි වල ෆීනොලික් සහ ෆ්ලේවනොයිඩ් සංඝටක

පොල් සැකසුම් ප්‍රර්යේෂණ අංශය සහ මූලික අධ්‍යයන ආයතනය

පොල් ටෙස්ටා යනු පොල් මදයේ දුඹුරු පැහැති තුනී පිටත ආවරණයයි. පොල් කර්මාන්තයේ ඌන උපයෝජනයක් වන එය බොහෝ විට සත්ත්ව ආහාර ලෙස භාවිතා වේ. කෙසේ වෙතත්, එයට ආහාර සැකසුම් කර්මාන්තයේ ක්‍රියාකාරී අමුද්‍රව්‍යයක් ලෙස භාවිතයට විශාල විභවයක් ඇත.

මෙම අධ්‍යයනයේ සමස්ත සොයා ගැනීම් වලට අනුව, සියලුම දේශීය පොල් වගාවන්හි පොල් ටෙස්ටා පිටි (CTF) ෆීනෝලික් සහ ෆ්ලේවනොයිඩ් වලින් පොහොසත් අතර, ඒවාට විභව ප්‍රතිඔක්සිකාරක සහ ප්‍රති-හයිපර්ග්ලයිසමික් කාරක ලෙස ක්‍රියා කිරීමේ විභවයක් තිබුණි. ප්‍රභේද අතර ෆයිටෝ රසායනික ද්‍රව්‍ය ව්‍යාප්තියේ වෙනස්කම් වගුව 3 හි දක්වා ඇත.

වගුව 3 - පොල් ප්‍රභේද අතර ෆයිටෝ රසායනික ද්‍රව්‍ය ව්‍යාප්තියේ වෙනස්කම් CTF

ෆීනෝලික් (mg|100g)	පොල් ප්‍රභේද				
	COM	GT	RT	SR	TT
කැෆේයික් අම්ලය	1.50	1.60	1.34	1.40	1.51
ක්ලෝපෙනික් අම්ලය	49.50	145.5	76.9	131.8	114.9
ගැලික් අම්ලය	2.13	2.16	2.13	2.14	n.d.
ඵලාජික් අම්ලය	11.65	11.49	11.50	11.51	11.5
ෆෙරුලික් අම්ලය	0.28	n.d.	0.29	0.31	n.d.
පැරා කුමරික් අම්ලය	0.49	0.62	0.49	0.73	0.73
සිනපික් අම්ලය	n.d.	n.d.	n.d.	n.d.	1.61
වැනිලික් අම්ලය	7.86	7.72	6.36	6.78	7.12
එපිගලොකැටකින් ගැලේට්	2.73	3.28	3.00	3.26	3.09
කුවෙසිටින්	6.32	6.33	6.34	6.37	6.35
රුටින්	1.92	1.45	1.50	1.52	1.57

කෙටි යෙදුම්: COM-වාණිජ දෙමුහුන්, GT-ගොන් තැඹිලි, RT-රන් තැඹිලි, SR-සැන් රාමන්, TT-උස x උස, nd-නිර්ක්ෂණ වී නැත.

අනාවරණය කරගත් සංයෝග අතර, ක්ලෝරොජනික් යනු සියලුම ප්‍රභේදවල CTF හි අඩංගු වඩාත් ප්‍රමුඛතම ෆීනෝලික් අම්ලයයි. ඵලාජික් අම්ලය දෙවන වඩාත් බහුල ෆීනෝලික් සංඝටකය වන අතර පසුව වැනිලික් අම්ලය විය. වැනිලික් අම්ලයෙන් පසු CTF හි ඇති ඊළඟ බහුල ෆීනොලික් වන්නේ ගැලික් සහ කැෆේයික් අම්ලය. පැරා කුමරික් අම්ලය, වැනිලික් අම්ලය , එපිගලොකැටකින් ගැලේට් (epigallocatechin gallate) (EGCG), කුවෙසිටින් (quercetin) සහ රුටින් (rutin) සියලුම ප්‍රභේදවල අඩංගු අනෙකුත් සංඝටක වේ.

මෘදු සිට මධ්‍යස්ථ ඇල්සයිමර් රෝගයට ප්‍රතිකාර කිරීම සඳහා VCO හි බලපෑම

පොල් සැකසුම් පර්යේෂණ අංශය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය

මෘදු හා මධ්‍යස්ථ ඇල්සයිමර් රෝගීන්ගේ මතකය සහ සංජානනය කෙරෙහි වර්ජින් පොල්තෙල් වල බලපෑම විමර්ශනය කිරීම සඳහා සිදු කරන ලද අධ්‍යයනය අවසන් විය. මෙම අධ්‍යයනයට අහඹු ලෙස ප්‍රතිකාර සඳහා (30ml වර්ජින් පොල්තෙල් සමඟ පෝෂණය කිරීම) සහ පාලන කණ්ඩායම (30ml කැනෝලා තෙල්/දිනකට පෝෂණය කිරීම) සඳහා අහඹු ලෙස වෙන් කරන ලද මෘදු සිට මධ්‍යස්ථ ඇල්සයිමර් රෝගීන් 120 ක් සම්බන්ධ ද්විත්ව අන්ධ ප්ලේසෙබෝ පාලිත සායනික අත්හදා බැලීම් ඇතුළත් විය. කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් හෙළිදරව් කළේ කණ්ඩායම් දෙක අතර මතක ලකුණු, ලිපිඩ සංයුතිය සහ HbA1c මට්ටම්වල සැලකිය යුතු වෙනසක් නොමැති බවයි. කෙසේ වෙතත්, වර්ජින් පොල්තෙල් සමඟ පෝෂණය වූ APOE 4 වාහකයන් අතර, වාහක නොවන වාහකයන්ට සාපේක්ෂව MMSE ලකුණු වැඩිදියුණු වූ අතර, APOE 4 කැනෝලා තෙල් සහිත රෝගීන්ගේ මතක ලකුණු වලට බල නොපායි. තවද, කැනෝලා තෙල් හා සසඳන විට VCO කොලෙස්ටරෝල් හෝ ට්‍රයිග්ලිසරයිඩ වැඩි නොකළ බව අධ්‍යයනය පෙන්වා දුන්නේය.

වර්ජින් පොල්තෙල් හෝ සෝයා තෙල් පෝෂණය කිරීමෙන් දියවැඩියා ප්‍රේරිත මීයන් හා සසඳන විට දියවැඩියා නොවන මීයන් තුළ රුධිරයේ සීනි මට්ටම පාලනය වැඩි දියුණු කිරීම

පොල් සැකසුම් පර්යේෂණ අංශය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය

දියවැඩියා රෝගය යනු නිරපේක්ෂ ඉන්සියුලින් ඌනතාවයෙන් හෝ ඉන්සියුලින් ක්‍රියාකාරිත්වය අඩාල වීමෙන් ඇතිවන නිදන්ගත රෝගයක් වන අතර සාමාන්‍ය කායික විද්‍යාවේ බොහෝ අක්‍රමිකතා හයිපර්ග්ලයිසිමියාව මගින් පෙන්නුම් කෙරේ. දියවැඩියා (D) සහ දියවැඩියා නොවන (ND) මීයන් තුළ රුධිරයේ සීනි මට්ටම පාලනය සඳහා වර්ජින් පොල්තෙල් (VCO) හෝ සෝයා තෙල්වල (SO) බලපෑම පැහැදිලි කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි. අහඹු ලෙස තෝරාගත් Sprague Dawley මීයන් කාණ්ඩ තුනක් (n=8 බැගින්ත සති 6-8; 150-200 ට) දියවැඩියා කාණ්ඩයට (D) අහඹු ලෙස වෙන් කරන ලද අතර එම මීයන් කාණ්ඩ තුන ඇලොක්සේන් ප්‍රතිකාරය මගින් දියවැඩියා තත්ත්වය ඇති කරන ලද අතර ND කාණ්ඩයට ද කණ්ඩායම් 3ක් වෙන් කරන ලදී. සෑම කාණ්ඩයකම කණ්ඩායම් තුන දින 90 ක් සඳහා ජලය, VCO හෝ SO 7.5ml/kg ශරීර බර/දිනක් සමඟ පෝෂණය කෙරිණි. මුඛ ග්ලූකෝස් ඉවසීමේ පරීක්ෂණය (OGTT) D දියවැඩියා කාණ්ඩයේ සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය නො වූ අතර ND කාණ්ඩයේ ($p<0.001$) ඉතා සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. ඉන්සියුලින් ඇති විට රුධිරයේ සීනි මට්ටම පාලනය වැඩිදියුණු කිරීමට VCO සහ SO සමත් වූ නමුත් එය නොමැති විට රුධිරයේ සීනි මට්ටම පාලනය වැඩිදියුණු කිරීමට නොහැකි විය.

කුෂන්/මෙට්ට සඳහා කොහු සහ රබර් සංයුක්ත

පොල් සැකසුම් පර්යේෂණ අංශය

කොහු ආශ්‍රිත කුෂන් සහ මෙට්ට සඳහා සුදුසු කොහු කෙඳි වර්ගය සොයා ගැනීම සඳහා සිදු කරන ලද අධ්‍යයනයෙන් හෙළි වූයේ 100% ඕමැට් තන්තු වලින් සාදන ලද 80 kg/m3 ඝනත්වයකින් යුත් සම්පීඩන තාවය, ඉන්ඩෙන්ටේෂන් දෘඪතාව (N), වයසට යාමේ ප්‍රතිරෝධය (සියයට) SLS ප්‍රමිතීන් තෘප්තිමත් කරන බව සහ එය මෙට්ට නිෂ්පාදනය සඳහා පිළිගත හැකි බවයි.

මෙට්ට සාම්පල 47x40x11cm^3 ප්‍රමාණයේ කුෂන් සාදා පරීක්ෂා කරන ලද අතර පුද්ගලයන්ගේ පිළිගැනීමට අදාළව ඕමැට් හෝ මෙට්ට කෙඳිවලින් නිපදවන ලද සාම්පල අතරින් හොඳම කුෂන් සඳහා පරීක්ෂා කරන ලදී. කුෂන් සාම්පල සමාන සූත්‍ර භාවිතයෙන් නිපදවා ඇති අතර මාස 6 ක් සඳහා දිනකට පැය 5 බැගින් වාඩි වී 12 දෙනෙකුගේ මනාපය සැලකිල්ලට ගනිමින් පිළිගත හැකි බව විශ්ලේෂණය කරන ලදී. Minitab හි Friedman Test භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී. පරීක්ෂණ පරාමිතීන් සඳහා, එනම්. මෙට්ට කෙඳි වලින් සාදන ලද කුෂන් හා සසඳන විට ,ඉඳගෙන සිටින විට සුවපහසුව, සහ, ,මාංශ පේශිවලට පහසුවක් දැනීම,, සැලකිය යුතු ලෙස ඉහළ මනාපය ($p< 0.05$) ඕමාට් විසින් සාදන ලද කුෂන් සඳහා බව සොයා ගන්නා ලදී. කුෂන් 1 සහ 2 සඳහා .ඉඳගෙන සිටින විට උෂ්ණත්වය වැඩිවීම., කුෂන් වලින් විෂ වායු විමෝචනය වීම නිසා හුස්ම ගැනීමේ අපහසුව සහ, උෂ්ණත්වය වැඩි වීම නිසා දහඩිය දැමීම, පරාමිති සඳහා සැලකිය යුතු වෙනසක් නොතිබුණි . මෙම ප්‍රතිඵල වලින් ඕමැට් තන්තු වලින් සාදන ලද කුෂන් (100%) ඉහළ පිළිගැනීමක් සහ උසස් තත්ත්වයේ කුෂන් නිෂ්පාදනය සඳහා නිර්දේශ කළ හැකි බව සොයා ගන්නා ලදී.

පොල් ලෙලි පොඟවා ගැනීමේ ක්‍රියාවලිය ඇගයීම

පොල් සැකසුම් පර්යේෂණ අංශය

යාන්ත්‍රික නිස්සාරණයට පෙර ලෙලිවල ඇති කොහු කෙඳි ලිහිල් කිරීම සඳහා පොල් ලෙලි මාස තුනකට ආසන්න කාලයක් පොඟවා ගැනීම අවශ්‍ය වන බැවින් බ්‍රිස්ටල් කෙඳි නිෂ්පාදනය තරමක් වෙහෙසකර වේ. කොහු කර්මාන්තයේ නියැලෙන බොහෝ දෙනා පොල් ලෙලි පොඟවා ගැනීම සඳහා භාවිතා කරන්නේ ස්වාභාවික වළවල් ය. ස්වාභාවික වළවල් භාවිතයේ දුර්වලතා වන්නේ භූගත ජලයට පොල් ලෙලි පෙඟවූ ජලය කාන්දු වීම නිසා සිදුවන ජල දූෂණය, පොල් ලෙලි වළවල් වලින් ඉවත් කිරීමට ශ්‍රමය හිඟ වීම යනාදියයි. මෙයට පිළියමක් ලෙස ඇතැමුන් සම්ප්‍රදායික වළවල් වෙනුවට කොන්ක්‍රීට් ටැංකි භාවිතා කරයි. මෙම අධ්‍යයනය සිදු කරනු ලැබුවේ සම්ප්‍රදායික වළවල් සහ කොන්ක්‍රීට් ටැංකි භාවිතා කර පොල් ලෙලි වල කෙඳි නිස්සාරණය කිරීමේ කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා ය.

මෙම අධ්‍යයනයේදී පොල් ලෙලි නිදර්ශක 8ක් (ලෙලි 10ක් බැගින් ; අනුරූ 4ක්) එක් ටැංකියක /වළක කැබලි නිදර්ශක 4ක් බැගින් පොඟවා ගන්නා ලදී. pH, විද්‍යුත් සන්නායකතාවය (EC) සහ ක්ෂුද්‍රජීවී ගණන පොල් ලෙලි පෙඟවූ ජලයේ මනිනු ලැබූ අතර පොල් ලෙලි නිස්සාරණය කිරීමේදී බ්‍රිස්ටල් කෙඳි, මෙට්ට කෙඳි සහ කොහුබත් වල බරද මනිනු ලැබීය. මෙම දත්ත සති 4ක්, සති 8ක්, සති 10ක් සහ සති 12ක පසුබැසීමේ කාලයන්හිදී ලබා ගන්නා ලදී. කොන්ක්‍රීට් ටැංකි ක්‍රමයේදී (CRTM), EC 702±8.05 µs සිට 781±23µs දක්වා කාලයත් සමඟ වැඩි වී ඇති බව සොයා ගන්නා ලදී. සම්ප්‍රදායික වළවල් ක්‍රමයේදී (NRPM), EC 716±6 µs to 812±9 µs දක්වා වැඩි වී ඇති බව සොයා ගන්නා ලදී. ක්‍රම දෙකෙහිම pH හි සුළු වෙනසක් නිරීක්ෂණය විය. ක්ෂුද්‍ර ජීවී සංඛ්‍යාව කාලයත් සමඟ වෙනස් වූ බවක් පෙනෙන්නට තිබුණි. බ්‍රිස්ටල් තන්තු ප්‍රමාණය වැඩිම ප්‍රමාණයක්

ලබාගෙන ඇත්තේ මාස 3 ක් පෙඟවූ පොල් ලෙලි වලින් වන අතර ඒවා CRTM වෙතින් 9.48 ±1.75 % සහ NRPM වෙතින් 9.11 ±1.12% විය. මෙම ක්‍රම දෙකෙහිම කෙඳි ප්‍රමාණයෙහි සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි. එබැවින්, ස්වාභාවික ලෙලි නෙළීම වෙනුවට පොල් ලෙලි පෙර නිස්සාරණය කිරීම සඳහා කොන්ක්‍රීට් ටැංකි ක්‍රමය නිර්දේශ කළ හැක.

පොල් ලෙලි නිෂ්පාදන යෙදීමෙන් සුව පහසු රබර් අත්වැසුම් සහ රබර් ආරක්ෂිත සපත්තු නිෂ්පාදනය සඳහා තාක්ෂණය දියුණු කිරීම

පොල් සැකසුම් පර්යේෂණ අංශය

අඩු බර, ජල ප්‍රතිරෝධය සහ අඩු තාප සන්නායකතාවය හේතුවෙන් කොහු මිශ්‍රණය සහිත ස්වාභාවික රබර් ජනප්‍රිය වෙමින් පවතී. දැනට භාවිතා කරන රබර් බූට් සහ අත්වැසුම් වෙනුවට ශරීරයේ ආරක්ෂාව සැපපහසු ලෙස භාවිතා කිරීම සඳහා කොහුබත් සහ ස්වාභාවික රබර් මිශ්‍ර කර අඩු දහඩිය, සැහැල්ලු සපත්තු සහ අත්වැසුම් නිෂ්පාදනය කිරීම වැදගත් වේ.

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ ශරීරයේ ආරක්ෂාව සඳහා භාවිතා වන රබර් සපත්තු සහ රබර් අත්වැසුම් වල සුවපහසු භාවිතය සඳහා, තාපය හේතුවෙන් සිදුවන දහඩිය දැමීම අවම කිරීම සඳහා කොහු කෙඳිවලට අගය එකතු කිරීමයි. පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, කොහු රබර් සංයුක්ත කිරීම සඳහා 0-0.5 mm සහ 0.5 සිට 1 mm දක්වා විවිධ දිග ප්‍රමාණයේ කොහු කෙඳි භාවිතා කර දිග ප්‍රමාණයේ යෝග්‍යතාවය විශ්ලේෂණය කරන ලදී. ප්‍රතිඵල පෙන්නුම් කළේ කාබන් කළු වලින් 40% (w/w) ප්‍රමාණය කොහු තන්තු මගින් ප්‍රතිස්ථාපනය කරන ලද ප්‍රතිකාර සඳහා 0- 0.5 mm කොහු කෙඳි ඉහළ ආතන්‍ය ශක්තියක් (13 ± 1 MPa) ලබා දී ඇති බවයි.



පොල් මද, කෙඳි හා පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ප්‍රගමනය

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන අංගයක් වන පොල් සමාජයට බහු යෙදවුම් සපයන අතරම ආර්ථිකයට සැලකිය යුතු ආදායමක් දායක කරයි. 2021 වසරේ පොල් කර්මාන්තයේ ඉහළ අස්වැන්න වන මිලියන 3,382.9 ක් වාර්තා කළ අතර, එය 2020 වසරේ වාර්තා කළ අස්වැන්න වන ගෙඩි මිලියන 2,818.3 ට වඩා 20% ක වැඩිවීමකි. එමෙන්ම 2021 වසරේ අපනයන ආදායම රුපියල් බිලියන 166 කි. එනම්, ඇමරිකානු ඩොලර් මිලියන 834 ක අගයක් පෙන්නුම් කරන ලද අතර, එය වාර්තාගත වැඩිවීමක් ලෙස සටහන් වනු ඇත. මෙම වසරේ වර්ෂාපතන රටාව පොල් වගාකරන ප්‍රදේශ සඳහා හිතකර ආකාරයෙන් බලපෑමක් සිදු කරන ලදී.

පොල්තෙල් නිෂ්පාදනය 2020 අගය වන මෙට්‍රික් ටොන් 19,759 සිට 2021 වසර වන විට මෙට්‍රික් ටොන් 43,038 දක්වා 117% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. පොල්කිරි අපනයනය 2020 වසරේ පැවති මෙට්‍රික් ටොන් 46,626 සිට 53,255 දක්වා 14% කින් වර්ධනය වී ඇත. මෙම වසරේදී නැවුම් පොල්තෙල් කර්මාන්තය 3% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර, දිසිදි පොල් කර්මාන්තය 22% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. අපනයනය කරන නිෂ්පාදන අතරින් දිසිදි පොල් හා පොල්කිරි අපනයන ආදායම් ඉපයීමේදී විශාල දායකත්වයක් දක්වන අතර, එම අගයන් පිළිවෙලින් ඇමරිකානු ඩොලර් මිලියන 107.85 හා ඇමරිකානු ඩොලර් 102.94 ලෙස දායකත්වයක් ලබා දී ඇත. එසේම වසර පුරා දිසිදි පොල් මිල ප්‍රශස්ත මට්ටමක පැවති අතර, ඒ අනුව දේශීය පොල් මිලද පවත්වාගෙන යන ලදී. මෙලෙස පොල් මිල සාධනීය ලෙස පොල් වගාකරුවන්, කර්මාන්තය හා පාරිභෝගිකයින් ලෙස ලබා දීමට හැකි වූයේ පොල් කර්මාන්තකරුවන්ගේ ඒකාබද්ධ සංගමය, පොල් පර්යේෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය, හා වැවිලි අමාත්‍යාංශයේ මැදිහත් වීම නිසා වේ. එමෙන්ම පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශය මත වසර පුරාම විශේෂ වෙළඳ බද්ද එක් අගයක පවත්වාගෙන යාමද මෙම මිල මට්ටම් පවත්වාගෙන යාමට උදව් විය. මෙම වසරේ කොප්පරා අපනයනයේ සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන හා කොහු ආශ්‍රිත නිෂ්පාදන වලින් ලැබෙන අපනයන ආදායම අනුක්‍රමිකව 42%කින් හා 33% ක් ලෙස වැඩි විය. කොහු ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන අතරින් රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ මගින් ඉහළ ආදායමක් උපයා ඇත.

බාද්‍ය තෙල් ආනයනය වසරේ ප්‍රථම භාගය තුළ වැඩිවීමක් පෙන්නුම් කළ අතර, එය වසරේ දෙවන භාගයේදී පෙර වසරට සාපේක්ෂව 30% ක අඩුවීමක් පෙන්වන ලදී. කෙසේ වූවද වසරේ මුළු අඩුවීම 8% ක් ලෙස මෙට්‍රික් ටොන් 219,295 සිට මෙට්‍රික් ටොන් 202,269 දක්වා අඩු විය. එසේ වූවද මෙම තෙල් ආනයනය සඳහා වැය වූ ආනයන වියදම 52% කින් ඉහළ යන ලදී.

පොල් මිල පුරෝකථනය සඳහා මිල ආකෘතියක් නිර්මාණය කිරීම

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය සහ ශාක කායික විද්‍යා අංශය

පසුගිය දශකය ගත් කළ පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ලෝකයේ ඉල්ලුම හා සැපයුම විශාල වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. එම නිසා පොල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන රට වල මෙම කර්මාන්තය ආර්ථිකව සුවිශේෂී දායකත්වයක් දක්වන කර්මාන්තයක් බවට පත් වී ඇත. කෙසේ වුවද අනෙකුත් කෘෂි ආර්ථික නිෂ්පාදන මෙන්ම පොල් මිලද වෙනස් වීම් වලට භාජනය වේ. මෙම හදිසි මිල වෙනස්වීම් කර්මාන්තයට බලපෑම් ඇති කරන නිසා සාධනීය මිල පුරෝකථන ආකෘතියක් නිර්මාණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

මේ සඳහා මිල පුරෝකථනය සඳහා යොදා ගන්නා ආකෘතියක් (feed forward neural network) යොදා ගත් අතර, 2009 සිට 2019 දක්වා පුත්තලම, කුරුණෑගල හා ගම්පහ යන පොල් වගාකිරීමේ මණ්ඩල බල ප්‍රදේශ වල මාසික සාමාන්‍ය ගොවිපොළ වල පොල් මිල යොදා ගන්නා ලදී. මෙම අධ්‍යයනයේ පොල් මිලට බලපාන විචල්‍ය සාධක ලෙස පෙර මාස දෙකක නිෂ්පාදන වල බලපෑම් හා පෙර මාස දෙකක මිලෙහි ඇති වන බලපෑම අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යයනයෙන් පෙනී ගිය කරුණක් වන්නේ මෙම ක්‍රමවේදය යොදාගෙන මාස දෙකක් ඉදිරියට ලැබෙන ගොවිපොළ මිල පුරෝකථනය සිදු කළ හැකි බවය. 0.97, 0.96 සහ 0.97 ලෙස පිළිවෙලින් පුහුණු කිරීම, තක්සේරු කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා (R2) අගයන්ගෙන් ආකෘති නිරවද්‍යතාව ලබා ගන්නා ලදී.

ඒ අනුව, මෙම ආකෘති යොදා 2021 වසරේ ජනවාරි/පෙබරවාරි ගොවිපොළ මිල රු. 65.94 හා මාර්තු/අප්‍රේල් මිල රු. 61.40 ලෙස පුරෝකථනය කරන ලදී.

ශ්‍රී ලංකාවේ පොල්තෙල් හා වෙනත් ආහාරයට ගන්නා තෙල් පරිභෝජනයේ රටා හඳුනා ගැනීම

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

පසුගිය දශක කීපය ගත් කළ ජනතාවගේ ආහර පරිභෝජන රටාව ක්‍රමානුකූලව වෙනස් වෙමින් පවතින අතර, මෙම තත්ත්වය පොල්තෙල් සඳහා ආදේශක හඳුන්වා දීමත් සමගම තෙල් පරිභෝජන රටාවේද වෙනස්කම් පෙන්නුම් කරයි. මෙම තත්ත්වය ආර්ථික හා ජනතාව රටේ විහිදී ඇති ආකාරය අනුව වෙනස් වන අතර, ඔවුන්ගේ ජීවන රටාව අනුව හා ප්‍රියමනාප භාවය හා රස අනුව වෙනස්කම් සිදු කරයි.

මෙම සමීක්ෂණය ග්‍රාමීයව හා නාගරිකව වෙසෙන පවුල් ඒකක වල සිදු කළ අතර, චතු ආශ්‍රිතව ජීවත් වන පවුල් ඒකක වල තොරතුරු එක්රැස් කළ යුතුව ඇත. රැස්කළ තොරතුරු වලට අනුව ග්‍රාමීය හා නාගරිකව ජීවත් වන ජනතාවගෙන් බොහොමයක් පොල්තෙල් ආහාර පිසීම සඳහා යොදා ගන්නා අතර, ජනගහනයෙන් 2% ක් පමණ පොල්තෙල් හා පාම්තෙල් යන තෙල් වර්ග දෙකම ආහාරයට ගැනීම සිදු වේ. බොහොමයක් ග්‍රාමීය ජනතාව ඔවුන්ට අවශ්‍ය පොල් තෙල් ඔවුන් විසින්ම පිළියෙල කරනු ලබන අතර, නාගරික ජනතාව එම ප්‍රදේශයේ තිබෙන වෙළඳසැල් වලින් තෙල් මිලදී ගැනීම සිදු කරයි. මෙම තෙල් වර්ග සුලභතාවය මෙම තෙල් වර්ග තෝරා ගැනීමට බලපාන සාධකයක් වන අතර, ඒවායේ මිලද දෙවනුව මෙම තේරීම් සඳහා බලපෑම් ඇති කරයි. මෙම තෙල් පරිභෝජනයට ගන්නා ගෘහ ඒකක ගත් විට වැඩිමනත් ගෘහ ඒකක ලීටර් 1-2 අතර ප්‍රමාණයක් මසකට පරිභෝජනයට ගන්නා අතර, 29% ක ජනතාවක් මසකට ලීටර් 2 - 3 පමණ ආහාර පිසීම සඳහා යොදා ගන්නා අතර, 10% ක් පමණ මසකට ලීටර් 3 කට වඩා පරිභෝජනයට ගනී. ග්‍රාමීය ජනතාව අවම වශයෙන් දිනකට දෙවරක් පොල්තෙල් පරිභෝජනය සඳහා යොදා ගන්නා අතර, නාගරික ජනතාව දිනකට බොහෝ විට එක් වරක් පමණක් පොල්තෙල් පරිභෝජනය සඳහා යොදා ගනී. කෙසේ වෙතත් 45% ක් පමණ ගෘහස්ථ ජනතාව සෞඛ්‍යමය හේතූන් නිසා

ආහාරයට තෙල් යොදා ගැනීමේ වාර ගණන අඩු කර ඇත. එමෙන්ම ගෘහස්ථ ජනතාවගෙන් 6% ක පමණ ප්‍රමාණයක් ඔවුන් පෙර වසර වල පරිභෝජනයට යොදා ගත් තෙල් වර්ගය වෙනස් කර ඇති අතර, මෑත වසර වල පොල්තෙල් වල සුලභතාවය අඩු වීම නිසා බොහොමයක් දෙනා පාම්තෙල් පරිභෝජනයට පෙළඹී ඇත.

පොල් වගාවේ ඇසේරියා මයිටා පාලනය කිරීම සඳහා විලෝපික මයිටා මුදා හැරීමේ බලපෑම පිළිබඳ අධ්‍යයනය (2019-2021)

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය සහ වගා සංරක්ෂණ අංශය

පොල් පර්යේෂණ ආයතනය ඇසේරියා මයිටාවා පාලනය සඳහා හඳුන්වා දී ඇති නියෝසියුලස් බරාකි නමැති විලෝපික මයිටාවා යොදා ගැනීමේ සාර්ථකත්වය හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කර ඇත. මෙම පර්යේෂණය කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඒකාබද්ධව ආරම්භ කළ අතර, එම සමාගම දැනටමත් විලෝපික මයිටාවන් අභිජනනයේ නියැලී සිටී. පොල් පර්යේෂණ ආයතනය නිර්දේශ කළ පරිදි විලෝපික මයිටාවන් මුදා හැරීම වසර දෙකක් පුරා සිදු කළ අතර, 2019 හා 2020 යන වසර වල දත්ත සංසන්දනය කරන ලදී. ප්‍රතිඵල වලට අනුව සාමාන්‍ය 2019 හා 2020 වසර වල මාසිකව මයිටා හානියට පත් වූ ගෙඩි ගණන 4.76 හා 3.62 ලෙස වාර්තා වූ අතර, සංඛ්‍යානයට අනුව සැළකිය යුතු වෙනස්කමක් පවතින බව තහවුරු විය ($P < 0.05$). එමෙන්ම සම්පූර්ණ ගෙඩියක් ලෙස විකිණිය හැකි ගෙඩි ගණන මසකට 3.5 සිට 2.5 දක්වා අඩුවක් පෙන්නුම් කරයි. විලෝපික මයිටාවන් යෙදීමේ බලපෑම කොතෙක් දුරට පවතීද යන්න හඳුනා ගැනීම සඳහා මෙම පර්යේෂණය තවදුරටත් පවත්වාගෙන යන ලදී.

ශ්‍රී ලංකාවේ පොල් නැවත වගාකිරීමේ වැඩසටහනේ ප්‍රගතිය ඇගයීම

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය හා එක්ව ශ්‍රී ලංකාවේ පොල් වගාව විරස්ථායීව පවත්වාගෙන යාමේ අරමුණ ඇතිව පවත්වාගෙන යනු ලබන පොල් නැවත වගාකිරීමේ වැඩසටහනට අවශ්‍ය පොල් පැළ නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටී, එසේ වූවද මෙම පොල් පැළ නැවත සිටුවීමේ වැඩසටහනේ පැළ වගාව ක්ෂේත්‍ර මට්ටමේදී කර්මාන්තයට දායකත්වයක් ලබා දීම සඳහා සාර්ථකද යන්න පසුවිපරමක් සිදු කර නැත. එම නිසා මෙම අධ්‍යයනය මගින් 2015 දක්වා පොල් පැළ ලබාදීමේ ප්‍රගතිය අධ්‍යයනය කරන අතර එම වැඩසටහනේ ගැටළු සහගත තැන් හඳුනා ගැනීම හා පොල් නැවත වගාකිරීමේ වැඩසටහනේ සාර්ථකත්වය හඳුනා ගැනීම, පැළ මියයාමේ ප්‍රමාණය හා තාක්ෂණය සම්ප්‍රේෂණයේ ගැටළු හඳුනා ගැනීමේ ප්‍රගතිය හඳුනා ගැනීමට බලාපොරොත්තු වේ.

මෙම සමීක්ෂණය කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක වල පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කොට්ඨාශ වල 2014 සිට 2017 දක්වා පොල් පැළ බෙදා දුන් වතු 360 ක් යොදා ගත් අතර, ලැබුණු දත්ත වලට අනුව පැළ මියයාම වසර 2014, 2015, 2016 සහ 2017 වලදී අනුක්‍රමිකව 27%, 23%, 29% හා 40% ලෙස සටහන් විය. මෙම වසර වල පැළ වලින් 80% කට වඩා මිය යාමට ප්‍රධාන හේතූන් 4 ලෙස නියඟය (14-51%), කළු කුරුමිණි උවදුර (15-39%), රතු කුරුමිණි උවදුර (11-21%) සහ ඉත්තෑවන්ගේ හානිය (13-39%) වාර්තා වේ. සියලුම පොල් සංවර්ධන කොට්ඨාශ වලින් අවශ්‍ය දත්ත ලබා ගත් පසු සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරනු ඇත.

කොහු ආශ්‍රිත කර්මාන්තයේ වෙළඳපොළ හැසිරීම (2019-2021)

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

පොල් ආශ්‍රිත කොහු කර්මාන්තය සඳහා ප්‍රතිපත්ති රාමුවක් පිළියෙල කිරීම හදිසි අවශ්‍යතාවයක් බවට වැවිලි අමාත්‍යාංශය හා පොල් පර්යේෂණ ආයතනය හඳුනාගෙන ඇත. එම නිසා මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ කොහු කෙඳි කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමය. එමෙන්ම තවත් එක් සුවිශේෂී අරමුණක් වන්නේ ලෝක වෙළඳපොළේ අතීත ප්‍රවණතා හඳුනා ගැනීමයි. දත්ත වලට අනුව 1980 - 1989 කාලයේ ශ්‍රී ලංකාවේ වෙළඳභාගය 70% තරම් ඉහළ අගයක් ගත් අතර, එය 40% දක්වා 2000 - 2009 කාලයේදී පහළ යන ලදී. කෙසේ වෙතත් නැවත වරක් ශ්‍රී ලංකාවේ වෙළඳභාගය 45% දක්වා වර්ධනය කර ගැනීමට සමත් වී ඇත. ඒ අනුව, අධ්‍යයනයක් ආරම්භ කළ අතර, එහි අරමුණ වනුයේ (අ) කොහු කර්මාන්තයේ අගය දාමය අධ්‍යයනය කිරීම හා (ආ) කොහු නිෂ්පාදන වල අගය එකතු කිරීමේදී බලපෑම් හඳුනා ගැනීම වේ. මෙම අධ්‍යයනයේ දත්ත බොහොමයක් එක් රැස් කර ඇති අතර, ඉදිරි දත්ත ලබා ගැනීම රටේ පැවති කොවිඩ් උවදුර නිසා ප්‍රමාද විය. ලබා ගත් දත්ත විශ්ලේෂණය ආරම්භ කර ඇත.

පර්යේෂණ සංවර්ධනයන්

ගොවිපොළ පද්ධති ආදර්ශන

ශෂ්‍ය විද්‍යා අංශය

i. ජීව බලශක්ති නිෂ්පාදන ආදර්ශන

මෙම ආදර්ශනය රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ පොල් ගස් 150ක් හා ග්ලිරිසීඩියා ශාක 2500 කින් සමන්විත හෙක්ටයාර් එකක පොල් වගා භූමි ප්‍රමාණයක නිර්මාණය කර ඇති අතර එහි සිටින මී ගවයින් සයදෙනා සඳහා පිටතින් ගෙන එනු ලබන පිදුරු සපයයි. මෙම පද්ධතියේ තිබෙන ග්ලිරිසීඩියා දර, බල ශක්තිය නිපදවීම සඳහාත්, ගොම, ජීවවායුව නිපදවීම සඳහාත් යොදා ගනී. ජීවවායුව නිපදවීමේදී සෑදෙන අතුරු ඵලය, පොල් ගස් සඳහා පොහොරක් ලෙස භාවිතා කරයි.මෙම ආදර්ශනය දැනට වගාකරුවන්ට ප්‍රායෝගිකව දැනුම ලබාදීම සඳහා යොදා ගනී.




රූපය 1. රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ ග්ලිරිසීඩියා වගාව සහ ජෛව බලශක්ති නිෂ්පාදන ඒකකය

ii. ඒකාබද්ධ සත්ත්ව පාලන ආදර්ශන

කුඩා වතු හිමියන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා පොල් ඉඩම් වල ඒකාබද්ධ සත්ත්ව පාලනය යොදා ගත හැක. වගාකරුවන්ව මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම අරමුණු කරගෙන,රත්මලාගාර මධ්‍යස්ථානයේ එළුවන් හා බැටළුවන් ඇති කිරීමේ ආදර්ශන පවත්වාගෙන යනු ලබයි. මෙය පොල් ඉඩම් වල ගැටළුකාරී වල් පැළෑටි කළමනාකරණය කිරීමට සහ පසෙහි සාරවත් බව වැඩි කිරීම සඳහා ඵලදායී වේ. මෙහි සතුන් 50 ක පමණ ප්‍රමාණයක් නිදැලි ක්‍රමයට හා CO-3 තෘණ කොටු තුළ ඇති කරනු ලබයි.





රූපය 2. රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ එළු හා බැටළු පාලන ආදර්ශන

iii. සත්ත්ව ආහාර සඳහා තෘණ වගා ආදර්ශන

පොල් ඉඩම්වල සත්ත්ව පාලනය කළමනාකරණය කිරීම පිළිබඳව දේශීය ප්‍රජාවගේ, පොල් වගා කරුවන්ගේ, විශ්ව විද්‍යාල, කෘෂිකාර්මික හා පාසල් සිසුන්ගේ දැනුම හා දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා රත්මලාගාර සහ බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානවල ආවරණ භෝග, තෘණ හා රනිල භෝග ක්ෂේත්‍ර ආදර්ශන දෙකක් පවත්වා ගෙන යනු ලබයි.





රූපය 3 - රත්මලාගාර සහ බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථාන වල තෘණ වගා ආදර්ශන

iv. පණු පොහොර නිෂ්පාදන ඒකකය

පොල් වගාවෙන් සුලභව ඉවත් වන අප ද්‍රව්‍ය වන, වල් පැළෑටි සහ සත්ත්ව අපද්‍රව්‍ය යොදා ගනිමින් කෙටි කාලයක් තුළදී පෝෂක වලින් පොහොසත් පණු පොහොර නිෂ්පාදනය සඳහා රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ පණු පොහොර නිෂ්පාදන ඒකකයක් පවත්වාගෙන යනු ලබයි. බිම් පණුවන් ගුණනය කිරීමත්, පර්යේෂණ හා ආදර්ශන අරමුණු සඳහා පණු පොහොර නිෂ්පාදනය කිරීමත් මෙහිදී සිදුකරයි. මෙම ආදර්ශනය යටතේ වගාකරුවන් වෙත පණුවන් බෙදා හැරෙන අතර, වගාකරුවන් විශ්ව විද්‍යාල,කෘෂිකාර්මික විද්‍යාල සහ පාසැල් සිසුන්ට දැනුම ලබා දීම සඳහා ආදර්ශනයක් ලෙසද භාවිතා කරනු ලබයි.





රූපය 4 - රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ පණු පොහොර නිෂ්පාදන ඒකකය

v. අතුරු භෝග වගාව

පොල් ඉඩම්වල අතුරු භෝග වගාව පිළිබඳව වගාකරුවන්,විශ්ව විද්‍යාල,කෘෂිකාර්මික හා පැසල් සිසුන් හට දැනුම ප්‍රචලිත කිරීම සඳහා ,අතුරු භෝග ආදර්ශනයන් 20ක් මාකඳුර හා රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයන්හි සාර්ථක ලෙස පවත්වා ගෙන යනු ලැබේ. මෙම ආදර්ශන අපනයන භෝග,පලතුරු භෝග,දැව භෝග සහ තෘණ වලින් සමන්විත වේ.





රූපය 5- මාකඳුර හා රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථාන වල අතුරු භෝග ආදර්ශනයන්

තෙත් අතරමැදි කලාපයේ දෙමුහුන් පොල් නිෂ්පාදනය සඳහා නව බීජ පොල් උයනක් පිහිටුවීම.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

දෙමුහුන් පොල් ඉතා ඉක්මනින් මල් හට ගන්නා අතර උස ප්‍රභේදවලට සාපේක්ෂව 40-50% වැඩි අස්වැන්නක් ලබා දෙයි. එබැවින් ජාතික පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමේ ඉදිරි මග දෙමුහුන් පොල් වගාවයි. කෙසේ වෙතත්, දැනට දෙමුහුන් බීජ නිෂ්පාදනය ඉතා අඩු මට්ටමක පවතින අතර සමස්ත වාර්ෂික පොල් බීජ නිෂ්පාදනය සඳහා එහි දායකත්වය 2% ක් පමණි. නිර්දේශිත පොල් දෙමුහුන් අතරින් CRIC-65 පාලිත ස්වභාවික පරාගණය මගින් අඹකැලේ හුදකලා බීජ උයනේ නිෂ්පාදනය කරණු ලබන අතර අනෙකුත් සියලුම දෙමුහුන් පොල් පර්යේෂණ ආයතනයේ වතුවල අත් පරාගණය මඟින් සීමිත ප්‍රමාණයකින් නිෂ්පාදනය කෙරේ.

එබැවින් කප්සුවය දෙමුහුන් බීජ නිෂ්පාදනය සඳහා බීජ උයනක් පිහිටුවීම සඳහා කුරුණෑගල වැවිලි සමාගම සමඟ සහයෝගයෙන් සංවර්ධන ව්‍යාපෘතියක් පොල් පර්යේෂණ ආයතනය යෝජනා කළේය. 2021 දී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය හරහා අරමුදල් ලැබුණු අතර 2021.10.22 දින බීජ උයන ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය සහ කුරුණෑගල වැවිලි සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

මෙම බීජ උද්‍යානය පිහිටුවීම සඳහා කුරුණෑගල වතුයායේ කාල්ස්ෆීල්ඩ් බෙදුමේ අක්කර හැත්තෑපහක් තෝරාගෙන ඇති අතර එහි මව් ගස් ලෙස පැළ 4500කට වැඩි ප්‍රමාණයක් සිටුවනු ලැබේ. මව් ගස්වල අස්වැන්න ස්ථාපිත වීමෙන් පසු මෙම බීජ උයනේ කප්සුවය බීජ නිෂ්පාදන ධාරිතාව ලක්ෂ දෙකක් පමණ වනු ඇත. 2021 වර්ෂය තුළ බීජ උයන වටා වැටක් පිහිටුවීමට සහ වාරි පද්ධතියක් ස්ථාපිත කිරීමට මූලික කටයුතු සිදු කරන ලදී. පැළ 650ක් සිටුවීමට මූලික බිම් සැකසීම අවසන් කර ඇත. කෙසේ වෙතත් 2021 මහ කන්නයේ පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් පැළ සිටුවීම සිදු කිරීමට නොහැකි විය.



කුරුණෑගල වැවිලි සමාගමට අයත් කුරුණෑගල වතුයායේ කාල්ස්ෆීල්ඩ් බෙදුමේ නව දෙමුහුම් බීජ උයනක් ස්ථාපිත කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය සහ කුරුණෑගල වැවිලි සමාගම අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.

කිනියම බීජ උයන වැඩිදියුණු කිරීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

කිනියම බීජ උයන ඉහළ අස්වැන්නක් සහිත කප්රුවන දෙමුහුන් බීජ නිෂ්පාදනය කිරීම සඳහා හලාවත වැවිලි සමාගම හා එක්ව 2013 වසරේ පොල් පර්යේෂණායතනයේ ප්‍රවේණි හා ශාක අභිජනන අංශය විසින් ස්ථාපිත කරන ලදී.

2021 වසරේදී රු. මිලියන 8ක් බීජ උයන වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා අමාත්‍යාංශය හරහා ලැබුණි. වර්ෂය තුළ පුරප්පාඩු පිරවීම සඳහා කොළ කුන්දිරා සහ සැන්රාමන් පැළ 1075 ක් රෝපණය කරන ලද අතර පළිබෝධ සහ රෝග පාලනය කිරීමට පියවර ගන්නා ලදී. කප්රුවන බීජ නිෂ්පාදනය සඳහා අත් පරාගණ වැඩසටහන 2022 දී නැවත ආරම්භ කෙරේ.

2022 වසර සඳහා ජාතික පොල් එලදා පුරෝකථනය

ශාක කායික විද්‍යා අංශය

ප්‍රධාන පොල් වගා කරන ප්‍රදේශ වන කුරුණෑගල, කුලියාපිටිය, ගම්පහ සහ පුත්තලම සඳහා 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ එක පොල් ගසකට අපේක්ෂිත පොල් එලදාවේ වෙනස් වීම බැට්ටා ස්ථාවර වීම මත පදනම් කරගෙන ගණනය කරන ලදී. ඒ අනුව 2021 වසරේ පළමු අර්ධයට සාපේක්ෂව 2022 වසරේ එම කාලය තුළ කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික්ක වල 2%ක සහ 13%ක එලදා අඩු වීමක් අපේක්ෂා කළ හැක. කෙසේ නමුත් එම කාලය තුළ පුත්තලම දිස්ත්‍රික්කයේ 8% ක එලදා වැඩි වීමක් අපේක්ෂිත වේ. 2022 වසරේ ජුනි දක්වා ද්වීමාසික පොල් එලදා පුරෝකථනයට අනුව ජනවාරි සිට පෙබරවාරි පළමු මුරය සඳහා ගෙඩි මිලියන 570.6±29.5 මාර්තු සිට අප්‍රේල් දෙවන මුරය සඳහා ගෙඩි මිලියන 503.4±29.0 ක සහ මැයි සිට ජුනි දක්වා 3 වන මුරය සඳහා ගෙඩි මිලියන 603.8± 32.8ක එලදාවක් සමගින් මුළු එලදාව ගෙඩි මිලියන 1677.7±30.4ක් අපේක්ෂා කෙරේ. 2022 පළමු මුරය සඳහා පුරෝකථනය කළ අගය 2021 වසරේ පළමු මුරයේ එලදාවට සාපේක්ෂව 21% කින් වැඩි වුවද දෙවන සහ තුන් වන මුරයන් දෙකෙහිම එලදාව 2021 වසරේ එම මුරයේ එලදාවට සාපේක්ෂව 13% කින් සහ 5% කින් අඩු වනු ඇත. කෙසේ නමුත් 2021 වසරට සාපේක්ෂව 1%ක පමණ එලදා අඩු වීමක් 2022 වසරේ පළමු මුරයන් තුන තුළ අපේක්ෂා කෙරේ.



	Jan / Feb	Mar / Apr	May / Jun	Jul / Aug	Sep / Oct	Nov / Dec
ANCP 2021	470.63	580.86	634.30	619.18	562.56	515.39
Forecast 2022	570.6	503.4	603.8			

රූපය 6. වසර 2021 හි දී නිරීක්ෂිත වාර්ෂික ජාතික පොල් නිෂ්පාදනය (ද්වි මාසික කැඩුම් ලෙස) වසර 2022 හි (ජූනි මස දක්වා) වූ ද්විමාසික අස්වනු අනාවැකිය සමග සැසඳීම.

තාක්ෂණ හුවමාරු කටයුතු

පොල් වගා කිරීම හා අගය එකතු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

තාක්ෂණ හුවමාරු අංශය

පොල් වගා කිරීම හා අගය එකතු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව මාර්ගස්ථ වැඩ සටහනක් ලෙස සූම් තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී සහභාගිවූවන් 90 දෙනෙකු සඳහා වැඩසටහන් 08 ක් පවත්වන ලදී

ජන මාධ්‍ය හරහා 2021 වසර තුළ තාක්ෂණය බෙදා හැරීම්

ගුවන් විදුලි වැඩසටහන්

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ "සිංහල ජාතික සේවය" ඔස්සේ පොල් වගා කිරීම පිළිබඳ "සුභාරතී" නම් පැයක ගුවන් විදුලි සාකච්ඡා වැඩ සටහන් හතරක් දෙසැම්බර් මස 07, 14, 21 හා 28 යන දින වල පවත්වන ලදී.
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ "සිංහල ජාතික සේවය" ඔස්සේ විකාශනය වන "ගොවිතැනට පැයක්" ගුවන්විදුලි සාකච්ඡාමය වැඩ සටහනට 2021.11.01 දින සහභාගී වී පොල් වගා කිරීම හා ඒ ආශ්‍රිත ගොවි ගැටළු සාකච්ඡා කරන ලදී.

ගුවන්විදුලි ප්‍රචාරක දැන්වීම්

- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ "සිංහල ජාතික සේවය" හා "වෙළඳ සේවය" ඔස්සේ දෙසැම්බර් මාසය පුරා පුවත් ලුහුඬින් ආරම්භයේදී හා අවසානයේදී ගුවන් විදුලි වෙළඳ දැන්වීම් 620 ක් ප්‍රචාරය කරන ලදී.
- දෙසැම්බර් මාසය පුරා, ගුවන් විදුලි වෙළඳ දැන්වීම් 1230 ක්, "සිංහල ජාතික" "සේවය, "වෙළඳ සේවය", "සිටි FM", "ඉංග්‍රීසි සේවය", "තෙන්ඩුල් FM", "දෙමළ ජාතික සේවය", " රුහුණු FM", "කඳුරට FM", "රජරට FM", "වයඹ FM", "පිරෙයි FM" හා "යාල් FM" යන ගුවන් විදුලි සේවාවන් ඔස්සේ සංවර්ධන පුවත් ප්‍රචාරය කරන ලදී.

රූපවාහිනී ප්‍රචාරක දැන්වීම් සහ රූපවාහිනී වැඩසටහන්

- "තෙතමන සංරක්ෂණය" පිළිබඳ තීරු පණිවිඩයක් සති 04 ක් (400 වතාවක්) ජාතික රූපවාහිනී නාලිකාවේ විකාශනය කරවන ලදී.
- "සෞභාග්‍යයේ කප්රුක" වාර්තා වැඩසටහනක් දෙසැම්බර් 11 වෙනිදා සවස 04:30 ට ITN නාලිකාවේ විකාශනය කරවන ලදී.
- "සෞභාග්‍යයේ කප්රුක" වාර්තා වැඩසටහනක් දෙසැම්බර් 17 වෙනිදා රාත්‍රී 07:30 ට ජාතික රූපවාහිනී නාලිකාවේ විකාශනය කරවන ලදී.

පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්

නාක්ෂණ හුවමාරු අංශය

මෙම වසර සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 25 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, කොවිඩ් වසංගත තත්ත්වය නිසා පැවැත්වීමට හැකි වූයේ පුහුණු කිරීමේ වැඩසටහන් 04 ක් පමණි.

පොල් සැකසුම් පර්යේෂණ අංශයේ කාර්ය මණ්ඩලය විසින් මොරටුව කාර්මික සංවර්ධන මණ්ඩලයට හා දිස්ත්‍රික්ක කිහිපයක කප්රුක සමිති සඳහා පොල් ආශ්‍රිත සැකසුම් තාක්ෂණය ලබාදීමේ අරමුණෙන් වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.



පර්යේෂණ ව්‍යාප්ති සංවාද

නාක්ෂණ හුවමාරු අංශය

වසර 2021 දී පර්යේෂණ ව්‍යාප්ති සංවාද 02 ක් පවත්වන ලදී. පළමු වැඩ සටහන පවත්වන ලද්දේ පොල් වගා කිරීමේ මණ්ඩලයේ කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, අම්පාර, රත්නපුර හා මොණරාගල යන ප්‍රාදේශිකයන්හි ක්ෂේත්‍ර ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සමඟ 2021 මාර්තු 31 වැනි දින සූම් තාක්ෂණය ඔස්සේ මාර්ගස්ථ වැඩසටහනක් ලෙසයි.

මීළඟ පර්යේෂණ ව්‍යාප්ති වැඩ සටහන පවත්වන ලද්දේ පොල් වගා කිරීමේ මණ්ඩලයේ අනුරාධපුර, පොලොන්නරුව, වවුනියාව, යාපනය, ත්‍රිකුණාමලය හා මඩකලපුව යන ප්‍රාදේශිකයන්හි කාර්ය මණ්ඩල සමඟ 2021 ජූලි 28 වැනිදාය.

ඉරුදින පුවත්පත් සමඟ පත්‍රිකා බෙදා හැරීම.

නාක්ෂණ හුවමාරු අංශය

ගිය වසර තුළ ඉරුදින පුවත්පත් අතරට දැමූ විවිධ පණිවිඩ රැගත් පත්‍රිකා 81,250 ක් මීරිගම, දඹදෙණිය, මාකඳුර, මීගමුව, දංකොටුව, සීදුව, කොච්චිකඩේ, නාත්තන්ඩිය, මාරවිල, කාක්කපල්ලිය, නිකවැරටිය, පල්ලම, කුලියාපිටිය, හෙට්ටිපොල, බංගදෙනිය, ආඬිගම, ගිරිඋල්ල, ගනේමුල්ල, ගම්පහ, මාතර, කඹුරුගමුව, අහංගම, ගාල්ල, වේයන්ගොඩ, මරඳගහමුල, කඩවත, ජා ඇල, කලුතර හා බේරුවල යන ප්‍රදේශයන්හි බෙදා හරින ලදී.

ප්‍රදර්ශන හා භෝග සායන

තාක්ෂණ හුවමාරු අංශය

තාක්ෂණ හුවමාරු අංශය විසින් එක් ප්‍රදර්ශනයකට හා වෙන්නප්පුව ප්‍රදේශයේ භෝග සායනයට සහභාගි විය.

මුද්‍රණය හා ප්‍රචාරණය

වසර තුළ පහත මුද්‍රිත ද්‍රව්‍ය ප්‍රකාශයට පත් කරන ලදී.

1. පැළ වගාවන් සිටුවීම හා කළමනාකරණය පිළිබඳ පොත් පිංච.
2. කාබනික පොල් වගාව සඳහා නිර්දේශ.
3. කෙටි වාර්ෂික වාර්තාව 2019
4. දිගු වාර්ෂික වාර්තාව 2014, 2015
5. තාක්ෂණ පුවත් (ඉංග්‍රීසි)
6. තාක්ෂණ පුවත් (සිංහල)
7. කොකෝස් වෙලුම 23
8. මගේ පොල් පොත

අංශයේ මුද්‍රණ ඒකකය විසින්, රු 663,811.00 ක් වටිනා මුද්‍රණ කාර්යයන් හා බැඳුම් කාර්යයන් 38 ක් සිදු කරන ලදී. එයට වාර්ෂික වාර්තා, පොත් පිංච, පත්‍රිකා, රාජකාරි පෝරම, චක්‍ර ලේඛන, විවිධ වර්ගයේ පෝරම, දත්ත පත්‍රිකා, සමීක්ෂණ පත්‍රිකා, සහතික, ලිපිගොනු කවර හා අත් පත්‍රිකා යනාදිය අඩංගුවේ.
රාජ්‍ය අමාත්‍යංශයේ, පොල් පර්යේෂණ ආයතනයේ, පොල් සංවර්ධන අධිකාරිය හා තැපැල් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සිදු කළ කර්තව්‍යයක් වූ මෙයට අග්‍රාමාත්‍ය කාර්යාලයේ අනුග්‍රහය ලැබුනි. (පොල් කටුව ආශ්‍රිත නිෂ්පාදන, පොල් තෙල්, මීරා ආශ්‍රිත නිෂ්පාදන, පොල් ලී ආශ්‍රිත නිෂ්පාදන, පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදන, ඉරටු ආශ්‍රිත නිෂ්පාදන, තැඹිලි, පොල් කෙඳි හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වල රූප ඇතුලත් වූ අතර, මුල් දින කවර 2 හි තැඹිලි ගසක් හා CRI 65 දෙමුහුම් ප්‍රභේදය ඇතුලත් විය.

පොල් වගා කළමනාකරණය පිළිබඳ තුන්වන ජාත්‍යන්තර සහතික පත්‍ර පාඨමාලාව

ශාක කායික විද්‍යා අංශය, වගා සංරක්ෂණ අංශය, ශෂ්‍ය විද්‍යා අංශය, කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය, පටක රෝපණ අංශය, ප්‍රවේණි හා ශාක අභිජනන අංශය, පාංශු හා ශාක පෝෂණ අංශය, පොල් සැකසුම් පර්යේෂණ අංශය හා තාක්ෂණ හුවමාරු අංශය.

ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය ජාත්‍යන්තර පොල් ප්‍රජාව සමඟ ඒකබද්ධව පොල් වගා කළමනාකරණය පිළිබඳ තුන්වන ජාත්‍යන්තර සහතික පත්‍ර පාඨමාලාව 2021 ඔක්තෝම්බර් 04 වැනි දින සිට නොවැම්බර් මස 05 වැනි දින දක්වා පවත්වන ලදී. ජාත්‍යන්තර පොල් ප්‍රජාව විසින් තෙවන වරටත් මෙම පුහුණුව සපයන සත්කාරක ආයතනය ලෙස ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය හඳුනා ගැනීම මඟින් පෙනී යන්නේ පොල් ආශ්‍රිත පර්යේෂණ සඳහා සම්පූර්ණයෙන්ම කැපවූ ලොව කීර්තිමත් ආයතනයක් බවට ජාත්‍යන්තරය තුළ පොල් පර්යේෂණ ආයතනයට ඇති අනන්‍යතාවයයි.

ලොව පුරා පැතිර පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වසරේ වැඩසටහන පවත්වන ලද්දේ මාර්ගස්ථවයි. පොල් වගා කෙරෙන රටවල් නියෝජනය කරමින් සහභාගිවූවන් හට විද්‍යාත්මකව පොල් වගා කිරීම හා කළමනාකරණය කිරීම පිළිබඳ සියලු කරුණු ආවරණය කෙරෙමින් පවත්වන ලද පුහුණු වැඩසටහනකි. මෙම වැඩසටහන පොල් ආශ්‍රිත විවිධ කරුණු ආවරණය කෙරෙන දේශනා 50 ක් ඔස්සේ පවත්වන ලදී.

මෙම වැඩ සටහන සඳහා විස්තරාත්මක විෂය කරුණු ඇතුළත් පුහුණු අත් පොතක් පොල් පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් සකස් කරන ලදී.

මෙම පුහුණු වැඩ සටහනේ සමාරම්භක උත්සවය පවත්වන ලද්දේ ආචාර්ය පෙල්ෆිනා සී.ඇලෝ - ජාත්‍යන්තර පොල් ප්‍රජාවේ විධායක අධ්‍යක්ෂ) රවීන්ද්‍ර හේවාපතිරණ මයා (ලේකම්/වැවිලි අමාත්‍යංශය) තානාතිපති ඩයර් නූන් බින්ටෝරා (NAM මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ), විලියම් කැස්ත්‍රෝ රොඩ්‍රිගෝස් (ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ නියෝජිත) වෛද්‍ය සාරංග අලහප්පෙරුම (සභාපති පොල් පර්යේෂණ මණ්ඩලය) සහ ආචාර්ය සනාතනී රණසිංහ (අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය) යන අයගේ සහභාගිත්වයෙන් හා ජාත්‍යන්තරයේ විශේෂ අමුත්තන් 100 දෙනෙකුගේ හා පොල් පර්යේෂණ ආයතනයේ කාර්යමණ්ඩලයේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. මයික්‍රොනීසියා ෆෙඩරල් ජනරජය, ෆීජී, ගයනාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජැමෙයිකාව, කෙන්යාව, පැපුවා නිව්ගිනියාව, සැමෝවා, සොලොමන් දූපත්, තායිලන්තය, වියට්නාමය, ඩොමිනිකන් ජනරජය, බෙලීස්, ග්‍රෙනඩාව, ට්‍රිනිඩෑඩ්, නව කැලිෆෝනියාව, කාම්බෝජය හා සූරිනාමය යනාදී රටවල් 19 ක් නියෝජනය කරමින් 38 දෙනෙකු සහභාගී වූහ.



මෙම වැඩසටහන් සමායෝජනය කරන ලද්දේ ආචාර්ය අතුල නයිනනායක (පාඨමාලා අධ්‍යක්ෂ) හා අනෙකුත් සමායෝජකයින් වන ආචාර්ය ඩී.එම්.ඒ.සී.දිසානායක හා ආචාර්ය එම්.ඩී.පී.කුමාරතුංග යන අය විසිනි. පොල් සංවර්ධන නිලධාරීන් සඳහා වූ සහතික පත්‍ර පාඨමාලාවේ සමාරම්භක සැසිය (2021 ඔක්තෝම්බර් 4 වැනිදා) (වමේ සිට) ආචාර්ය අතුල නයිනනායක (පාඨමාලා අධ්‍යක්ෂ), ආචාර්ය සනාතනී රණසිංහ (අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය) වෛද්‍ය සාරංග අලහප්පෙරුම (සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය) හා ආචාර්ය නයනී ආරච්චිගේ (නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ, පොල් පර්යේෂණ ආයතනය)

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය සඳහා තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම්

වගා සංරක්ෂණ අංශය

පොල් පර්යේෂණ ආයතනයේ හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ ක්ෂේත්‍ර පරීක්ෂකයින් හා ක්ෂේත්‍ර නිලධාරීන් හට වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය ආශ්‍රිත ලක්ෂණ හඳුනා ගැනීම සඳහා පුහුණු කෙරෙන වැඩ සටහන් 02 ක් පවත්වන ලදී.

ජාත්‍යන්තර පොල් දිනය සමරනු වස් සැප්තැම්බර් 02 වැනි දින පොල් ආශ්‍රිත සමරු මුද්දර 10 ක් හා මුල් දින කවර 02 ක් නිකුත් කිරීම

තාක්ෂණ හුවමාරු අංශය

ලෝක පොල් දිනය සමරනු වස් සැප්තැම්බර් 02 වැනි දින පොල් ආශ්‍රිත සමරු මුද්දර 10 ක් හා මුල් දින කවර 02 ක් නිකුත් කරන ලදී. රාජ්‍ය අමාත්‍යංශය, පොල් සංවර්ධන අධිකාරිය, තැපැල් දෙපාර්තමේන්තුව හා පොල් පර්යේෂණ ආයතනය ඒකාබද්ධව සිදු කළ කර්තව්‍යයක් වූ මෙයට අග්‍රාමාත්‍ය කාර්යාලයේ අනුග්‍රහය ලැබුණි. මෙම මුද්දර වල පොල් කටුව ආශ්‍රිත නිෂ්පාදන, පොල් තෙල්, මීරා ආශ්‍රිත නිෂ්පාදන, පොල් ලී ආශ්‍රිත නිෂ්පාදන, පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදන, ඉරටු ආශ්‍රිත නිෂ්පාදන, තැඹිලි, පොල් කෙඳි හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වල රූප ඇතුළත් වූ අතර, මුල් දින කවර 2 හි තැඹිලි ගසක් හා CRIC 65 දෙමුහුම් ප්‍රභේදය ඇතුළත් විය.



පාර්ශ්වකරුවන්ට ලබාදෙන සේවා තුළින් ජාතික සංවර්ධනයට ලබාදෙන දායකත්වය

පොල් පැළ සහතික කිරීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

2021 වසර තුළ බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ ඒකකය විසින් CRIC 60 පැළ 187,597 ක්, CRIC 65 පැළ 28,145 ක්, CRISL 98 පැළ 10,888 ක්, කප්රුවන පැළ 3978ක්, කප්සුවය පැළ 3064 ක්, කප්සෙත පැළ 1908 ක්, CRISL 2020 පැළ 753 ක්, මෝරොක් පැළ 38,838 ක් හා සරු උස පැළ 34,253 ක් සහතික කරන ලදී.



රූපය 1. සහතික කළ පොල් පැළ

දීකිරි පොල් පැළ නිකුත් කිරීම

පටක රෝපණ අංශය

විද්‍යාගාරය තුළ නිපදවන ලද දීකිරි පොල් පැළ 320 ක් පරිසරයට හුරුකිරීම මෙම වසර තුළ සිදුකරන ලදී. එමෙන්ම වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානයේ අක්කරයක භූමි භාගයක් පුරා දීකිරි පොල් සඳහා නව ක්ෂේත්‍ර පර්යේෂණයක් ස්ථාපනය කරන ලදී.

පොල් මිල පුරෝකථනය සඳහා මිල ආකෘතියක් නිර්මාණය කිරීම

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය සහ ශාක කායික විද්‍යා අංශය

2009 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා ශ්‍රී ලංකාවේ පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ පොල් වගා කලාපවල(CCBR) නැවුම් පොල් වල සාමාන්‍ය මාසික ගොවිපොළ මිල (farmgate price) භාවිතා කර පෝෂණ පෙරටුගාමී ස්නායු ජාල ආකෘතියක් (A feed forward neural network model) සකස් කරන ලදී. වාර්ෂික ජාතික පොල් නිෂ්පාදන පුරෝකථනය භාවිතා කරමින් 2021 පළමු මාස හතර සඳහා ගොවිපොළ මිල ගණන් ද්විමාසිකව පුරෝකථනය කරන ලද අතර ඒ අනුව ජනවාරි/පෙබරවාරි මාස සඳහා ගොවිපොළ මිල ගණන් රු. 65.94 ක් සහ මාර්තු/අප්‍රේල් මාස සඳහා ගොවිපොළ මිල ගණන් රු. 61.4 ක් විය.

"කප්රුක" කෙටි පණිවිඩ සේවය

නාක්ෂණ හුවමාරු අංශය

වසර 2021 තුළදී, පොල් ගෙඩියක ගොවිපොළ මිල, දිසිඳි පොල් මිල, කොප්පරා මිල හා පොල් තෙල් මිල යන තොරතුරු, දෙසතියකට වරක් ද, ඊළඟ මාසයේ අස්වනු පුරෝකථනය මාස්පතා ද ඇතුළත් වූ කෙටි පණිවිඩ 65,162 ක්, පොල් පර්යේෂණ ආයතනයේ ලියාපදිංචි පාර්ශවකරුවන් විසින් ලබා ගන්නා ලදී.

කප්රුක තොරතුරු මධ්යස්ථානය

නාක්ෂණ හුවමාරු අංශය

වගාකරුවන් සඳහා තාක්ෂණ උපදෙස් හා තොරතුරු ලබාදීම සඳහා ඔක්තෝබර් 22 වැනි දින 1928 ක්ෂණික ඇමතුම් සේවය සහ 070 400 1928 වට්ස් ඇප් අංකය හඳුන්වා දෙන ලදී. වසර තුළ ලද ක්ෂණික ඇමතුම් ගණන හා වට්ස් ඇප් පණිවිඩ ගණන පිළිවෙලින්, 1283 ක් සහ 783 ක් විය.

වගාකරුවන් සඳහා උපදේශන සේවා

නාක්ෂණ හුවමාරු අංශය

වසර තුළදී තාක්ෂණ උපදෙස් හා තොරතුරු ලබාගැනීම සඳහා, දුරකථන ඇමතුම් සහ ලිපි 800 ක් ලැබිණි. සාමාන්ය ඉල්ලීම් සහිත බොහෝ ලිපි, අදාළ ප්රදේශ වල සිටින පොල් වගා කිරීමේ මණ්ඩල ප්රාදේශීය කළමනාකාරවරුන්ගේ නිසි අවධානය හා කටයුතු සඳහා යොමු කරන ලදී. කොවිඩ් තත්ත්වය හේතුවෙන් රටේ පනවා තිබූ සීමා කිරීම් නොතකමින්, අංශය විසින්, ක්ෂේත්ර නිරීක්ෂණ 04 ක් සිදු කර නිසි නිර්දේශ ඇතුළත් කළ වාර්තා ද ලබා දෙන ලදී.

විශ්ලේෂණ සේවා

පාංශු සහ ශාක පෝෂණ අංශය

සේවාවන්	විශ්ලේෂණය කළ සාම්පල ගණන
ආන්තරික පොහොර නිර්දේශය (DFR)	19
කොහු නිෂ්පාදන	241
කාබනික පොහොර	15
අකාබනික පොහොර	15
ඉඩම් යෝග්යතා තක්සේරුව	16

වගාකරුවන්ට පුහුණු වැඩසටහන් ලබාදීම

ශෂ්‍ය විද්‍යා අංශය

පොල් සංවර්ධන නිලධාරීන් (CDO), විශ්වවිද්‍යාල සහ කෘෂිකාර්මික පාසල්/පාසල් සිසුන්, වැවිලි සමාගම් නිලධාරීන්, ගුරුවරුන් සහ පොල් වගාකරුවන් යනාදී කණ්ඩායම් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. තවද, පර්යේෂණ ව්‍යාප්ති සංවාද, ඵලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සහ අනෙකුත් අදාළ ව්‍යාප්ති ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික දායකත්වය ලබා දෙන ලදී.





රූපය 2. ක්ෂේත්‍ර ආදර්ශන

පාර්ශ්වකරුවන්ට සපයන සේවා

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පොල් සැකසුම් පර්යේෂණ අංශය මගින් විවිධ සාම්පල (වර්ජින් පොල් තෙල් සාම්පල 29ක්, සුදු පොල්තෙල් සාම්පල 29ක්, DC 17ක් සහ පුන්නක්කු සාම්පල 05ක්, ගාන ලද පොල් ගෙඩි 03ක්, වයින් 01ක්, විනාකිරි 02ක් සහ රා 493ක්) විශ්ලේෂණය කිරීමෙන් තම සේවාවන් පාර්ශවකරුවන් වෙත ව්‍යාප්ත කරන ලදී.

පොල් වතුර භාවිතයෙන් බීම නිෂ්පාදනය, පොල් අයිස්ක්‍රීම් නිෂ්පාදනය සහ පොල්තෙල් නිෂ්පාදනය සඳහා වූ තාක්ෂණය පාර්ශවකරුවන් විසින් ලබා ගන්නා ලදී. වර්ජින් පොල්තෙල්, සුදු පොල්තෙල් සහ පොල්වතුර වැඩි වශයෙන්ම ඉල්ලුම් කළ තාක්ෂණයන් විය. පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව ඉගෙනීමට උනන්දුවක් දක්වන අය සඳහා එක් දින පුහුණු සැසියක් පැවැත්විණි.



වර්ජින් පොල්තෙල් සහ සුදු පොල්තෙල් නිෂ්පාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණු කිරීම් ප්‍රශස්ත ව්‍යාපාර පහසුකම් මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

2021 ජාතික අස්වැන්න ඇස්තමේන්තු කිරීම සහ 2022 ජාතික අස්වැන්න පිළිබඳ පුරෝකථනය

ශාක කායික විද්‍යා සහ කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශ

2021 වසරේ ඇස්තමේන්තුගත ජාතික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3382.9 කි. එය 2020 වසරේ නිෂ්පාදනයට සාපේක්ෂව 20% ක පමණ වැඩිවීමකි (ගෙඩි මිලියන 2818.1). 2021 සඳහා පුරෝකථනය කරන ලද පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3353.1 ± 29.3 ක් වූ අතර එය ගෙඩි මිලියන 3,323.8 සිට උපරිම 3,382.4 දක්වා පරාසයක පවතී. එබැවින් සැබෑ නිෂ්පාදනය පුරෝකථනය කළ අගයට වඩා 1% ක් පමණක් වැඩි වූ අතර පිළිගත හැකි හොඳ පරාසයක් තුළ පැවතිණි.

ඉහත තොරතුරු සමග දිස්ත්‍රික් මට්ටමේ දේශගුණික පරාමිතීන් ද ඇතුළත් අත් පත්‍රිකාවේ එක් කලාපයක් මුද්‍රණය කර අදාළ නිලධාරීන්, වගාකරුවන් සහ ව්‍යවසායකයින් අතර බෙදා හරින ලදී. මීට අමතරව, ජාතික පොල් නිෂ්පාදනය පිළිබඳ ද්වි-මාසික යාවත්කාලීන කිරීම් සහ ඉතිරි මාස සඳහා පුරෝකථනයන් ඉල්ලීම මත සියලුම පාර්ශ්වකරුවන් වෙත විද්‍යුත් තැපෑල හරහා ලබා දෙන ලදී.

a



	Jan / Feb	Mar / Apr	May / Jun	Jul / Aug	Sep / Oct	Nov / Dec
Forecast 2021	529.4	546.9	684.5	624.8	538.2	429.3
ANCP 2021	470.63	580.86	634.30	619.18	562.56	515.39

b



	Jan / Feb	Mar / Apr	May / Jun	Jul / Aug	Sep / Oct	Nov / Dec
ANCP 2020	418.80	525.50	553.10	507.20	443.10	370.47
ANCP - 2021	470.63	580.86	634.30	619.18	562.56	515.39

රූපය 4. (a) 2021 සඳහා ද්විමාසික පදනම මත සත්‍ය වාර්ෂික ජාතික පොල් නිෂ්පාදනය (ANCP) සමඟ පුරෝකථනය සංසන්දනය කිරීම සහ (b) එය ANCP 2020 සමඟ සැසඳීම

කාලගුණ දත්ත සැපයීම

ශාක කායික විද්‍යා අංශය

පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ මධ්‍යස්ථාන පහක් (බණ්ඩිරිප්පුව වත්ත, රත්මලාගර වත්ත, හුදකලා බීජ උද්‍යානය, මාදුරුඔය බීජ උද්‍යානය සහ මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානය) විසින් වර්ෂාපතනය, වාතය සහ පාංශු උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය, සුළං ප්‍රවේගය සහ හිරු එළිය ඇති වේලාවන් පිළිබඳ දෛනික දත්ත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජාතික දත්ත ගබඩාවට ලබා දෙන ලදී. මාසික වර්ෂාපතන සහ උෂ්ණත්ව දත්ත වගාකරුවන්, කර්මාන්තකරුවන්, විද්‍යාඥයින්, සිසුන් සහ වෙන්නප්පුව, මහවැව, මාදම්පේ සහ දංකොටුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට (සම්පත් පැතිකඩ යාවත්කාලීන කිරීම සඳහා) ඔවුන්ගේ ඉල්ලීම් මත ලබා දෙන ලදී.



රූපය 5 - බණ්ඩිරිප්පුව වතුයායේ කෘෂි කාලගුණ විද්‍යා ස්ථානයේ දත්ත සටහන් කිරීම

අපනයන වෙළෙඳපොළ සඳහා තැඹිලි වල ආයු කාලය වැඩි දියුණු කිරීම සඳහා වන යාන්ත්‍රණය සැපයීම

ශාක කායික විද්‍යා අංශය

තැඹිලි වල ආයු කාලය වැඩි දියුණු කිරීම සඳහා සකස් කරන ලද යාන්ත්‍රණය වසර තුළ අපනයනකරුවන් 40 කට වැඩි පිරිසකට බෙදා හරින ලදී. ලෝකයේ රටවල් 25කට වැඩි ප්‍රමාණයකට තැඹිලි අපනයනය කිරීම පසුගිය වසරවල ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර එහි අපනයන පරිමාව මිලියන 6 ඉක්මවා ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුවද, 2021 වසරේ දී තැඹිලි අපනයනය ගෙඩි මිලියන 9.5 ඉක්මවමින් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර එමඟින් ඩොලර් මිලියන 900 ක පමණ ආදායමක් ලැබිණි.



රූපය 6 - පොල් පර්යේෂණ ආයතන විසින් සකස් කරන ලද යාන්ත්‍රණය භාවිතා කරමින් පසුගිය වසර 12 තුළ තැඹිලි අපනයනය කිරීම

අනෙකුත් ආයතන සහ පාර්ශවකරුවන් වෙත තොරතුරු සැපයීම

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

1. පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලයේ පර්යේෂණ දත්ත සමුදාය යාවත්කාලීන කිරීම සඳහා තොරතුරු සපයන ලදී.
2. ශ්‍රී ලංකා මහ බැංකුවට, ශ්‍රී ලංකා භාණ්ඩාගාරයට, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට තවත් බොහෝ ආයතන සහ පාර්ශවකරුවන්ට පොල් පිළිබඳ අවශ්‍ය සංඛ්‍යාලේඛන ලබා දී ඇත.
3. විවිධ අරමුණු සඳහා ඉවත් කරන ලද පොල් පැළවල වටිනාකම් සඳහා තක්සේරු වාර්තා ලබා දීම.
4. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අයවැය කතාව සහ පුස්තකාලය සඳහා පොල් පිළිබඳ ස්ථිතික සහ තොරතුරු ලබා දීම.
5. පොල් පදනම් වූ සමාජ-ආර්ථික සංඛ්‍යාලේඛන මධ්‍යස්ථානයක් ලෙස සේවය කරයි.
6. කර්මාන්ත අංශය සඳහා ප්‍රතිපත්ති නිර්දේශ නිකුත් කරන ලදී.
7. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලයට ඉදිරිපත් කරන ලද තොරතුරු දත්ත සමුදාය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම.

පොල් මයිටා හානිය මර්දනය කිරීම සඳහා විලෝපික මයිටාවන් අභිජනනය කිරීම

වගා සංරක්ෂණ අංශය

පොල් මයිටාවන් පාලනය කිරීම සඳහා වන විලෝපික මයිටාවන් අභිජනනය කර නිකුත් කිරීම 2021 වර්ෂයේ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රටේ පැවති සංචරණ සීමා නිසා මෙම විලෝපික මයිටා පැකට්ටු සඳහා පැවති ඉල්ලුම අඩු විය. කෙසේ වෙතත් පොල් පර්යේෂණ ආයතනය තුළ විලෝපික මයිටා පැකට් 30398 ක පමණ නිෂ්පාදනයක් සිදු කර ඇති අතර ඉන් 15390 ක පමණ ප්‍රමාණයක් වගාකරුවන් වෙත නිකුත් කර ඇත. මීට අමතරව පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB) මගින් පවත්වාගෙන යනු ලබන විලෝපික මයිටා විද්‍යාගාර සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශන කටයුතු ද වගා සංරක්ෂණ අංශය මගින් සිදුකරනු ලබයි. නමුත් පසුගිය වසර තුළ පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් CCB ආයතනයේ මෙම විද්‍යාගාර සඳහා වන නිරීක්ෂණ චාරිකා සිදුකිරීමට නොහැකි විය.

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය (WCLWD) රට තුළ ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ආරක්ෂිත කලාපයක් පවත්වා ගැනීම

වගා සංරක්ෂණ අංශය

රටෙහි පැවැති සංචරණ සීමා සහ ක්ෂේත්‍ර පරීක්ෂකවරුන් නිරෝධායනයට ලක්වීම් වැනි හේතූන් නිසා මෙම වැඩසටහනට නිතර බාධා ඇති වුව ද WCLWD නිසා හානිවූ ශාක ඉවත් කිරීමේ වැඩසටහන 2021 වසරේදීත් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. අක්කර 11457.88 ක වපසරියක පිහිටි 9839 ක ඉඩම් ප්‍රමාණයක් පොල් පර්යේෂණ ආයතනය මගින් පරීක්ෂා කරන ලදී. එහිදී රෝගී ශාක 694 ක් සලකුණු කළ අතර, ඉවත් කළ රෝගී ශාක ප්‍රමාණය 225 කි. රෝගී ශාක 85 ක් වල්නාශක එන්නත් කිරීම මගින් විනාශ කරන ලදී. තවද ක්ෂේත්‍ර පරීක්ෂකවරුන්ගේ වැටුප්වල ගෙවීම් සිදු කර ඇත. ඉවත් කරන ලද පොල් ගස් 212 ක් සඳහා අදාළ වන්දි මුදල් ද ගෙවා ඇත.

පොල් දළඹුවා මර්දනය කිරීම සඳහා අදාළ පරපෝෂිතයන් අභිජනනය කිරීම

වගා සංරක්ෂණ අංශය

දිවයිනේ බොහෝ ප්‍රදේශවලින් පොල් දළඹුවාගේ උග්‍ර ව්‍යාප්තියක් වාර්තා විය.මෙම පොල් දළඹු උග්‍ර ව්‍යාප්තිය පාලනය සඳහා අදාළ පරපෝෂිතයන් වගා සංරක්ෂණ අංශයේ කීටාගාර තුළ අභිජනනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. පොල් දළඹුවාගේ හානිය වාර්තා වූ වතු සඳහා පරපෝෂිතයන් 634790 ක ප්‍රමාණයක් නිදහස් කරන ලදී. විශේෂයෙන් පරපෝෂිතයන් මෙපමණ සංඛ්‍යාවක් නිදහස් කිරීම සිදු කරණු ලැබුවේ කොවිඩ් තත්ත්වය නිසා රට තුළ පැවැති සංචරණය සීමා මධ්‍යයයේය. පොල් දළඹුවාගේ උග්‍ර ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා කෘමිනාශක රට තුළ නොතිබුණද පරපෝෂිතයන් මුදාහැරීම් මගින් මෙම පළිබෝධකයා සැලකිය යුතු මට්ටමකට පාලනය කර ගත හැකි විය.

රතු කුරුමිණි පාලනය කිරීම සඳහා අදාළ පෙරමෝන සංස්ලේෂණය කිරීම සහ අලෙවි කිරීම

වගා සංරක්ෂණ අංශය

වගා සංරක්ෂණ අංශයේ විද්‍යාගාරය තුළදී රතු කුරුමිණි ආකර්ෂක පෙරමෝන සංස්ලේෂණය ක්‍රියාවලිය සිදු කර පෙරමෝන නළ 595 ක ප්‍රමාණයක් සහ වැඩිදියුණු කරන ලද පෙලිමය පෙරමෝන අඩංගු පැකට් 50 ක ප්‍රමාණයක් වගාකරුවන්ට සහ පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබා දී ඇත.

පුස්තකාල සේවා

කොවිඩ් වසංගතය හේතුවෙන් පුස්තකාල සේවාව විවෘත කර ඇත්තේ සීමිත දින ගණනකට පමණි. කෙසේ වෙතත්, තොරතුරු ඉල්ලීම් හැකිතාක් මාර්ගගත මාධ්‍යයන් හරහා සපයන ලදී. මීට අමතරව, ඉල්ලීම මත ඡායා පිටපත් කිරීමේ පහසුකම් සපයන ලදී.

ඉංජිනේරු සේවාවන්

වසර තුළ රු.මිලියන 12.0 ක් වූ 500KVA නව ජනකය ස්ථාපනය කිරීම ආරම්භ කළ අතර පහත සඳහන් ප්‍රධාන ප්‍රතිසංස්කරන හා නඩත්තු කටයුතු ඉංජිනේරු ඒකකය මඟින් සිදුකරන ලදී.

මූලධන වියදම් යටතේ සිදුකළ ඉදිකිරීම්

1. වර්ධක කුටි 12 ක් සැපයීම සහ ස්ථාපනය කිරීම

වතු අරමුදල් යටතේ සිදුකළ ඉදිකිරීම් / අලුත්වැඩියා කිරීම්

1. බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානයේ රු. මිලියන 1.9 ක් වූ ජල රැඳවුම් ව්‍යුහය ඉදිකිරීම
2. පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ රු. මිලියන 4.9 ක් වූ පරාග සැකසුම් රසායනාගාරයක් සහ කම්කරු විවේකාගාරයක් ඉදිකිරීම
3. කිනියම බීජ උද්‍යානයේ කාර්යාල රසායනාගාර ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම.

මීට අමතරව ගොඩනැගිලි, නිල නිවාස, වාහන, විදුලි රැහැන් නඩත්තු කටයුතු, වයු සමීකරණ හා දුරකථන ආදිය ඒදිනෙදා නඩත්තු වියදම් යටතේ නිම කරන ලදී.

ජාතික සහයෝගිතා වැඩසටහන

අවබෝධතා ගිවිසුම

පොල් සැකසුම් පර්යේෂණ අංශය හා ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

1. "ඇල්සයිමර් ඩිමෙන්ශියාවට ප්‍රතිකාර සඳහා නොයිඳුල් පොල් ගස් යොදාගෙන කෙරෙන සසම්භාවී පාලනය අත්හදා බැලීම" පිළිබඳ පර්යේෂණ සිදුකිරීම සඳහා කැළණි විශ්ව විද්‍යාලය සමග පොල් පර්යේෂණ ආයතනය ඇති කරගත් අවබෝධතා ගිවිසුම 2021 වසරේදී අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

2. "මිනිසුන්ගේ දෙවන වර්ගයේ දියවැඩියාව සුව කිරීම සඳහා නොයිඳුල් පොල් තෙල් යොදාගැනීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය" නම් පර්යේෂණ සිදු කිරීම සඳහා පේරාදෙනිය විශ්වවිද්‍යාලය සමග ඇති කරගත් අවබෝධතා ගිවිසුම 2021 වසරේදීද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

3. ශ්‍රී ලංකාවේ දේශීය පොල් වගා ප්‍රභේදයන්හි අර්ධ ලෙස තෙල් ඉවත් කරන ලද කුරුට්ටේ ඔක්සිකාරක හා ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරිත්වය පිළිබඳ පර්යේෂණ සිදුකිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය හා ජාතික මූලික අධ්‍යයන ආයතනය අතර අවබෝධතා ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

4. කොහුබත් වියැළීම සහ බ්‍රිස්ටල් කෙඳි ලබා ගැනීම සඳහා "සිලෝන් ඩ්‍රම්" යන්ත්‍රයට සමාන යන්ත්‍රයක් සෑදීම සඳහා පොල් පර්යේෂණ ආයතනය හා ජාතික ඉංජිනේරු පර්යේෂණ ආයතනය, අපනයන සංවර්ධන මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය හා කොහු කර්මාන්ත ආයතනය අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

5. කප්සුවය බීජපොල් නිපදවීම සඳහා බීජ උද්‍යානයක් පිහිටුවීම සඳහා පොල් පර්යේෂණ ආයතනය හා කුරුණෑගල වැවිලි සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

වතු කළමනාකරණ කටයුතු

වතු කළමනාකරණ අංශය

(බීජ පොල් උයන් / පර්යේෂණ මධ්‍යස්ථාන)

පොල් පර්යේෂණ ආයතනයේ වතු කළමනාකරණ අංශය වෙත කළමනාකරණය සඳහා පොල් ජාන සම්පත් මධ්‍යස්ථාන හතරක් සහ පර්යේෂණ මධ්‍යස්ථාන හතක් පවතී. පොල් පර්යේෂණ ආයතනය සතු මුළු වතු භූමි ප්‍රමාණය අක්කර 3,148 ක් වන අතර ඉන් අක්කර 1,980 ක් පොල් ජාන සම්පත් මධ්‍යස්ථාන ද අක්කර 1,168 පර්යේෂණ මධ්‍යස්ථාන ද වේ.

වතු කළමනාකරණ අංශය භාණ්ඩාගාර අරමුදල් මත පදනම් නොවී ස්වයං මූල්‍ය පාලන අංශයක් ලෙස සතුටුදායක මට්ටමෙන් පවත්වාගෙන යනු ලබයි.

දිවයිනේ ප්‍රධාන පොල් වගාකරන ප්‍රදේශ වල පොල් තවාන් සඳහා උසස් තත්ත්වයේ බීජ පොල් වර්ග ලබා දීම සඳහා ජාන සම්පත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම මෙම අංශයේ මූලික අරමුණ වේ. තවද, මෙම අංශය තුළින් පර්යේෂණ අංශයන්හි පර්යේෂණ කටයුතු සඳහා විවිධ තත්ත්වයන් යටතේ පහසුකම් සැපයේ. උදාහරණයක් ලෙස විවිධ පාංශු තත්ත්ව යටතේ, විවිධ කෘෂි පාරිසරික තත්ත්වයන් යටතේ විවිධ පොල් ප්‍රභේදවල වර්ධන අවධීන් යනාදියයි. තවද පර්යේෂණ ක්ෂේත්‍ර සඳහා ශ්‍රමය, ඉඩම්, ද්‍රව්‍ය, ආරක්ෂාව හා රැකවරණය වැනි පහසුකම් වතු කළමනාකරණ අංශය විසින් සපයනු ලැබේ.

තවද විද්‍යාඥයින් වතු කළමනාකරුවන්, පොල් වගාකරන්නන්, විශ්ව විද්‍යාල සිසුන් සහ කාර්මික විද්‍යාල හා පාසල් සිසුන් ද, වෙනත් උනන්දුවක් දක්වන පුද්ගලයින් සඳහා ද විවිධ වතු වල අතුරු භෝග ආදර්ශයන් පවත්වා ගැනීම තුළින් නව තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම සාර්ථකව සිදු කෙරේ.

පර්යේෂණ/ ජාන සම්පත් මධ්‍යස්ථානය	මූලික අරමුණ	අක්කර ප්‍රමාණය	ප්‍රකාශ
මාකඳුර පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	145	
රත්මලාගාර පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	251.1	
වල්පිට පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	40	
පොත්තුකුලම පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	194	
බණ්ඩිරිප්පුව පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	360.16	
මිද්දෙණිය පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	75.55	
තඹ්බෝව පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	6.96	
අඹකැලේ ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	347.8	වන ප්‍රදේශ 828 අක්
මාදුරුඔය ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	205.1	
පල්ලම ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	623	
වැලිගම ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	17.02	



රූපය 1 - 2012 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයේ පොල් පර්යේෂණ ආයතනය සතු වතු වල පොල් ඵලදාවේ විචලනය



රූපය 2 - 2020 සහ 2021 කාලපරිච්ඡේදය තුළ පොල් පර්යේෂණ ආයතනය සතු වතු වල මුළු පොල් නිෂ්පාදනය

2021 වර්ෂයේ දී සියළුම පොල් පර්යේෂණ ආයතනය සතු වතු වල මුළු පොල් ගෙඩි ඵලදාව මිලියන 5.13 කට ආසන්න විය. ප්‍රධාන වශයෙන් පොල් ගෙඩි ප්‍රමාණයක් අලෙවි කර ඇත්තේ පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද වෙන්දේසිය හරහා ය.

විවිධ වතු වල නිෂ්පාදන පිරිවැය (COP) සහ ශුද්ධ විකුණුම් අනුපාතය (NSA) පහත වගුවේ දක්වා ඇත. (2021)

වතු සියල්ලම සැලකූ විට පොල් ගෙඩියක නිෂ්පාදන පිරිවැය එක් පොල් ගෙඩියක් සඳහා රු.27.80 ක් වූ අතර, ශුද්ධ විකුණුම් අනුපාතය රු.55.69 ක් විය. සියළු වතු වල 2021 වසරේ ශුද්ධ ලාභය රු.මිලියන 161 ක් විය.



	Makandura	Bandiripuwa	Walpita	Rathmalagara	Poththukulama	Maduru Oya	Ambakelle	Middeniya	Pallama	Thabbowa
COP	32.13	26.96	28.15	33.17	19.27	17.45	25.23	39.33	27.35	28.91
NSA	50.65	54.44	51.68	47.48	56.77	64.4	67.92	49.97	57.40	56.22

රූපය 3 - පොල් පර්යේෂණ ආයතනය සතු වතුවල සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය සහ සාමාන්‍ය ශුද්ධ විකුණුම් අනුපාතය

වතු කළමනාකරණ අංශයේ ප්‍රධාන අරමුණු වලින් එකක් වන වැවිලි අංශයට අවශ්‍ය විවිධ වර්ගයේ ගුණාත්මක බීජ පොල් නිෂ්පාදනය කිරීම සඳහා අඹකැලේ, මාදුරුඔය සහ පල්ලම බීජ උයන් මෙම අංශය විසින් පාලනය කරනු ලැබේ.

ගෙවතු වගා ඉලක්ක කරගත් සංවර්ධන වැඩසටහන් සඳහා CRIC65 (DT) බීජ නිෂ්පාදනය කිරීම සඳහා අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානයේ සහ පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානයේ වෙනම කොටස් පවත්වාගෙන යනු ලැබේ. 2021 වර්ෂයේ දී පිළිවෙලින් CRIC 60 සහ CRIC 65 බීජ පොල් මිලියන 1.32 සහ 0.13 ප්‍රමාණයෙන් පොල් තවාන් සඳහා නිකුත් කරන ලදී. තව ද, අත් පරාගනය කිරීමේ වැඩසටහනේ නිෂ්පාදනයක් ලෙස, පිළිවෙලින් කප්රුවන, කප්සුවය, කප්සෙත, TMRD (CRISL 2020) සහ CRISL98 (TSR) යන බීජ පොල් 4063, 5505, 2299, 3184 සහ 12060 පොල් පර්යේෂණ ආයතනය පොල් තවාන් වෙත 2021 දී නිකුත් කරන ලදී.

CRISL 98 (T×SR) ප්‍රභේදය පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථායේ පමණක් නිපදවා ඇති අතර 2021 දී පොල් තවාන් සඳහා බීජ පොල් 12,060 ක් නිකුත් කරන ලදී.

මව් ශාක වලින් ලබා ගත් පොල් බීජ නිෂ්පාදනය කිරීම වල්පිට පර්යේෂණ මධ්‍යස්ථාන තුළ පමණක් සිදු කරන අතර බීජ පොල් 29,139 ක් 2021 වසරේදී පොල් පැළ තවාන් සඳහා නිකුත් කරන ලදී.

පොල් පර්යේෂණ ආයතනය පොල් තවාන් මගින් පොල් වගාකරුවන්ට උසස් ගුණාත්මක තත්ත්වයේ පොල් පැළ 113,329 ක් නිකුත් කර ඇත.

පොල් පර්යේෂණ ආයතනයේ වතු වල ගවයින්, මී හරකුන්, එළුවන් සහ බැටළුවන්ගේ සත්ත්ව ගොවිපළවල් පවත්වාගෙන යන ලදී. එය වතු වල කාබනික පොහොර සැපයීමට හා අඩු වියදමකින් වල් පැළෑටි පාලනය කිරීමට උපකාර වේ. සාමාන්‍ය සාම්ප්‍රදායිකව වල් නෙළීම, පොල් ලෙලි වලවල් කැපීම, සමෝච්ච කාණු කැපීම, පොල් වළවල් කැපීම, කෘමි උවදුරු පාලනය, වසුන් කිරීම, පොහොර යෙදීම වාරිමාර්ග සහ වැසි ජලය එක් රැස් කිරීමේ පොකුණු සාමාන්‍ය කාලසටහනට අනුව අනුගමනය කරන ලදී. සියළුම වතුවල පොල්ගස් 74% කට රසායනික පොහොර යොදන ලදී.



රූපය 4 - 2012 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය තුළ සියලුම පොල් පර්යේෂණ ආයතනය සතු වතු වල සමස්ත බීජ පොල් නිෂ්පාදනය.

හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බීජ පැළ	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
20575	46259	2073	3183	10813	961	3516	3599	23243

සියලුම වතු වල වාර්ෂික සංගණනයේ සාරාංශය

සංගණනයට අනුව මුළු ගස් ගහණය (පුරප්පාඩු ගස් හැර) 90,979 කි. මෙම සංගණන කාණ්ඩයෙහි ඵල නොදරණ, කණාටු සහ දුර්වල ගස් 8.87% පමණ වතු වලට ප්‍රතිලාභ නොදෙනු ඇත. අස්වැන්න ලබාදෙන ගස් (හොඳින් ඵල දරණ/ඵල දරණ/අර්ධ ඵල දරණ) මුළු එකතුවෙන් 75.74% ආවරණය වේ.



රූපය 5 - 2021 තුළ ගෙඩි 1000 කට සාමාන්‍ය වෙන්දේසි මිල උච්චාවචනය

කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා 2021 වර්ෂයේ මැයි මාසය දක්වා වෙන්දේසිය නොපවත්වන ලදී.

අඹකැලේ පොල් ජාන සම්පත් මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **IL1b**

අක්කර ප්‍රමාණය - 1175.8

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බීජ	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන	12302		475	1586	3810		523		1020
%	62.38		2.41	8.04	19.32		2.67		5.18
%	62.38		10.45		19.32	7.85			

වාර්ෂික සංගණනය



රූපය 6 - 2021 දී පොල් නිෂ්පාදනය



රූපය 7 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය

2021 වර්ෂය තුළ සමස්ත පොල් නිෂ්පාදනය මිලියන 1.3 ක් වූ අතර එය 2020 වසරට සාපේක්ෂව 23.3% ක වැඩි වීමකි. නිකුත් කරන ලද මුළු බීජ පොල් ගණන මිලියන 1.1 ක් විය.

වර්ෂය තුළ සමස්ත වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2078.7 ක් විය. වර්ෂය තුළ සාමාන්‍ය කෘෂිකාර්මික නඩත්තු කටයුතු සතුටුදායක ලෙස සිදු කරන ලදී. යල සහ මහ වැසි වලින් වාසි ලබාගනිමින් වතු යායේ ගස් 98% ක් ආවරණය වන පරිදි පොහොර යෙදීම සිදු විය. වල් නෙළීම, වසුන් කිරීම සහ වෙනත් සාම්ප්‍රදායික පිළිවෙත් නිසි පරිදි සිදු විය. මී ගවයින් 61 නිදැලි ක්‍රමයට යොදාගෙන අඩු වියදමින් තණකොළ, වල් පැළෑටි පාලනය කරනු ලැබේ.



රූපය 8 - මාසික වර්ෂාපතනය (මී.මී) 2021



රූපය 9 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය

පාලිත පරිසර ක්‍රමයෙන් CRIC 60 සහ CRIC 65 බීජ පොල් මහා පරිමාණයෙන් නිපදවන අතර කප්රුවන, CRISL 2020 බීජ වර්ග ද අත් පරාගණ තාක්ෂණයෙන් නිපදවනු ලැබේ. 2021 බීජ පොල් නිෂ්පාදනය පහත පරිදි වේ.



රූපය 10 - 2021 දී විවිධ ප්‍රභේද වල බීජ පොල් නිෂ්පාදනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	27.27	66.45
2021	25.23	67.92

පල්ලම පොල් ජාන සම්පත් මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **IL1b**

අක්කර ප්‍රමාණය - 623

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බීජ	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන	514	9325	598	507	1140	633	1088	1308	7877
%	2.23	40.56	2.6	2.2	4.95	2.75	4.73	5.68	34.26
%	42.79		4.8		4.95	47.42			

වාර්ෂික සංගණනය



රූපය 11 - 2021 වර්ෂයේ පොල් නිෂ්පාදනය



රූපය 12 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය

බීජ පොල් විශාල වශයෙන් නිෂ්පාදනය කිරීම සඳහා බීජ පොල් උයනක් ලෙස වත්තේ කොටසක් තවමත් සංවර්ධනය වෙමින් පවතී. අංක 7 ක්ෂේත්‍රයේ අක්කර 10 ක ප්‍රමාණයක් නැවත වගා කිරීම සඳහා සූදානම් කර ඇත. 2021 වර්ෂය තුළ ගෙඩි නිෂ්පාදනය 729,269 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 30.3% වැඩි වීමකි. නිකුත් කරන ලද මුළු බීජ පොල් ප්‍රමාණය 53,243 කි.

- TSR = 12,060
- TxDY = 29,942
- SRxDG (කජ්රුවින) = 1,846
- SRxDB (කජ්සෙත)) = 2,299
- Tx DB (කජ්සුවය) = 5,505
- SRxSR = 1,591

වත්තේ වාර්ෂික වර්ෂාපතනය මි.මී 1713.2 ක් විය.. එසේම සාමාන්‍ය කෘෂිකාර්මික නඩත්තු කටයුතු සතුටුදායක ලෙස සිදුකරන ලදී. වත්තේ ගස් 16.43% ක් ආවරණය කරමින් වාර්ෂික පොහොර යෙදීම සිදුවිය.



රූපය 13 - 2021 වර්ෂයේ මාසික වර්ෂාපතනය (මි.මී)



රූපය 14 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය



රූපය 15 - 2021 දී විවිධ බීජ පොල් නිෂ්පාදනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	48.12	52.27
2021	27.35	57.40

මාදුරුඔය පොල් ජාන සම්පත් මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **DL2b**

අක්කර ප්‍රමාණය - 205.1

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බිජ	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන	6245	1301		40	702	38		76	1845
%	60.95	12.69		0.4	6.85	0.37		0.74	18
%	73.64		0.4		6.85	19.11			

වාර්ෂික සංගණනය

පොල් නැවත සිටුවීමේ ජාතික වැඩසටහනට CRIC 60 පොල් බීජ නිෂ්පාදනය කිරීම සඳහා මාදුරුඔය බීජ උද්‍යානය 1985 දී ආරම්භ කරන ලදී. මෙය ඉන්දුනීසියානු වර්ගයේ බීජ පොල් උද්‍යානයක් වන අතර එය මහවැලි බී කලාපයේ පිහිටා ඇත. පොල් වගා කිරීමේ මණ්ඩලයේ තවාන් සහ ලියාපදිංචි පෞද්ගලික තවාන් සඳහා බීජ පොල් සැපයීම සඳහා මෙම බීජ උද්‍යානය නඩත්තු කරයි.

2021 වර්ෂයේ දී පොල් අස්වැන්න ගෙඩි 669,132 ක් වූ අතර එය 2020 වසරට සාපේක්ෂව 60% ක වැඩි වීමකි. වර්ෂය තුළ බීජ පොල් 336,858 ක් නිකුත් කර ඇත. සාමාන්‍ය හා කොන්ක්‍රීට් කාණු වාරිමාර්ග පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම නිසා බීජ උද්‍යානයේ ක්‍රියාකාරිත්වයට නියඟයෙන් බලපෑමක් සිදු නොවීය. අභිජනනය සඳහා සහ කිරි නිෂ්පාදනය සඳහා මී ගවයින් 98 ක් මෙම මධ්‍යස්ථානය විසින් නඩත්තු කරයි. 2021 වර්ෂය තුළ වර්ෂාපතනය මි.මී. 1733.2 කි. වල් නෙළීම, වසුන් යෙදීම සහ වෙනත් කෘෂිකාර්මික පිළිවෙත් නිසි පරිදි සිදු විය. මහ කන්නයේ වැසි වලින් වාසි ලබා ගනිමින් වතුයායේ ගස්වලින් 74% ක් ආවරණය වන පරිදි වාර්ෂිකව පොහොර යෙදීම සිදු විය.



රූපය 16 - 2021 වර්ෂයේ පොල් නිෂ්පාදනය



රූපය 17 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය



රූපය 18 - 2021 වර්ෂයේ මාසික වර්ෂාපතනය (මි.මී)



රූපය 19 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	28.98	49.63
2021	17.45	64.40

වැලිගම පොල් ජාන සම්පත් මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **WL2a**

අක්කර ප්‍රමාණය - 17.02

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බීජ	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන	2	37	19		316		31		15
%	0.48	8.81	4.5		75.24		7.39		3.58
%	9.29		4.5		75.24	10.97			

වාර්ෂික සංගණනය

මෙම වත්තේ මීට පෙර පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පොල් උයනක් ලෙස කළමනාකරණය කර ඇත. මෙම ඉඩම පොල් පර්යේෂණ ආයතනය විසින් 2016 වසර අවසානයේ බදු පදනම මත අත්පත් කර ගන්නා ලදී. 2017 දී WCLWD ව්‍යාපෘතියේ අරමුදල් මත සංවර්ධන කටයුතු කිහිපයක් ආරම්භ කරන ලදී. මෙම බීජ උද්‍යානය පිහිටුවීමේ මූලික පරමාර්ථය වූයේ මාතර වැලිගම ප්‍රදේශයේ වගාකරුවන්ට WCLWD ප්‍රතිරෝධී / දැරිය හැකි පොල් බීජ නිෂ්පාදනය කිරීමයි.

මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **IL1a**

අක්කර ප්‍රමාණය - 145

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බිප්	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන	121	5240			1354		19	155	2819
%	1.25	54			13.94		0.19	1.6	29.02
%	55.25				13.94	30.81			

වාර්ෂික සංගණනය



රූපය 20 - 2021 වර්ෂයේ පොල් නිෂ්පාදනය



රූපය 21 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය

මුළු අස්වැන්න ගෙඩි 368,154 ක් වූ අතර එය 2020 වසරට වඩා 31.75% ක වැඩි වීමකි. පශු සම්පත් නිෂ්පාදනය සම්බන්ධයෙන් ගත් විට මෙම මධ්‍යස්ථානය ගවයින් 03 දෙනෙකු සහ එළුවන් 02 නෙකු බෝ කිරීම සහ කිරි නිෂ්පාදනය කිරීමේ අරමුණින් නඩත්තු කරන ලදී. වර්ෂයේ වර්ෂාපතනය මි.මී. 2944.7 ක් විය. සාමාන්‍ය පොල් වගා ක්ෂේත්‍ර නඩත්තු කිරීම සතුටුදායක ලෙස වර්ෂය තුළ සිදු කරන ලදී.



රූපය 22 - 2021 වර්ෂයේ මාසික වර්ෂාපතනය (මි.මී)



රූපය 23 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	35.86	49.72
2021	32.13	50.65

බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **IL1a**

අක්කර ප්‍රමාණය - 360.16

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බිජ්	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන		10187	333	172	677	93	1321	442	436
%		74.56	2.44	1.25	4.95	0.69	9.66	3.24	3.2
%	74.56		3.69		4.95	16.79			

වාර්ෂික සංගණනය



රූපය 24 - 2021 වර්ෂයේ පොල් නිෂ්පාදනය



රූපය 25 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය

වර්ෂය තුළ පොල් අස්වැන්න 740,562 ක් වූ අතර එය 2020 ට සාපේක්ෂව 7.6% ක වැඩි වීමකි. වර්ෂයේ වර්ෂාපතනය මි.මී 3018 ක් විය. යල සහ මහ වැසි වලින් වාසි ලබා ගනිමින් වත්තේ මුළු ගස් වලින් 62% ක් ආවරණය කරමින් පොහොර යෙදීම සිදු කරන ලදී. වල් නෙළීම, වසුන් කිරීම සහ වෙනත් සම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් නිසි පරිදි සිදු විය. වර්ෂය තුළ මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කරන ලදී. ගවයින් 92 දෙනෙකු සහ මී ගවයින් 46 දෙනෙකුගෙන් සමන්විත ගවසම්පත් කිරි නිෂ්පාදනය සඳහා ඵලදායීව පවත්වාගෙන යන ලදී. කුලියාපිටිය-මීගමු මාර්ගයට යාබදව අංක 07 ක්ෂේත්‍රයේ පවතින තාක්ෂණ උද්‍යානය සාර්ථකව නඩත්තු කරන ලදී.



රූපය 26 - 2021 වර්ෂයේ මාසික වර්ෂාපතනය (මි.මී)



රූපය 27 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	28.24	48.96
2021	26.96	54.44

රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **IL1a**

අක්කර ප්‍රමාණය - 251.1

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බිප්	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන		9213	2	165	2002			1221	4867
%		52.73	0.01	0.94	11.45			7.19	27.85
%	52.73		0.95		11.45	35.04			

වාර්ෂික සංගණනය



රූපය 28 - 2021 වර්ෂයේ පොල් නිෂ්පාදනය



රූපය 29 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය

2014 සිට අස්වැන්න අඩුවීමේ රටාව නිරීක්ෂණය කළ විට 2017 සහ 2018 දී කැපී පෙනෙන අඩු වීමක් සිදුව ඇති අතර, පසුගිය වසර දහය තුළ අඩුම අස්වැන්න 2018 දී වාර්තා විය. මෙම තත්ත්වය අයහපත් කාලගුණයේ ඒකාබද්ධ බලපෑම වනු ඇත. වත්තේ ප්‍රධාන කොටසේ වයස්ගත ගස් පවතින අතර වගාව සඳහා ප්‍රධාන වශයෙන් සුදුසු පස් පවතිනුයේ ද ආන්තිකවය. 2021 වර්ෂයෙහි පොල් අස්වැන්න අධීක්ෂණය කළ විට පොල් ගෙඩි 378,502 ක අස්වැන්නක් වාර්තා වූ අතර එය 2020 ට සාපේක්ෂව 91% ක වැඩි වීමකි. 2021 වර්ෂය තුළ වර්ෂාපතනය මි.මී. 2037.2 ක් විය. ගවයින් 11 ක්, එළුවන් 17 ක්, බැටළුවන් 40 ක් සහ කිකිළියන් 12 දෙනෙකුගෙන් සමන්විත පශු සම්පත් ඵලදායීව නඩත්තු කරන ලදී. වත්තේ මුළු ගස් වලින් 77% ක් ආවරණය කරමින් පොහොර යෙදීම සිදු කරන ලදී. වල් නෙලීම, වසුන් කිරීම සහ වෙනත් සාම්ප්‍රදායික පොල් වගා ක්ෂේත්‍ර පිළිවෙත් නිසි පරිදි සිදු විය.



රූපය 30 - 2021 වර්ෂයේ මාසික වර්ෂාපතනය (මි.මී)



රූපය 31 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	59.52	42.99
2021	33.17	47.48

පොත්තුකුලම පර්යේෂණ මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **IL1b**

අක්කර ප්‍රමාණය - 194

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බිජ	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන	232	8317	57	33	31		529	362	3964
%	1.71	61.5	0.43	0.25	0.22		3.91	2.67	29.31
%	63.21		0.68		0.22	35.89			

වාර්ෂික සංගණනය



රූපය 32 - 2021 වර්ෂයේ පොල් නිෂ්පාදනය



රූපය 33 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය

පොත්තුකුලම පර්යේෂණ මධ්‍යස්ථානයේ පොල් අස්වැන්න 637,728 ක් වූ අතර එය 2020 වර්ෂයට සාපේක්ෂව 12% ක වැඩි වීමකි. 2021 වර්ෂයේදී ද මි.මී. 1767.1 ක වර්ෂාපතනයක් ලැබී තිබේ. මෙම වත්ත පර්යේෂණ කටයුතු සඳහා පමණක් භාවිතා කරන අතර මිටි ප්‍රභේද එකතුවක් වෙනම ආදර්ශයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. සාමාන්‍ය කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සාර්ථකව සිදු විය. වත්තේ මුළු ගස් වලින් 76% ක් ආවරණය කරමින් පොහොර යෙදීම සිදු කරන ලදී. වර්ෂය තුළ ගවයින් 60 ක් සහ මී හරකුන් 16 ක් නඩත්තු කරන ලදී. වල් නෙළීම, වසුන් යෙදීම සහ වෙනත් පොල් ක්ෂේත්‍ර කටයුතු නිසි පරිදි සිදු විය. අතුරු භෝග වගාවක් ලෙස අක්කර 1 ක කහ වගා කරන ලදී.



රූපය 34 - 2021 වර්ෂයේ මාසික වර්ෂාපතනය (මි.මී)



රූපය 35 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	21.18	47.04
2021	19.27	56.77

වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **WL3**

අක්කර ප්‍රමාණය - 40

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බිජ	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන	819		540	520	50	197		35	400
%	31.9		21.08	20.3	1.95	7.69		1.36	15.61
%	31.9		41.38		1.95	24.66			

වාර්ෂික සංගණනය



රූපය 36 - 2021 වර්ෂයේ පොල් නිෂ්පාදනය



රූපය 37 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය

මෙම පර්යේෂණ මධ්‍යස්ථානය විශේෂයෙන්ම පොල් ප්‍රභේද සහ අතුරු භෝග ආදර්ශන කටයුතු සඳහා පවත්වාගෙන යනු ලැබේ. මෙම වත්තේ 2021 දී වාර්ෂික අස්වැන්න 126,119 ක් වූ අතර එය 2020 වර්ෂයට සාපේක්ෂව 19.04% ක වැඩි වීමකි. එම වර්ෂයේ වර්ෂාපතනය මි.මී 2464.3 කි. ඉහත අස්වැන්නෙන් බීජ පොල් ලෙස 29,139 ක් නිකුත් කරන ලද අතර ඒවා තෝරාගත් මව් ශාක වලින් වෙන වෙනම එකතු කරන ලදී. වල් නෙළීම, වසුන් යෙදීම සහ වෙනත් සම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් නිසි පරිදි සිදු විය. අතුරු භෝග වගාවක් ලෙස අක්කර 1 ක කහ වගාවක් සහ අක්කර 1 ක කුරුඳු වගාවක් ස්ථාපනය කරන ලදී. අලුත් පොල් පැළ 100 ක වගාවක් ස්ථාපනය කරන ලදී.



රූපය 38 - 2021 වර්ෂයේ මාසික වර්ෂාපතනය (මි.මී)



රූපය 39 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	34.81	42.56
2021	28.15	51.68

මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **IL1b**

අක්කර ප්‍රමාණය - 75.55

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බිජ	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන		2633		113	722				
%		75.92		3.25	20.81				
%	75.92		3.25		20.81				

වාර්ෂික සංගණනය



රූපය 40 - 2021 වර්ෂයේ පොල් නිෂ්පාදනය



රූපය 41 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය

මෙම පර්යේෂණ මධ්‍යස්ථානය නව ප්‍රභේද පිහිටුවීමත් සමඟ තවමත් සංවර්ධනය වෙමින් පවතින තත්ත්වයේ පවතී. විවිධ වගාවන්වල පොල් බීජ 3,468 ක් ස්ථාපිත කර ඇති අතර, ඉන් 80% ක්ම වර්ථමානයේ ඵල දරණ මට්ටමේ පවතී. ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ මහජනයාට විවිධ පොල් ප්‍රභේද නිරූපණ සහ ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම සහ නව තාක්ෂණික දැනුම බෙදා හැරීමේ දී මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානය වැදගත් වේ. වතුයාය 2021 දී පොල් 144,230 ක වාර්ෂික අස්වැන්නක් ලබා දුන් අතර එය 2020 ට සාපේක්ෂව 11.1% ක පමණ වැඩි වීමකි. වර්ෂයේ වර්ෂාපතනය මි.මී. 996 කි. වර්ෂය තුළ සාමාන්‍ය කෘෂිකාර්මික නඩත්තු කිරීම සතුටුදායක ලෙස සිදු කරන ලදී. එසේම සියලුම ගස් ආවරණය කරමින් වාර්ෂික පොහොර යෙදීම සිදු විය. මෙම වර්ෂයේදී අක්කර 2 ක භූමියක කහ වගාවක් ස්ථාපනය කරන ලදී.



රූපය 42 - 2021 වර්ෂයේ මාසික වර්ෂාපතනය (මි.මී)



රූපය 43 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	41.17	47.92
2021	39.33	49.97

තබ්බෝව පර්යේෂණ මධ්‍යස්ථානය

කෘෂි පාරිසරික කලාපය - **IL1a**

අක්කර ප්‍රමාණය - 6.96

විස්තරය	හොඳින් ඵලදරණ ගස්	ඵලදරණ ගස්	අර්ධ ඵලදරණ ගස්	තරුණ ගස්	බිජ	ඵල නොදරණ ගස්	කණාටු ගස්	දුර්වල ගස්	පුරප්පාඩු
ගස් ගණන	340		49	47	9				
%	76.4		11.01	10.56	2.03				
%	76.4		21.57		2.03				

වාර්ෂික සංගණනය



රූපය 44 - 2021 වර්ෂයේ පොල් නිෂ්පාදනය



රූපය 45 - පසුගිය වසර වල පොල් ඵලදාවේ විචලනය

මෙම පර්යේෂණ මධ්‍යස්ථානය විශේෂයෙන් නඩත්තු කරනු ලැබුවේ අතුරු භෝග ආදර්ශන කටයුතු සඳහාය. තඹ්බෝව පර්යේෂණ මධ්‍යස්ථානය විසින් 2021 වර්ෂයේ ගෙඩි 36,367 ක වාර්ෂික අස්වැන්නක් ලබා දී ඇති අතර එය 2020 ට සාපේක්ෂව 27% ක වැඩි වීමකි. වර්ෂය තුළ වර්ෂාපතනය මි.මී. 1763.6 කි. වල් නෙළීම, වසුන් යෙදීම සහ වෙනත් සම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් වර්ෂය තුළ සතුටුදායක ලෙස සිදු කරන ලදී. සියලුම ගස් ආවරණය කරමින් වාර්ෂික පොහොර යෙදීම සිදු විය.



රූපය 46 - 2021 මාසික වර්ෂාපතනය (මි.මී)



රූපය 47 - පසුගිය වසරවල වාර්ෂික වර්ෂාපතනයේ විචලනය

	COP / Nut (Rs)	NSA / Nut (Rs)
2020	29.40	43.30
2021	28.91	56.22

කාර්ය මණ්ඩලය

පොල් පර්යේෂණ ආයතනයේ
කාර්ය මණ්ඩලය

සභාපති	**වෛද්‍ය සාරංග අලහප්පෙරුම**
අධ්‍යක්ෂ	**සනාතනී රණසිංහ මිය** *B.Sc. (Sci), Ph.D* *(University of Sussex, United Kingdom)*
අතිරේක අධ්‍යක්ෂ	**ඒ. ඒ. එෆ්. එල්. කේ. පෙරේරා මයා** *B.Sc. (Agric), Ph.D.* *(University of Dundee, Scotland)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	**එන්. එස්. ආරච්චිගේ මිය** *B.Sc (Agric), Ph.D* *(University of Amsterdam, Netherlands)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	**කේ. ඒ. එල්. කුරුප්පු මයා** *B. Com, MBA* *(University of Gowa , India)* *MPA (University of Sri Jayewardenepura)*
ජ්‍යේෂ්ඨ ගණකාධිකාරී	**ආර්. එම්. යූ. චන්ද්‍රනාත් මයා** *B.Sc [Management (Public)], MBA.* *(Wayamba University), CPFA*

ශෂ්‍ය විද්‍යා අංශය

අයි. එම්. එස්. කේ. ඉදිරිසිංහ - අංශ ප්‍රධානී (වැඩ බලන)

B.Sc (Agric), M.Sc (Peradeniya), Ph.D (Tomas Bata University, Czech Republic)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

- ඒ.ඒ.ඒ.පේ අතපත්තු B.Sc. (Agric), Ph.D (University of Chinese Academy of Sciences)

පර්යේෂණ නිලධාරී

- එස්. එස්. උඩුමාන් මිය, B.Sc (Agric)
- ඩී. කේ. ආර්. පී. එල්. දිසානායක මිය , B.Sc. in Agricultural Technology and Management
- ටී. ඩී. නුවරපක්ෂ, B Sc (Agric.)

පර්යේෂණාත්මක නිලධාරී

- පී.පී.පී ප්‍රනාන්දු (Graduate Chemist)
- පේ.ඒ.ඒ ගුණසේකර, Dip. (Agric)

තාක්ෂණ නිලධාරී

- ඩබ්. එම්. නුවන් , HNDT (Agric)
- කේ. පී.ඒ. ජයමාලි මිය B.Sc. Food Science & Nutrition
- කේ.ආර්.එම්.පී. ගයාදරී මෙනවිය Dip (Animal Husbandry)
- කේ. ඒ. ටී. කුමාරී මෙනවිය, HNDT (Agric)
- ටී. එම්. එන්. කේ. ගුණාරත්න, HNDT (Agric)

කළමනාකරණ සහකාර

- ඩී. ටී. ඩී. ධනපාල මිය

රසායනාගාර ක්ෂේත්‍ර සහකාර

- එච්. එස්. පී. ද. සිල්වා
- එස්.එම්. ආර්. සී. සුභසිංහ

පොදු සේවක(කාර්යාල සහය සේවක)

- එස්. ඒ. කේ. සංජීව

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

එච්. ඩී. එම්. ඒ. සී. දිසානායක මෙනවිය - අංශ ප්‍රධානී (වැඩ බලන)

B.Sc (Agric), M.Sc, Ph.D (University of Tsukuba, Japan)

පර්යේෂණ නිලධාරී

- එස්. ඩබ්. පී. සී. ආර්. කුමාර, B.Sc (Agric), M.Sc (Environmental Forestry)
- පී. ආර්. වීරසිංහ මිය , B.Sc. Botany
- එම්. පී. ඕ. එස්. තිලකරත්න, B.Sc (Agric. Tech. Mgt)

බීජ හා බීජ පැළ නිෂ්පාදන සහතික කිරීමේ නිලධාරී

- එල්. එම්. එස්. ආර්. ජයතිලක, B.Sc (Sci), M.Sc (Agric)

බීජ හා බීජ පැළ නිෂ්පාදන සහතික කිරීමේ සහකාර

- පී. පී. ආර්. එස්. ප්‍රේමතිලක, B.Sc (Agric)
- ආර්. අයි. බී. සී. ටී. හේරත්, B.Sc (Agric), M.Sc (Crop Science)
- එම්. එන්. නදීරංග, B.Sc (Agric)
- ආර්. සී. එම්. විජයරත්න, B.Sc (Agric)
- එල්. ජේ. සමන්, B.Sc (Agric)
- ඒ. එස්. ජයසුන්දර, B.Sc (Agric)
- ඩී. එම්. එල්. අමරසිරි, B.Sc (Agric)
- පී ක්‍රිෂාන්ත් , B.Sc. in Food Production & Technology Management
- බී. එච්. එන් එම්. ආර්. ගුණසේන, B.Sc (Agric)

පර්යේෂණාත්මක නිලධාරී

- එච්. එම්. එන්. බී. හේරත් , B.Sc. Plantation Management
- ඒ. ඒ. ප්‍රනාන්දු, Dip. (Agric)
- එස්. ඒ. එස්. චන්ද්‍රසිරි , BIT

තාක්ෂණ නිලධාරී

- යූ.ඩී. සී. එස්. කුමාර, HNDT (Agric)
- එම්. එම්. හෙට්ටිආරච්චි, Dip. (Food Technology)
- එම්. ඒ. එස්.. පී. ජයසිංහ, B.Sc. in Agriculture
- බී. එම්. ඒ. යූ. අමරතුංග මිය, Graduate Chemist

කළමනාකරණ සහකාර

- එස්. එස්. ආර්. ප්‍රනාන්දු මෙනවිය , Dip. (Management)

රසායනාගාර ක්ෂේත්‍ර සහකාර

- එස්. එම්. ටී. ආර්. සේනාරත්න
- ඩබ්. ඩී. යූ. ප්‍රනාන්දු මෙනවිය
- යූ. එම්. සී. සී. බී. සමරකෝන්

ජ්‍යෙෂ්ඨ රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- ඩබ්. විමලසිරි

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- පී. ඩී. ඒ. මිල්රෝයි
- ජේ. එම්. ඒ. එස්. කුමාර
- එම්. එම්. ටී. කුමාර
- ආර්. ඩී. ඒ. ලෙනාඩ්

පොදු සේවක (කාර්යාල සහය සේවක)

- ඩී. එම්. ආර්. චාන්දනී මිය

පාංශු හා ශාක පෝෂණ අංශය

එන්. පී. ඒ. ඩී. නයිනානායක - අංශ ප්‍රධානී (වැඩ බලන)
B.Sc (Sci), M.Phil (Peradeniya) Ph.D (University of Essex, UK)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

- එම්. කේ. එෆ්. නධීෂා මෙනවිය, B.Sc (Chemistry), M.Sc (Food Technology)

පර්යේෂණ නිලධාරී

- පී. එස්. නිරුක්ෂාන් මිය, B.Sc (Agric), M Phil. (Environmental Soil Science)*
- ඩී. එම්. ඩී. පී. දිසානායක මෙනවිය, B.Sc (Agric. Tech. Mgt)**
- බී. එච්. ආර්. ප්‍රනාන්දු මෙනවිය ,B.Sc. Agricultural Technology & Management
- ඒ.එ.ආර්.ඩබ්. අබේසිංහ මිය, BSc. in Agric. Resource Mgt & Tech.

පර්යේෂණාත්මක නිලධාරී

- කේ. පී. අයි. ඊ. අෂගල, Dip. (Agric)
- කේ. පී. ඒ. පතිරණ, Dip. (Agric)
- බී. එස්. වී. පේ. පෙරේරා, Dip. (Agric)
- එච්. එල්. ඒ. පත්මිනී මිය, Dip. (Agric)

තාක්ෂණ නිලධාරී

- කේ. ඩී. සී. ප්‍රේමරත්න මෙනවිය , HND. (Agric. Production Technology)
- ආර්. කේ. කේ. එච්. ජේ. ජයසිංහ මිය , Dip. (Agric)
- කේ. එම්. පී. සී. වර්ණාසූරිය, HND. (Agric. Production Technology)
- ඩී. සී. ඩී. පෙරේරා, HNDT (Agric)
- එස්. ඩී. වයි. නුවන්තිකා මෙනවිය , HND. (Agric. Production Technology)

කළමනාකරණ සහකාර

- ටී. එම්. ඩී. අබේරත්න මිය

රසායනාගාර ක්ෂේත්‍ර සහකාර

- එම්. ඩී. පී. මානතුංග

ජ්‍යෙෂ්ඨ රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- ඊ. ඒ. චන්ද්‍රදාස
- ආර්. එම්. එන්. සඳසිරි

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- ඩබ්. ආර්. පී. තිසේරා
- එල්. එම්. පී. ඩී. ලියනගේ
- එම්. ඒ. පී. පතිරාජ
- ටී. ඒ. එස්. ආර්. පී. තේනුවර

වගා සංරක්ෂණ අංශය

පී.ඩබ්.පී.ආර්. ද සිල්වා - අංශ ප්‍රධානී (රාජකාරී ආවරණ)

B.Sc (Agric)

පර්යේෂණ නිලධාරී

- එන්. අයි. සුවඳරත්න මිය, B.Sc (Agric), M.Sc (Zoological Science)
- ඩී. එච්. දිල්රුක්ෂි මිය, B.Sc (Agric. Tech. Mgt)
- ඩී. පී. එම්. සිල්වා, B.Sc. in Science

පර්යේෂණාත්මක නිලධාරී

- පී. එච්. ඒ. පී. සිරිවර්ධන මෙනවිය, B.Sc (Agric)
- එස්. පී. මනෝජ්

තාක්ෂණ නිලධාරී

- එන්. ටී. එම්. විජේවර්ධන, HNDT (Agric)
- ටී. බී. කේ. එච්. නෙරන්ජන, HNDT (Agric)
- පී. ඒ. එන්. පී. පෙරේරා මිය, HNDT (Agric)
- ඒ. ඩී. ටී. ද සිල්වා කුලසිංහ මෙනවිය, HNDT (Agric)
- ඊ. එම්. එන්. මධුවන්ති මිය, Dip. (Plantation Management)

රසායනාගාර ක්ෂේත්‍ර සහකාර

- සී. ඩබ්. එස්. පී. යාපා
- සී. ඒ. එන්. ඇන්තනී මිය
- පී. ඒ. එස්. නුවන්ප්‍රිය
- එම්. ඒ. ඩී. පී. මධුරප්පෙරුම

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- ආර්. කේ. එම්. එස්. එන්. රාජපක්ෂ
- කේ. එම්. පී. සී. කුමාරසිංහ
- ඒග එම්. පී. සංජය
- ඒ. එම්. පේ. එන්. අර්ථනායක මිය

පොදු සේවක(කාර්යාල සහය සේවක)

- කේ. ඒ. එම්. ඉන්දික

පටක රෝපණ අංශය

වී. ආර්. එම්. විදානාරච්චි මිය - අංශ ප්‍රධානී

B.Sc (Agric), Ph.D (University of Kagoshima, Japan)

පර්යේෂණ නිලධාරී

- එස්. පී. එන්. සී. ජයරත්න මිය B.Sc. in Botany
- එම්. ටී. එන්. ඉන්ද්‍රවාපා මෙනවිය, B.Sc. in Science

පර්යේෂණාත්මක නිලධාරී

- ටී. ආර්. ගුණතිලක මිය, Dip. (Sci)
- පී, පී. කේ. පෙරේරා මිය B.Sc. in Agriculture

තාක්ෂණ නිලධාරී

- ආර්. එම්. එස්. එස්. රත්නායක මිය, Dip. (Agric)
- කේ. ඒ. ඩී. ආර්. සී. කොඩිකාර, HNDT (Agric)

රසායනාගාර ක්ෂේත්‍ර සහකාර

- ආර්. එම්. කේ. පී. එස්. දිසානායක මිය

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- ජේ. ඒ. එස්. එල්. ජයසිංහ
- ආර්. එස්. එන්. කුමාර
- කේ. පී. ඒ. සංජීවනී මෙනවිය

පොල් සැකසුම් පර්යේෂණ අංශය

එල්. එල්. ඩබ්. සී. යාලේගම මිය - අංශ ප්‍රධානී

B.Sc (Chem), M.Sc (India), Ph.D (Peradeniya)

පර්යේෂණ නිලධාරී

- එච්. පී. ඩී. ටී. හේවාපතිරණ මෙනවිය, B.Sc. (Agric)

පර්යේෂණ නිලධාරී (රසායනික ඉංජිනේරු)

- ජේ.ඒ.කේ.එම් ප්‍රනාන්දු මිය, B.Sc (Engineering)

පර්යේෂණාත්මක නිලධාරී

- එස්. එස්. රාජපක්ෂ Dip. (Agric)
- ටී. එම්. එස්. පී. වීරසිංහ මිය, Dip. (Agric)

තාක්ෂණ නිලධාරී

- ජේ. ඒ. ඩී. මධුසංඛ , HNDT (Agric)
- සී. ඒ. ටී. ඩී. චන්ද්‍රපේලී මිය, HNDT (Agric)
- එම්. අයි. සේනාරත්න මිය, Dip (Agric)
- ඒ. එම්. එල්. සිල්වා මිය, Dip (Agric)
- ඩී. ඩබ්. එල්. ලිල්රුක්ෂ, HND. (Agric. Production Technology)

රසායනාගාර ක්ෂේත්‍ර සහකාර

- එස්. එච්. කේ. පී. කුමාරසිරි මිය
- එන්. ඒ. සී. උදයසිරි
- ඩී. සී. එස්. සඳමාලි මිය
- එච්. ඩී. පේ. කේ. ජයසේකර

පොදු සේවක (කාර්යාල සහය සේවක)

- ඒ. ඒ. සී. ධම්මික

ශාක කායික විද්‍යා අංශය

එන්. පී. ඒ. ඩී. නයිනානායක - අංශ ප්‍රධානී

B.Sc (Sci), M.Phil (Peradeniya), Ph.D (University of Essex, UK)

ප්‍රධාන පර්යේෂණ නිලධාරී

- කේ. පී. වෛද්‍යරත්න මිය, B.Sc (Agric), Ph.D (Lincoin University, New Zealand)

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

- එම්. ඩී. පී. කුමාරතුංග, B.Sc (Agric), PhD (Westerb Sydney University)

පර්යේෂණ නිලධාරී

- ටී. එච්. චන්ද්‍රතිලකා මෙනවිය , B. Sc (Sci)

පර්යේෂණාත්මක නිලධාරී

- ඩබ්. ඒ. එස්. වික්‍රමාරච්චි
- ඒ. පී. සී. ප්‍රදීප්, Dip. (Agric)

තාක්ෂණ නිලධාරී

- පී. ඒ. එම්. සමන්ති මිය, Dip. (Agric)

ජ්‍යෙෂ්ඨ රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- ජේ. එච්. යූ. ජයමහ

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- එච්. ඒ. සී. පී. හෙට්ටිආරච්චි
- එච්. එම්. එස්. නයනකුමාර
- ටී. එස්. අබේරත්න මිය

පොදු සේවක (කාර්යාල සහය සේවක)

- ජේ. ඒ. ආර්. මලින්ත

කෘෂි ආර්ථික හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

අයි. එම්. එස්. කේ. ඉදිරිසිංහ - අංශ ප්‍රධානී

B.Sc (Agric), M.Sc (Peradeniya), Ph.D (Tomas Bata University, Czech Republic)

ජ්‍යෙෂඨ පර්යේෂණ නිලධාරී

- කේ. වී. එන්. එන්. ජයලත් මිය, B.Sc (Agric),Mphil(Queensland, Australia)

පර්යේෂණ නිලධාරී

- පී. එම්. එම්. ප්‍රනාන්දු මෙනවිය, BSc. in Export Agri.

තාක්ෂණ නිලධාරී

- එම්.ඒ.එන්.ඒ කුමාර, Dip. (Plantation Mgt.)
- ඒ. එම්. ටී. බී. අමරසේකර, HNDT (Agric)
-

රසායනාගාර ක්ෂේත්‍ර සහකාර

- ඩබ්. ඒ. එස්. ප්‍රනාන්දු මෙනවිය
- එස්. එම්. ඒ. චිරන්ති මෙනවිය

තාක්ෂණ භූවමාරු අංශය

සී. එස්. හේරත් - අංශ ප්‍රධානී

B.Sc (Agric), M.Sc (Peradeniya), Ph.D (Tomas Bata University, Czech Republic)

තාක්ෂණ භූවමාරු නිලධාරී

- එච්. ඩී. එන්. එච්. ෆොන්සේකා මිය, B.Sc (Agric), M.Sc (Peradeniya)
- කේ. එම්. ආර්. ටී. විජේකෝන්, B.Sc (Botany), M.Sc (Peradeniya)
- ඩබ්. ජී. ආර්. සුභත්මා මිය, B.Sc (Agric), M.Sc (Ruhuna)

පර්යේෂණාත්මක නිලධාරී

- සී. පී. ඒ. කුරුඳුකුඹුර මිය, B.Sc (Agric)

පර්යේෂණාත්මක නිලධාරී (දෙමළ මාධ්‍යය)

- පී. මයුරන්, B.Sc. in Science & Tech.

ව්‍යාප්ත නිලධාරී

- ඒ. එම්. ටී. බණ්ඩාරනායක, B.Sc (Agric), M.Sc (Agric) (Peradeniya)

තාක්ෂණ නිලධාරී

- එම්. ඩී. එම්. පෙරේරා , Dip. (Plantation Management)

ජ්‍යෙෂ්ඨ රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- එන්. ඒ. ඩබ්. ජයසිරි

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- ඩබ්. එස්. එස්. ප්‍රනාන්දු මිය
- පේ. ඒ. එස්. නිරෝෂන්

පොත් බැඳුම්කරු

- අයි. එච්. ඩී. සෙනරත්

ජ්‍යෙෂ්ඨ පොදු සේවක(කාර්යාල සහය සේවක)

- කේ. ඒ. එස්. සී. එන්. ප්‍රනාන්දු
- පොදු සේවක(කාර්යාල සහය සේවක)
- එස්. ඒ. ඒ. විරාජ්
- ඩී. එම්. ටී. සම්පත්

පුස්තකාලය

පී. ඩී. යූ. සී. ධර්මපාල මිය - පුස්තකාලයාධිපති

FELE, BLE

කළමනාකරණ සහකාර

- පේ. ඒ. ඩී. ආර්. යූ. ජයසිංහ මිය

පොදු සේවක (කාර්යාල සහය සේවක)

- එච්. ඒ. ටී. තිලකුමාරි මිය

සංස්ථාපන ඒකකය

සී. පී. ඩී. ප්‍රනාන්දූ - සහකාර අධ්‍යක්ෂ (පාලන)

B.Sc. (Business Administration)

ප්‍රසම්පාදන නිලධාරී
- එම්. සී. එච්. එන්. ප්‍රනාන්දු, PGDHRM(Col), BLE(Col), AMISMM

සභාපතිගේ පෞද්ගලික සහකාර
- එච්. එම්. ඒ. හේරත් මිය

පරිපාලන නිලධාරි
- කේ. පී. එස්. ජයතිලක මිය, Dip. (HRM)

මානව සම්පත් නිලධාරි
- ඩබ්. එස්. ආර්. ප්‍රනාන්දු මිය, Dip. (HRM)

කළමනාකරණ සහකාර
- ඩබ්. එම්. එස්. ලෝව්
- පී. සී. පී. කේ. ප්‍රනාන්දු B.Com
- පී. ඩී. කත්‍රිආරච්චි
- ඩබ්. ඒ. එච්. ෂෙනාලි මිය, AAT
- එම්. ඒ. එන්. දිල්රුක්ෂි මිය, BA (Special)
- යූ. ඒ. ඩී. එන්. කේ. චතුරානී මිය , HND (IT)
- පී. ඩී. වික්‍රමනායක මිය
- ඩබ්. එම්. එස්. එම්. රත්නායන මිය

පිළිගැනීමේ නිලධාරි / දූරකථන ක්‍රියාකරු
- ඒ. පී. නල්ලපෙරුම මෙනවිය

රසායනාගාර ක්ෂේත්‍ර සහකාර
- ඩබ්. එම්. එම්. ගිහාන්

රසායනාගාර ක්ෂේත්‍ර සේවක
- ආර්. ඒ. පී. ජයමාන්න මිය

ආගන්තුක නිවාස භාරකරු
- කේ. කේ. ඒ මෙන්ඩිස්

රියදුරු
- කේ. පී. එස්. දිසානායක
- අයි. පී. කේ. පී. පෙරේරා
- පී. පී. පී. එස්. කරුණාරත්න
- එච්. එම්. ජයතුංග
- ඊ. පී. එන්. බණ්ඩාර
- ඊ. පී. ඒ. පී. පිනදාස
- ටී. පී. පේ. චමේන්ද්‍ර
- සී. එස්. බස්නායක
- ඩබ්. එම්. පේ. බණ්ඩා
- එච්. සී. පී. තිරිමාන්න
- එම්. ඒ. ආර්. රූපසිංහ
- බී. එම්. ඩබ්. පී. එස්. එන්. අබේසිංහ
- එච්. ඩී. එස්. ධම්මික
- එස්.එම්. චමින්ද
- එල්. තිරුඥාණමූර්ති
- එම්. ඒ. ටී. ආර්. මාරසිංහ

පොදු සේවක(කාර්යාල සහය සේවක)
- ජේ. කේ. ජේ. පෙරේරා
- ඩී. කේ. එස්. සෙනරත්
- ඩී. ඩබ්. කේ. මධුසංඛ
- එම්. පී. එස්. ප්‍රනාන්දු
- එච්. ඩී. සුසීතා මිය
- ආර්. ඩී. ශිරෝමා මිය
- ඩබ්. ඒ. ටී. අරුණසිරි

රිය සහායක
- ඩී. ඩබ්. නෙවිල්
- ටී. එම්. ඒ. පී. කුමාරසිංහ
- එස්. එච්. ඒ. එම්. ප්‍රේමරත්න

අභ්‍යන්තර විගණන ඒකකය

පී. ඩබ්. ඒ. ප්‍රනාන්දු - අභ්‍යන්තර විගණක

B.B. Mgt. (Accounting). MBA. (Wayamba University)

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර

- එස්. එන්. ගුණතිලක මිය

කළමනාකරණ සහකාර

- පී. පී. කේ. මධුසංඛ

කළමනාකරණ සහකාර (ගිණුම්)

- එම්. එම්. එල්. සිල්වා, B.Sc. (Entrepreneur)

පොදු සේවක (කාර්යාල සහය සේවක)

- එම්. ඒ. පී. ආනන්ද

ගිණුම් ඒකකය

බී. ඒ. ඩී. සී. එස්. බුලත්සිංහල - ගණකාධිකාරී

B.Sc. (Business Administration)

කළමනාකරණ සහකාර (පොත් තබන්නා)

- ඒ. එච්. එම්. ජේ. එස්. අබේරත්න, HNDBS
- ඩබ්. ඩී. පී. ප්‍රනාන්දු මිය, AAT, B.Sc (Accountancy & Business Finance)
- එච්. පී. එස්. වී. හේරත්, AAT
- ආර්. එම්. ආර්. ඩී. රත්නායක මෙනවිය , B.Sc. (Business Management)
- ආර්. ඩී. එස්. ප්‍රියදර්ශනී මිය, AAT

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්)

- ඒ. එස්. එම්. එස්. අබේවික්‍රම මිය

කළමනාකරණ සහකාර (ගිණුම්)

- ඩබ්. ඒ. එන්. කේ. විජේසිංහ මිය

කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු)

- එස්. එම්. ආර්. බී. සුබසිංහ, AAT

කළමනාකරණ සහකාර

- ජේ. ඒ. එස්. ඉන්දික

- පොදු සේවක (කාර්යාල සහය සේවක)
- පී. කේ. සී. සම්පත්
- ආර්. කේ. එස්. විමලසිරි
- කේ. ඒ. ඒ. කුමාර
- කේ. එම්. වී. සී. පී. කුමාරසිංහ

ඉංජිනේරු ඒකකය

ඒ. ඒල්. ඩී. කේ. අමරසිංහ - නේවාසික ඉංජිනේරු

Dip. (Eng. Science), NDES (Civil)

වැඩ අධිකාරි

- පී. එච්. ඩී. ටී. එම්. එස්. විමලරත්න , Advance Dip. (Construction Technology)

- තාක්ෂණික නිලධාරි (කාර්මික)
- එච්. ඒ. කේ. බණ්ඩාර , Training Course in Automobile Mechanics

- තාක්ෂණික නිලධාරි (සිවිල්)
- ආර්. එම්. ආර්. පී. නවරත්න, Dip. Engineering Sciences

- තාක්ෂණික නිලධාරි (විදුලි)
- පී. එල්. යූ.. එස්. ගුණවර්ධන, HND in Engeenering (Electrical)

කළමනාකරණ සහකාර (විගණන)

- එච්. එස්. එස්. එස්. ද සේරම්, AAT

කළමනාකරණ සහකාර

- එච්. එම්. මල්ලිකාරච්චි මෙනවිය

මෝටර් කාර්මික

- වයි. පී. එන්. ඩී. විජේසිංහ

තහඩු වැඩකරු

- සී. එම්. එස්. එෆ්. ලෙස්ලිපුල්ලේ

විදුලි උදව්කරු

- එච්. එම්. එන්. ජයරත්න

ගොඩනැගිලි උදව්කරු

- කේ. පේ. පේ. අප්පුහාමි
- ආර්. පී. එස්. පේ. මංචනායක

ජලනළ කාර්මික

- බී. ආර්. ඩී. සිල්වා

විදුලි රැහන්කරු

- එම්. එම්. ඩී. සී. මුණසිංහ

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- බී. එම්. එල්. ධර්මසිරි

පොදු සේවක (කාර්යාල සහය සේවක)

- ඊ. එම්. යූ. නිශාන්ත

වතු කළමනාකරණ අංශය

විල්. එස්. බී. ලියනගේ - කළමණාකරු (වතු)

B.Sc. (Agric)

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර

- එම්. පී. කරුණාවති මිය

කළමනාකරණ සහකාර (ගිණුම්)

- එච්. ඒ. එන්. සුහාෂිණි මිය

- පොදු සේවක (කාර්යාල සහය සේවක)
- පී. වී. එන්. ඩබ්. කුමාර

බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානය

වතු අධිකාරී

ඩබ්. ඒ. එච්. උපාලි, Dip. (Plantation Management)

සහකාර වතු අධිකාරී

- ඩී. කේ. ඒ. හේෂානි මිය, B.Sc. (Agric)

ක්ෂේත්‍ර නිලධාරී

- පී. ඒ. කේ. සංජීව, HND (Agri. Produc. Tech.)

කළමනාකරණ සහකාර

- ආර්. පී. ඩබ්. සඳරේණූ මෙනවිය

ක්ෂේත්‍ර පරීක්ෂක

- පී. ඩී. ආර්. එස්. අප්පුහාමි

පොදු සේවක(කාර්යාල සහය සේවක)

- ඩබ්. ඒ. එස්. ජයතිලක

පොදු සේවක (මුරකරු)

- එස්. එම්. යූ. ඩී. සිංහබාහු

රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානය

වතු අධිකාරී

බී. යූ.. සී. සමරකෝන්, B.Sc. (Agric)

ක්ෂේත්‍ර පරීක්ෂක

- ඩබ්. එම්. ඩී. ආර්. විජේසිංහ
- එච්. ආර්. අයි. යූ. ගුණවර්ධන

අඹකැලේ පොල් ජාන සම්පත් මධ්‍යස්ථානය

සහකාර වතු අධිකාරී

ඩී. ආර්. එස්. විජේගුණතිලක , B.Sc. in Palm & Latex Technology & Value Addition

ක්ෂේත්‍ර නිලධාරී

බී. පී. අයි. එන්. බණ්ඩාර , HND (Agri. Produc. Tech.)

රියදුරු

- ඩබ්. ඩී. සී. එස්. තුෂාර

මුරකරු

- ඩී. එම්. එල්. ජයරත්න

ක්ෂේත්‍ර පරීක්ෂක

- කේ. ඒ. පී. පී. රත්නවීර

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- එච් එම්. පී. ජයවර්ධන

මාදුරුඔය පොල් ජාන සම්පත් මධ්‍යස්ථානය

වතු අධිකාරී

අයි. පී. එස්. ඒ. වනසිංහ, B.Sc (Agric)

ක්ෂේත්‍ර පරීක්ෂක

- ඩබ්. ඩබ්. එම්. එස්. එන්. වාසලගේ

පොදු සේවක (කාර්යාල සහය සේවක)

- ඩබ්. පී. මල්ලිකා මැණිකේ මිය

මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානය

ස්ථාන භාර නිලධාරී

ඒ. ඒ. එස්. කුමාර, Diploma in Plantation Management

ක්ෂේත්‍ර පරීක්ෂක

- කේ. පී. වසන්ත

රියදුරු

- ඒ. කේ. ප්‍රේමදාස

වැලිගම පොල් ජාන සම්පත් මධ්‍යස්ථානය

ස්ථාන භාර නිලධාරි

එස්. ඒ. එස්. කුමාර

පොත්තුකුලම පර්යේෂණ මධ්‍යස්ථානය

සහකාර වතු අධිකාරි

ආර්. පී. පී. සී. එස්. කුමාර, B.Sc (Agric)

කළමනාකරණ සහකාර

- ආර්. එම්. එන්. කේ. රත්නායක

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- එච්. ජේ. එම්. පී. නිලංග

මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානය

වතු අධිකාරි

අයි. ඒ. එන්. හේමසිරි

ක්ෂේත්‍ර නිලධාරි

- ඩබ්. එම්. එන්. පී. විජයතුංග, Diploma in Agriculture

පොදු සේවක (කාර්යාල සහය සේවක)

- පී. එම්. කමලාවතී මිය

පල්ලම පොල් ජාන සම්පත් මධ්‍යස්ථානය

වතු අධිකාරී

ජේ. ඒ එස්.. සී. ජයකොඩි, B.Sc.in Agric. Resource Mgt. & Tech.

ක්ෂේත්‍ර නිලධාරී

- ඊ. ජී. පී. එස්. සෝමරත්න , HND (Agri. Produc. Tech.)

ක්ෂේත්‍ර පරීක්ෂක

- එම්. ඒ. එස්. අයේෂාන්
- එස්. එම්. ජේ. පී. සේනාරත්න

රසායනාගාර ක්ෂේත්‍ර සේවක

- එස්. ඒ. සුමනාවතී මිය
- ජේ. එම්. සී. පී. ජයමාන්න

රියදුරු

- එච්. එම්. ඩී. එන්. හේරත්

වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානය

ස්ථාන භාර නිලධාරී

ටී. එම්. එන්. මේනක,

Diploma in Plantation Management, B.Sc. in Agri. & Plant. Mgt.

තඹ්බෝව ආදර්ශ ගොවිපොළ

ස්ථාන භාර නිලධාරී

සී. එස්. වෙල්ලප්පිලි, B.Sc. (Agric)

* අධ්‍යයන නිවාඩු

** වැටුප් රහිත නිවාඩු



බඳවාගැනීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම්, උසස්වීම් සහ ස්ථාන මාරු

පාලන අංශයේ වාර්තාව

1. **සංස්ථාපන ඒකකය**

ආයතනයේ සහ පර්යේෂණ අංශවල කටයුතුවලට අදාළ පරිපාලන කාර්යයන් සංස්ථාපන ඒකකය මගින් සිදුකරන ලදී.

2. **කාර්ය මණ්ඩලය**

2021 දෙසැම්බර් මස අවසන් වන විට පොල් පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු වගු අංක 1 හි සඳහන් කර ඇත.

වගු අංක 1 : 2021.12.31 දිනට කාර්ය මණ්ඩලය

වැටුප් කාණ්ඩය	අනුමත කාර්ය මණ්ඩලය	සේවය කරන කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
HM 2-3	01	01	00
HM 2-1	01	01	00
HM 1-3	19	9	10
HM 1-1	01	00	01
MM 1-2	07	05	02
AR 2	14	06	08
AR 1	26	23	03
JM 1-2	15	13	02
MA 4	28	28	00
MA 3	05	04	01
MA 2-2	59	43	16
MA 1-2	85	53	32
PL 3	39	23	16
PL 2	53	33	20
PL 1	38	34	04
	391	276	115

3. **සේවක සුබසාධනය**

මණ්ඩලය මගින් සපයන ලද සේවක සුබසාධන පහසුකම් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

3.1. ණය පහසුකම්

ආපදා ණය : සේවකයන් 29 දෙනෙකු සඳහා රු. 7,149,960.00

ප්‍රවාහන ණය : සේවකයන් 10 දෙනෙකු සඳහා රු. 350,000.00

3.2 වෙනත් පහසුකම්

දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා රු. 12,000.00ක්, අවමංගල්‍යාධාර සංගමය සඳහා රු. 50,000.00ක්, ලලිත කලා කවය සඳහා රු. 15,000.00ක් සහ ක්‍රීඩා සමාජය සඳහා රු.30,000.00ක් ලෙස 2021 වර්ෂය තුළ දී මූල්‍යාධාර සපයා ඇත.

කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

4. **බඳවාගැනීම්**

2021 වර්ෂයේ කාර්ය මණ්ඩලයට බඳවාගැනීම් පිළිබඳ තොරතුරු වගු අංක 2 හි සඳහන් කර ඇත.

වගු අංක 2 : මුළු බඳවාගැනීම් සංඛ්‍යාව - 48

නම	තනතුර	අංශය/ඒකකය	දිනය
ආචාර්ය එම්.ඩී.පී. කුමාරතුංග මහතා	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී	ශාක කායික විද්‍යා අංශය	2021.02.19
